**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**අටවැනි පාර්ලිමේන්තුවේ**
***තුන්වන* සැසිවාරය**

# පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 76

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ

දෙවන වාර්තාව
(2018.02.23 සිට 2018.10.12 දක්වා)

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති
**ගරු ලසන්ත අලගියවන්න මහතා**
විසින්
2019 ක් වූ අප්‍රේල් මස 04 වැනි දින
ඉදිරිපත් කරන ලදි.

අටවැනි පාර්ලිමේන්තුවේ තුන්වන සැසිවාරය

## <u>රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය</u>

ගරු ලසන්ත අලගියවන්න මහතා (සභාපති)

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු සෙයිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු පාලිත රංගේ බණ්ඩාර මහතා

ගරු එස්.ශ්‍රීතරන් මහතා

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු (වෛද්‍ය) කාවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

අටවැනි පාර්ලිමේන්තුවේ දෙවන සැසිවාරය

(මෙම වාර්තාවේ සඳහන් විමර්ශන කාලසීමාව තුළදී)

**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය**

ගරු ලසන්ත අලගියවන්න මහතා (සභාපති)

ගරු එස්.බී. දිසානායක මහතා

ගරු මහින්ද සමරසිංහ මහතා

ගරු පී. හැරිසන් මහතා

ගරු ෆයිසර් මුස්තාපා මහතා

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු සුජීව සේනසිංහ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු සෙයිඩ් අලි සහීර් මවුලානා මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු සීනිතම්බි යෝහේෂ්වරන් මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු (වෛද්‍ය) කාවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු අයි. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා

# පටුන


**පිටු අංකය**

- සභාපතිවරයාගේ සටහන 01
- වාර්තාව 03
- පොදු නිරීක්ෂණ, නිගමන සහ නිර්දේශ 07
  1. ආරම්භ නොකළ/ අත්හැර දැමූ ව්‍යාපෘති
  2. නිශ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්
- විමර්ශනය කරන ලද එක් එක් ආයතනවල හඳුනාගත් ප්‍රධාන ගැටළු, නිරීක්ෂණ හා නිර්දේශ 13
- සුචිය 111

# සභාපතිවරයාගේ සටහන

අටවන පාර්ලිමේන්තුවේ දෙවන සැසිවාරය තුළදී මාගේ සභාපතීත්වයෙන් යුත් කාලසීමාව තුළදී විමර්ශනය කරන ලද ආයතන සම්බන්ධ තොරතුරු ඇතුළත් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ මෙම වාර්තාව, පාර්ලිමේන්තුව කල්තැබීම හේතුවෙන් අටවන පාර්ලිමේන්තුවේ තුන්වන සැසිවාරයේ දෙවන වාර්තාව ලෙස මා විසින් අද දින සභාගත කරමි.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ක්‍රමවේදයන් දෙකක් අනුගමනය කරමින් රාජ්‍ය ආයතන විමර්ශනය කරන ලද අතර, කාරක සභාව හමුවට කැඳවන ලද ආයතන සම්බන්ධව පවත්වන ලද විමර්ශනයන්ට අදාළ තොරතුරු මෙම වාර්තාවේ ඇතුළත් වේ. ඊට අමතරව රජයේ ආයතනවලට  පොදු ගිණුම් තැබීමේ ක්‍රම, මූල්‍ය පාලනය  හා කාර්යසාධන පිළිබඳ ඇගයීම පරිගණක ජාලගත ක්‍රමය මඟින් වාර්ෂිකව නොකඩවා සිදුවේ. එය රාජ්‍ය ආයතන තුළ මහත් පිළිගැනීමට ලක්ව ඇති අතර, ඒ සඳහා රාජ්‍ය ආයතනවල අනුගත වීමද ප්‍රශංසනීය වේ.

කෙසේ වුවද මෙම ක්‍රමවේදයන් දෙකම භාවිතා කරමින් රාජ්‍ය ආයතන නිසි ක්‍රමවේදයක් කරා ගමන් කරවීම හා ඒ තුළින් රට යහපත් දිශාවකට ගමන් කරවීම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ඒකායන පරමාර්ථය වන අතර, ඒ සඳහා මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කර ඇති නිර්දේශ හා නියෝග අදාළ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා අදාළ වගකිව යුතු පුද්ගලයන් විසින් ක්‍රියාවට නංවනු ඇතැයි බලාපොරොත්තු වන අතර, විගණකාධිපති දෙපාර්තමේන්තුව හා මුදල් අමාත්‍යාංශය කාරක සභාවේ කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා දක්වන සහයෝගය ද අගය කරමි.

එසේම අදාළ කාලසීමාවේදී මෙම  විමර්ශනයන් සඳහා දායක වූ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරුන්ට මාගේ විශේෂ ස්තුතිය පිරිනමන අතර, පාර්ලිමේන්තුවේ මහලේකම්, නියෝජ්‍ය මහලේකම්,සහකාර මහලේකම්තුමා / තුමිය සහ විශේෂයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කාර්යමණ්ඩලයට මාගේ ස්තුතිය පිරිනැමීමට ද මම මෙය අවස්ථාවක් කර ගනිමි.

ලසන්ත අලගියවන්න

සභාපති

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව

# වාර්තාව

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව එහි අටවැනි පාර්ලිමේන්තුවේ තුන්වැනි සැසිවාරයේ දෙවන වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි.

අටවන පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිවාරය තුලදී 2018.02.23 දින සිට 2018.04.06 දක්වා කාලසීමාව තුළ කාරක සභාව විසින් පවත්වන ලද විමර්ශන සහ 8 වන පාර්ලිමේන්තුවේ දෙවන සැසිවාරය තුලදී 2018.06.20 දින සිට 2018.10.12 දින දක්වා පවත්වන ලද විමර්ශනයන්ට අදාළව එක් එක් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද වාචික හා ලිඛිත පැහැදිලි කිරීම්, ඒ සඳහා කාරක සභාව විසින් සිදු කරන ලද නිරීක්ෂණ හා ලබා දෙන ලද නිර්දේශද, කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද පොදු නිරීක්ෂණද මෙම වාර්තාවේ අන්තර්ගත කර ඇත.

අටවන පාර්ලිමේන්තුවේ දෙවන සැසිවාරය තුලදී පාර්ලිමේන්තුව හමුවේ සභාගත කිරීමට නියමිතව තිබූ මෙම විමර්ශන වාර්තාව පිළිවෙලින් 2018.04.12 සහ 2018.10.27 යන දිනයන්හි පාර්ලිමේන්තුවේ වාරාවසාන කිරීම හේතුවෙන් වර්තමාන කාරක සභාවේ අනුමැතිය මත අටවන පාර්ලිමේන්තුවේ තුන්වන සැසිවාරයේ දෙවන වාර්තාව ලෙස පාර්ලිමේන්තුව හමුවේ සභාගත කරනු ලබයි.
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පවත්වන ලද විමර්ශන 23කට අදාළ කරුණු මෙම වාර්තාවේ අඩංගු වේ.

**2018.02. 23 දින සිට 2018.04.06 දක්වා කාලසීමාව තුළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මගින් විමර්ශනය කරන ලද ආයතන හා සලකා බලන ලද විගණකාධිපති වාර්තා කාලසීමාව - (අටවන පාර්ලිමේන්තුවේ පළමුවන සැසිවාරය)**

| | ආයතනය | විමර්ශනය කරන ලද දිනය | සලකා බලන ලද විගණකාධිපති වාර්තා කාලසීමාව |
|---|---|---|---|
| 01 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 2018.02.23 | 2015 වර්ෂය හා කාරක සභාව විසින් දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය |
| 02 | සංචාරක ප්‍රවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය | 2018.03.06 | 2015 වර්ෂය හා වර්තමාන කාර්යසාධනය |
| 03 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | 2018.03.06 | 2014,2015 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 04 | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 2018.03.21 | 2011,2012,2013,2014හා 2015 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 05 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය-මොණරාගල | 2018.03.22 | 2011, 2012, 2013, 2014 හා 2015 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 06 | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 2018.04.06 | 2013, 2014 හා 2015 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |

**2018.06. 20 දින සිට 2018.10.12 දක්වා කාලසීමාව තුළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මගින් විමර්ශනය කරන ලද ආයතන හා සලකා බලන ලද විගණකාධිපති වාර්තා කාලසීමාව - (අටවන පාර්ලිමේන්තුවේ දෙවන සැසිවාරය)**

| | ආයතනය | විමර්ශනය කරන ලද දිනය | සලකා බලන ලද කාලසීමාව |
|---|---|---|---|
| 01 | ගලෙන්බිඳුනු වැව ප්‍රාදේශීය සභාව | 2018.06.20 | 2012, 2013, 2014 හා 2015 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 02 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 2018.06.21 | 2013, 2014, 2015 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 03 | ත්‍රිකුණාමලය නගර සභාව | 2018.07.04 | 2012, 2013, 2014 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 04 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 2018.07.06 | 2016 වර්ෂය හා කාරක සභාව විසින් දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය |
| 05 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 2018.08.07 | 2014,2015 හා 2016 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 06 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | 2018.08.08 | 2014 වර්ෂය හා වර්තමාන කාර්යසාධනය |
| 07 | ආරක්ෂක අමාත්‍යාංශය | 2018.08.10 | 2013, 2014 හා 2015 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 08 | නැවත පදිංචි කිරීමේ හා හින්දු ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | 2018.08.23 | 2014, 2015, 2016 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 09 | අධ්‍යාපන අමාත්‍යාංශය | 2018.08.24 | 2015 හා 2016 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |

| | | | |
|---|---|---|---|
| 10 | මාතලේ මහ නගර සභාව | 2018.09.06 | 2013, 2014, 2015 හා 2016 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 11 | විදේශ රැකියා අමාත්‍යාංශය | 2018.09.07 | 2014,2015,2016 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 12 | බස්නාහිර පළාත් සභාව | 2018.09.18 | 2015 , 2016 වර්ෂ හා වර්තමාන කාර්යසාධනය |
| 13 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 2018.10.12 | කාරක සභාව විසින් දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය |

**විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද විශේෂ විමර්ශන/ කාර්යසාධන වාර්තා සම්බන්ධයෙන් කාරක සභාව විසින් පවත්වන ලද විමර්ශන**

| | **විශේෂිත කරුණ** | **විමර්ශනය කරන ලද දින** |
|---|---|---|
| 01 | රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ පරීක්ෂණය | 2018.04.05 හා 2018.09.20 |
| 02 | ගුණාත්මක ආහාර ආනයනය සම්බන්ධයෙන් අදාළ රාජ්‍ය ආයතනවල මැදිහත්වීම පිළිබඳ කාර්යසාධන වාර්තාව | 2018.09.19 |
| 03 | ජාතික ආර්ථිකයට නව නිපැයුම්කරුවන්ගේ දායකත්වය ලබා ගැනීමේදී අදාළ රාජ්‍ය ආයතනවල මැදිහත්වීම පිළිබඳ කාර්යසාධන විගණන වාර්තා පරීක්ෂාව | 2018.09.21 |

# පොදු නිරීක්ෂණ, නිගමන සහ නිර්දේශ

## පොදු නිරීක්ෂණ

මෙම වාර්තාවේ අන්තර්ගතව ඇති කාරක සභාව විසින් විමර්ශනය කරන ලද ආයතන හා සබැඳි කරුණු සලකා බැලීමේදී නිශ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම් සහ විශාල ප්‍රාග්ධන වියදමක් දැරීමෙන් අනතුරුව විවිධ හේතූන් මත ආරම්භ නොකළ සහ ආරම්භ කළද අතරමග නතර වී ඇති ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් ඇති බව අනාවරණය විය. ඒ අනුව පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු බව කරක සභාව අවධාරණය කරන අතර, ඒ හා සම්බන්ධිත විස්තරාත්මක කරුණු වාර්තාවේ ඒ ඒ ආයතන යටතේ දක්වා ඇත.

## I. ආරම්භ නොකළ / අතරමග නැවතී ඇති ව්‍යාපෘති

### සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

- 2009 වර්ෂයේ ආරම්භ කළ "කෝප්නෙට් වැඩසටහන" සඳහා ඇස්තමේන්තුගත මුදලින් රුපියල් 2,416,711ක් වැය කළද 2011 වර්ෂය අවසාන වන විටත් ආරම්භක අවස්ථාවේම පැවති අතර, 2012 වර්ෂය වන විට තාවකාලිකව අත්හිටුවා ඇත.

### නැවත පදිංචි කිරීම්, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය

- ඉන්දිය රජය විසින් ක්‍රියාත්මක කළ 2015 හා 2016 වර්ෂවලදී සලසා තිබූ මුලු ප්‍රතිපාදනය රු.6,492,000,000ක්වූ නිවාස 46,010 ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීමට කටයුතු කර නැත.
- 2015 වර්ෂයේ පාකිස්තානය රු.මිලියන 193.35, කසකස්තානය රු.මිලියන 27.95 සහ බහරේන් රු.මිලියන 187.92ක මූල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කළ නිවාස 537 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ආයතනය විමර්ශනය කළ 2018 අගෝස්තුවන විටද නිම කිරීමට කටයුතු කර නොතිබුණි.

### බස්නාහිර පළාත් සභාව

- 2016 විගණකාධිපති වාර්තාවට අනුව ගම්පහ කලාප අධ්‍යාපන බලප්‍රදේශය තුළ අඩක් නිමකර ඇති පාසැල් ගොඩනැඟිලි 61ක් හඳුනාගත හැකි වූ අතර, ඒ වෙනුවෙන් දරන ලද වියදම රු.277,693,238ක් විය.

### දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොණරාගල

- 2007 වර්ෂයේ විමධ්‍යගත අයවැය යටතේ රු.499,998/-ක් වැය කර භාණ්ඩ මිලදී ගෙන තිබූ මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොහුකුඹුර ජීව වායු ව්‍යාපෘතිය 2018 මාර්තු (ආයතනය විමර්ශනය කළ දිනය) වන විටත් ක්‍රියාත්මකව නොතිබුණි.
- රු. 5,655,984/-ක් වැය කර ඉදිකරන ලද නාගහමඩ ආහාර සැකසුම් නිෂ්පාදන ගම්මානය සඳහා පොදු පහසුකම් මධ්‍යස්ථානයක් ලෙස ඉදිකරන ලද ගොඩනැගිල්ල 2018 මාර්තු 7වන දින වන විටත් වල් බිහිවී ගරා වැටෙමින් පැවතුනි.

- නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ ගම්නගා සිටුවීමේ වැඩ සටහන යටතේ 2015 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද නල ලිං ජල යෝජනාක්‍රම දෙකක් සඳහා විමර්ශනය සහ විදීමේ ගාස්තු ලෙස රු.1,501,770/-ක් වැයකර ඇතත් එහි ඉදිකිරීම් කටයුතු 2018 මාර්තු 9 වන විටත් ආරම්භ කර නොතිබුණි.
- රු.350,000/-ක් වැය කර 2014 වර්ෂයේ තණමල්විල ප්‍රාදේශිය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කරන ලද ජල මීටර් ලබාදීමේ ව්‍යාපෘතිය 2018 මාර්තු වන විටද ක්‍රියාත්මක වී නොමැත.

<u>ගලෙන්බිඳුණු වැව ප්‍රාදේශීය සභාව</u>

- අශ්වයා බැඳිවැව සහ ඉහළගම යන ගම්මානවලට පානීය ජලය ලබාදීම වෙනුවෙන් 2009 – 2012 කාලසීමාව තුළ රු. 18,759,980/-ක පිරිවැයක් දරා තිබුණද, 2018 ජනවාරි 31 වන විටත් වැඩ නිමවී නොතිබුණි.

<u>ත්‍රිකුණාමලය නගර සභාව</u>

- රු. 4,044,907/-ක පිරිවැයක් දරා 2014 වර්ෂයේදී ඉදිකරන ලද මලාපවහන පිරිසිදු කිරීමේ පද්ධතිය 2018 ජූලි මස වනතුරු අවසන් කර නොතිබුණි.

<u>මාතලේ මහනගර සභාව</u>

- රු.4,500,500/-ක් වැය කර තිබූ ඩෝල පාරේ කොම්පෝස්ට් ව්‍යාපෘතිය 2018 අගෝස්තු වන විටත් නිෂ්කාර්යව පැවති අතර, පිළිසරු ව්‍යාපෘතිය යටතේ රු.9,343,457/-ක් වැය කර ඉදිකරන ලද හිග්ගොල්ල කොම්පෝස්ට් අංගනයද 2016 ජූනි සිට අක්‍රියව පැවතුණි.

## II. නිෂ්ක්‍රිය/ ඌන උපයෝජිත වත්කම්

**බස්නාහිර පළාත් සභාව**

- **පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය**

මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2012 වසරේදී රු. 158,030,625/-ක් වියදම්කර මිලටගත් කොන්ක්‍රීට් ඇතුරුම් යන්ත්‍ර දෙකක් සහ රු. 6,202,329/-ක් වටිනා කර්බ් යන්ත්‍රය 2014 නොවැම්බර් වන විටද ප්‍රයෝජනයට නොගෙන දිවුලපිටිය කොන්ක්‍රීට් අංගනයේ ගබඩා කර තිබුණි.

- **පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**

2007 වර්ෂයේ දී රු.3,726,236කට ආනයනයකර පරිපාලන වියදම් වශයෙන් රු. 2,973,918/-ක් ද වැය කරන ලද නමුත් ප්‍රයෝජනයට නොගත් අත් කඩදාසි නිෂ්පාදන යන්ත්‍රය පිළිබඳව 2018 වන විටද විධිමත් පරීක්ෂණ පවත්වා නැත.

**මාතලේ මහනගර සභාව**

- 2016 වර්ෂයේ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ රු. 10,000,000/- ප්‍රතිපාදනය සහ ඉතිරි මුදල සභා අරමුදලින් දැරීමේ එකඟත්වය මත ක්‍රියාත්මක කළ වාහන අංගනයේ ඉදිකළ කොටස 2018 අගෝසතු 30 වන විටත් නිෂ්කාර්යව පැවතුණි.
- 2012 වර්ෂයේ ප්‍රදේශයේ කඩ හිමියන්ගේ සහ සභා අරමුදලින් රු.796,500/- ක් වැය කොට ඉදිකරන ලද ඝන මීටර් 44 ක ධාරිතාවයෙන් යුතු ජීව වායු ඒකකය සහ 2015 වර්ෂයේ විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයේ රු.3,200,000/- ක ප්‍රතිපාදන මත ඉදි කළ ඝන මීටර් 50 ක ධාරිතාවයෙන් යුත් ජීව වායු ඒකකය 2018 අගෝස්තු 30 වන විටත් නිශ්කාර්යව පැවතුණි.
- දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ණය හා පොදු අරමුදල මඟින් රු. 119,230,940/-ක් වැයකර 2014 වර්ෂයේදී ඉදිකර තිබූ මහල් 4ක සුපිරි වෙළඳ සංකීර්ණයේ ඉහල මහල් 2ක් 2018 අගෝස්තු වන විටද නිෂ්කාර්යව පැවතුණි.

**ත්‍රිකුණාමලය නගර සභාව**

- රෝහල් මඟින් ඉවත දමන පරිසරයට අහිතකර අපද්‍රව්‍ය දහනය කිරීමේ අරමුණින් රු.4,230,155/-ක පිරිවැයක් දරා 2015 වර්ෂයේ ආරම්භකර 2017 වසරේ අවසන් කරන ලද උදුන අක්‍රියව පැවතුණි.
- නගර සභාවට හිමි 299ක් වූ කඩ කාමරවලින් 90ක් 2011 සිට නිෂ්කාර්යව පැවතීම හේතුවෙන් වසර 7ක් පුරා නගර සභාවට ආසන්න වශයෙන් වසරකට හිමිවිය යුතු රු.2,000,000/-ක ආදායමක් අහිමි වී ඇත.

**විදේශ රැකියා අමාත්‍යාංශය**

- විගමන ශ්‍රමිකයින් පිළිබඳව පවුල් පැතිකඩ නිර්මාණය කිරීමට අදාළ තොරතුරු පරිගණක ගත කර දත්ත පද්ධතියක් පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සඳහා

2016 හා 2017 වර්ෂවල රු.35,500,959ක් වැයකර පරිගණක 277ක් මිලදී ගත්ත ද අපේක්ෂා කළ අරමුණු ඉටු වී නොමැත.

<u>ගලෙන්බිඳුණු වැව ප්‍රාදේශීය සභාව</u>

- 2012 වර්ෂයේ දැයට කිරුළ ව්‍යාපෘතියෙන් ගලෙන්බිඳුණුවැව නාගරික ජල සම්පාදන සඳහා ලබා දි තිබුණු ප්‍රතිපාදන වලින් 2013 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.මිලියන 3.4 ක් පමණ වටිනා PVC ජලනල තොගය (මූල්‍ය ප්‍රකාශනවල පවා හෙළිදරව් නොකර) 2018 ජනවාරි මස 31 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන දිරාපත්වෙමින් සභා භූමියේ නිෂ්කාර්යව පැවතුණි.

<u>සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය</u>

- 2016 දෙසැම්බර් මස 30 වන දින රු. මිලියන 1.08ක් වැය කර ඇල්ල නගරයේ ස්ථාන 04ක ස්ථාපිත කළ CCTV කැමරා පද්ධතිය 2017 ඔක්තෝම්බර් 10 වන විටද නිෂ්ක්‍රීයව පැවතුණි.

## කාරක සභා නිර්දේශ

විශාල ප්‍රාග්ධන වියදම් දරා ඇති නමුත් ආරම්භ නොකල හා අත්හැර දැමූ ව්‍යාපෘති පිළිබඳව කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු හා අක්‍රමිකතා සහ එමඟින් ඇතිවන විශාල මූල්‍ය පාඩු වළක්වා ගැනීම හෝ අවම කර ගනිමින් අදාළ කාර්යයන් නිසි කාලසීමාව තුළ ඉදිරියට කරගෙන යාම හා අවසන් කිරීමත් ඉලක්ක සපුරා ගැනීමත් සඳහා පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු විය යුතු බව කාරක සභාව අවධාරණය කරයි.

- ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර ඵලදායී ශක්‍යතා අධ්‍යනයන් කිරීම.
- කාර්යයන් ආරම්භ කිරීමට හා වත්කම් මිලදී ගැනීමට ප්‍රථම විධිමත් සැලසුම් සකස් කිරීම හා ඒ සඳහා විශේෂඥ දැනුම ලබා ගැනීම.
- ව්‍යාපෘති සඳහා වඩාත් සුදුසු ස්ථාන තෝරා ගැනීම.
- අනාගතයේදී විය හැකි ස්වාභාවික ආපදා තත්ත්වයන් පිළිබඳ අවධානය යොමු කිරීම.
- පොදු ජනයාගේ, සමාජීය හා සංස්කෘතික තත්ත්වයන් කෙරෙහි අවධානය යොමු කිරීම.
- නිසි කලට අවශ්‍ය බලපත්‍ර ලබා ගැනීම.
- ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර විදුලිබලය, ජලය වැනි පහසුකම්වල හිඟතාවය මගහරවා ගැනීම.
- නිසි කාලවකවානුව තුලදී ක්‍රමවත් පරිදි බදු ගිවිසුම්වලට එළඹීම හා බදු ගිවිසුමකට ඇතුළත් විය යුතු සියලුම කරුණු ඇතුළත් කිරීම.
- ප්‍රාග්ධන භාණ්ඩ සම්බන්ධව තාක්ෂණික අවබෝධයක් ඇති පළපුරුදු අය අදාළ කාර්යයන්හි යෙදවීම.
- ගැනුම්කරුවන්, විකුණුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී නියමිත ක්‍රමවේදයන් අනුගමනය කිරීම හා කීපදෙනෙකුගෙන් සැදුම්ලත් කමිටු විසින් තීරණ ගැනීම.
- ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුගත වීම.
- නිවැරදි තොග පවත්වාගෙන යාම.
- ව්‍යාපෘති වැඩ අනුව කාලීනව කොටස් කිරීම හා ඉලක්ක නියම කිරීම.
- තොරතුරු තාක්ෂණ පද්ධති උපයෝගී කර ගනිමින් ව්‍යාපෘති කළමනාකරණය කිරීම.
- පසු විපරම් කටයුතු නොකඩවා සිදු කිරීම.
- ප්‍රතිපාදන නිසිකලට වෙන් කිරීම හා නිදහස් කරවා ගැනීම.
- භෞතික කාර්යය සාධනය පිළිබඳව ඇගයීමක් කිරීම.
- පැවැත්වීමට නියමිත පරීක්ෂණ හා අධ්‍යනයන්ගේ ප්‍රමාදයන් වළක්වා ගැනීම.
- සේවකයින්ගේ අභිප්‍රේරණය පිළිබඳව අවධානය යොමු කිරීම.
- උපයෝජනය කළ නොහැකි යන්ත්‍රසූත්‍ර දිරාපත්වීමට ප්‍රථම වෙනත් රාජ්‍ය ආයතනයකට ලබා දීම හෝ සුදුසු බැහැර කිරීම් කිරීම.
- වගකිව යුත්තන්ගෙන් පාඩු අයකර ගැනීම.

- නිසිකලට වත්කම් අපහරණය කිරීම.
- වංචා, දූෂණ අවම කිරීමට කටයුතු කිරීම හා පරීක්ෂණ කටයුතු කඩිනම් කිරීම.

## විමර්ශනය කරන ලද එක් එක් ආයතනවල හඳුනාගත් ප්‍රධාන ගැටලු, නිරීක්ෂණ හා නිර්දේශ

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව<br>2018 පෙබරවාරි 23** | | |
| 1. | දෙපාර්තමේන්තුගත තනතුරු දරන නිලධාරීන් අනුරූප ඒකාබද්ධ සේවාවන්ට අන්තර්ග්‍රහනය කිරීමේ වර්තමාන තත්ත්වය | අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව නිලධාරින්ගේ ස්ථාන මාරු කිරීම්වලට එරෙහිව පවරන ලද නඩු කටයුතු මේ වන විට අවසන්ව ඇති බවත්, නීතිපතිගේ මතය අනුව එම නිලධාරින් අන්තර්ග්‍රහනය කිරීම සඳහා නෛතික බාධාවක් නොමැති බවත් ග.නි. පැහැදිලි කළේය.<br><br>ඉහත කරුණු සනාථ කළ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමිය මෙම නිලධාරින් සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා අවශ්‍ය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මේ වන විට ලැබී ඇති බවත්, 2018 මාර්තු 02 සිට බලපවත්වන පරිදි අදාල නිලධාරින් සේවයට අන්තර්ග්‍රහණය කිරීමට බලාපොරොත්තුවන බවත් 2018 මැයි 02 දක්වා ඔවුන්ට ඊට මනාපය පළ කිරීමට අවකාශ සළසා ඇති බවත් ප්‍රකාශ කළාය.<br><br>සේවා ස්ථාන මාරු කිරීමට ලක්වන නිලධාරින් තේරීමේදී, අමාත්‍යාංශය විසින් සකසන ලද විධිමත් ක්‍රමවේදයක් යටතේ එය සිදු කරන ලෙසට කාරක සභාව අවධාරණය කරන ලදී. |
| 2. | ඊ මෝටරින් ව්‍යාපෘතියේ ප්‍රගතිය | කාරක සභාවට ඉදිරිපත් කර ඇති සංශෝධිත දින වකවානු අනුව මෙම ව්‍යාපෘතියේ අදියරයන් නිම කරමින් පවතින බවත්, ඒ අනුව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | නියමිත කාලයේ ඉදිරි කටයුතු නිම කිරීමට හැකිවන බවත් ප්‍ර.ග.නි./ග.නි. සඳහන් කළේය. පරිගණක පද්ධතිය වසර පහක් දක්වා සේවා සපයන ආයතනයේ පාලනය යටතේ පවතින බවත්, ඉන් අනතුරුව එය දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමට සිදුවන බවත් (BOT ක්‍රමය යටතේ) කාරක සභාව හමුවේ අනාවරණය විය.<br><br>මෙම පරිගණක පද්ධතිය ක්‍රියාවට නංවන දින සිට වසර පහකින් පසු එය දෙපාර්තමේන්තුවට පවරා ගන්නා ක්‍රියාවලිය සඳහා දෙපාර්තමේන්තුව විසින් මානව හා භෞතික සම්පත් කළමණාකරණය සිදු කිරීමට අපේක්ෂා කරන ආකාරය සඳහන් ව්‍යාපෘති යෝජනාවක් මීලඟ කමිටු රැස්වීමේදී කාරක සභාව හමුවට ඉදිරිපත් කළ යුතු බව කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී. |
| 3. | වාහන අංක තහඩු මුද්‍රණයට අදාල නව කොන්ත්‍රාත්කරුවකු 2018 මාර්තු 17 දිනට තෝරා ගැනීමේ වර්තමාන තත්වය | අදාල ටෙන්ඩර් කැඳවීම 2018 ජනවාරි 16 දින ප්‍රසිද්ධියට පත් කළ බවද, 2018 අප්‍රේල් 19 වන දිනෙන් එය අවසන් වන බවද අනාවරණය විය. වාහන අංක තහඩු මුද්‍රණයට අදාල කොන්ත්‍රාත් ප්‍රදානයේ දින වකවානු සහිත කාල රාමුවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසට ප්‍ර.ග.නි./ග.නි. හට නියෝග කරන ලදී. |
| 4. | වාහන ලියාපදිංචිය පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තොරතුරු සමඟ රේගු දෙපාර්තමේන්තුවේ | වාහන ලියාපදිංචියේදී ශ්‍රී ලංකා රේගුව විසින් සපයනු ලබන චැසි අංකවල අඩුපාඩු නිසා එය නිවැරදි |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | තොරතුරු හා නොසැසඳුනු වාහන 07ක් පිළිබඳ විමර්ශනය | කිරීමට රේගුව වෙත යැවීමේදී නව වැසි අංක සැපයීමත්, පෙර සහ පසු වැසි අංක අතර සබඳතාව සඳහන් නොකිරීම නිසා නිවැරදි කර එවනු ලැබූ වැසි අංකවලට වෙනත් වාහන ලියාපදිංචි කිරීම මෙම ගැටළුවට හේතුව ලෙස ග.නි. සඳහන් කළේය.<br><br>අදාල වාහන හතෙහි සිදුවීම සම්බවන්ධව සති දෙකක් තුළ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී. එසේම ඒ සම්බන්ධව වාර්තාවක් රේගුවෙන්ද කැඳවිය යුතු බවට මෙහිදී කාරක සභාව තීරණය කළේය. |
| 5. | ව්‍යාජ ලෙස ලියාපදිංචි කොට ඇති ප්‍රාඩෝ වර්ගයේ ජීප් රථ 7 පිළිබඳ විමර්ශන කටයුතුවල ප්‍රගතිය | මෙම කරුණ පිළිබඳ විමර්ශනය කිරීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත භාර දී ඇති බවත්, 2018.02.21 දින එහි නව තත්වය සඳහන් කොට ලිපියක් ලද බවත්, ඒ අනුව විමර්ශනයට අදාලව රේගු අධ්‍යක්ෂ ජනරාල් ගෙන් කැඳවන ලද තොරතුරු ලද වහාම මූලික විමර්ශන වාර්තාව ලබාදීමට කටයුතු කරන බවට එහි සඳහන් වූ බවත් අනාවරණය විය. |
| **සංචාරක ප්‍රවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය<br>2018 මාර්තු 06** | | |
| 1. | පෞද්ගලික ආයතනයකට මාසිකව ගෙවිය යුතු අන්තර්ජාල පහසුකම් ගාස්තු, ගෙවිය යුතු පාර්ශවය පිළිබඳව ව්‍යාපෘතිය ආරම්භයේදී නිශ්චය කර | ඇල්ල පොලීසියෙන් කළ යෝජනාවකට අනුව මෙම කැමරා පද්ධතිය ස්ථාපිත කළ බවත්, මෙහි අන්තර්ජාල බිල්පත පියවීම පොලිස්පතිතුමාගේ මැදිහත් වීමෙන් සිදු කරනු ඇතැයි තමන් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | නොතිබීම හේතුවෙන් රු. මිලියන 1.08ක් වැය කර ඇල්ල නගරයේ ස්ථාන 04ක 2016 දෙසැම්බර් 30 දින ස්ථාපිත කළ CCTV කැමරා පද්ධතිය 2017 ඔක්තෝබර් 10 දින වන විටත් නිෂ්ක්‍රියව පැවතීම. | බලාපොරොත්තු වූ නමුත් එය එසේ සිදු නොවූ බව පැවසූ ප්‍ර.ග.නි. / ග.නි. බදුල්ල දිස්ත්‍රික් ලේකම් සහ පළාත් මන්ත්‍රීවරයා සමඟ සාකච්ඡා කර ප්‍රදේශයේ වෙළඳ ප්‍රජාවගේ සහයෝගය මේ සඳහා ලබාගැනීමට කටයුතු කිරීමට අදහස් කරන බව සඳහන් කළේය.<br><br>ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හෝ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන ආයතනය හරහා මෙම බිල්පත් පියවීමට කටයුතු කරන මෙන් කාරක සභාව නිර්දේශ කරන ලදී. |
| 2. | මැදිරිගිරිය වටදාගෙය අසල පොකුණ හා අවට සංවර්ධනය කිරීම සඳහා රු. 16,758,459/-ක මුදලකට පෞද්ගලික ආයතනයක් උතුරු මැද පළාතේ ප්‍රධාන අමාත්‍ය ලේකම් සමඟ 2016.12.28 දින ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම්ගත දිනයේදීම උක්ත කොන්ත්‍රාත්කරු බිල්පත් පහක වටිනාකම වූ රු. 5,786,000/-කින් සියයට 80ක මුදලක් වැඩබිමේ අමුද්‍රව්‍ය සඳහා අත්තිකාරම් මුදලක් ඉල්ලා තිබුණි. එම අත්තිකාරම් මුදලට වැට් බදු එකතුකර මුළු මුදල වන රු. 5,323,120/-න් රු. 3,992,340/-ක් (75%ක්) කොන්ත්‍රාත්කරුට මුදා හැර තිබුණි. ඉහත ගෙවීම සනාථ කිරීමට කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබූ බිල්පත් පිළිගත නොහැකි බව විගණනයේදී නිරීක්ෂණය වීම. | මෙවැනි විගණන විමසුම් යොමු කළ යුත්තේ අදාල පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙත බව කාරක සභාවේ අදහස වූ නමුත් එහි වගකීමෙන් මිදීමට අමාත්‍යාංශයට නොහැකි බව අවධාරණය කෙරිණි.<br><br>මෙවැනි ව්‍යාපෘතීන් සඳහා පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්ගේ හා දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ නිර්දේශ සහිත යෝජනා තමන් ගෙන්වා ගන්නා බවද, එම යෝජනා අමාත්‍යාංශය විසින් පිළිගත් පසු ඒ බව ඔවුන්ට දන්වා ඒ සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීම සිදුකරන බවද, ඉන් අනතුරුව ප්‍රධාන ලේකම් විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකරන බවද, අමාත්‍යාංශය විසින් අධීක්ෂණ ක්‍රියාවලිය පමණක් සිදුකරන බවද ප්‍ර.ග.නි. පැවසීය.<br><br>අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන සපයන ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය සිදු කිරීමේ අවශ්‍යතාවය තවදුරටත් සඳහන් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | කළ කාරක සභාව එය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයේ වගකීම බව අවධාරණය කළේය. |
| **ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව<br>2018 මාර්තු 06** | | |
| 1. | ක්‍රිස්තියානි ආගමික සංවර්ධන කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම. | 1916 ක් වූ දේවස්ථානවල සංවර්ධනය සඳහා දේශපාලන අධිකාරිය මගින් හෝ ආගමික නායකයන් මගින් මූල්‍ය ප්‍රතිපාදන ඉල්ලීම් ඉදිරිපත් කිරීමේදී හා එම ඉල්ලීම් අනුමත කිරීමේදී දිස්ත්‍රික් ලේකම්වරයා මගින් බිෂොප් සමුළුවට අදාළ ඉල්ලීම් ඉදිරිපත් කර එම ඉල්ලීම්වල යෝග්‍යතාව පිළිබඳ නිර්දේශ ලබාගන්නා බව ප්‍ර.ග.නි. පැවසීය.<br><br>දේවස්ථාන සියල්ලේම තොරතුරු ලියාපදිංචිකර ඇති බවත් ජනගහන පදනම හා ඉල්ලීම් වල ප්‍රමුඛතාව මත ආධාර සැපයීම සිදු කරන බවත් අනාවරණය වූ අතර, එමඟින් දේවස්ථානවල තොරතුරු ලබාගෙන ඒ සඳහා ජල, විදුලි හා තීරුබදු සහන වැනි ආධාර දීම ක්‍රමවත්ව හා කාර්යක්ෂමව කරන ලෙස කාරක සභාව නියෝග කළේය |
| 2. | කාර්ය මණ්ඩලය | 2017 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ සංවර්ධන නිලධාරී (ක්ෂේත්‍ර නිලධාරී) විශාල සංඛ්‍යාවක් පිළිබඳ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ජනරාල්වරයා දැනුවත් කර වහාම අවම වශයෙන් දිස්ත්‍රික්කයකට එක් අයෙක් බැගින් හෝ යොදවා පුරප්පාඩු පිරවීමට පියවර ගන්නා ලෙසත් අදාල දිස්ත්‍රික්කයේම පදිංචි අය දිස්ත්‍රික් ලේකම්වරුන් මාර්ගයෙන් හඳුනාගෙන පත් කිරීමේ හැකියාව පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි. වෙත නියෝග කළේය. |
| 3. | ආසන්න වර්ෂ 3ක (2015, 2016 හා 2017) දෙපාර්තමේන්තුවේ වියදම්. | ශුද්ධ ප්‍රතිපාදනයේ ඉතිරිය ඉහළ අගයක් ගැනීමට හේතුව දහම් පාසැල් ගුරුවරුන්හට සාරි ලබාදීමට භාණ්ඩාගාරයෙන් මුදල් ඉල්ලීම් කළද එම මුදල් නොලැබීම නිසා පුනරාවර්තන වියදම් වල ඉතිරිවීම් සිදුවූ බවද මිලියන 25 ව්‍යාපෘතියේ මන්නාරම හා මාතර දිස්ත්‍රික් ලේකම් වරුන්ට වෙන වෙනම මුදල් යැවුවද එම මුදල් ඔවුන් ලබා නොගැනීම හේතුවෙන් මෙම ඉතිරිවීම සිදුවූ බවද ග .නි. .පැහැදිලි කළේය |
| 4. | දහම් පාසැල් ගුරුවරියන්ට රු.මිලියන 15ක සාරි මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8:12:3 ට අනුව ලැබුණු භාණ්ඩ පිළිබඳව ස්ථානභාර නිලධාරියෙකුගේ පිරිවිතර සහතිකයක් ලබාගත යුතු වුවද 2014 වර්ෂයේදී එසේ නොකිරීම. | වර්තමාන තත්වය ලෙස 2017 වර්ෂයට නිල ඇඳුම් බෙදාහැරීමේදී නිෂ්පාදකයා විසින් දේවස්ථාන වලට බෙදාහැරීම සිදුකර තිබූ අතර දෙපාර්තමේන්තු නිලධාරියෙකු ඒවා නිරීක්ෂණය කර දැනට මෙම ක්‍රියාවලිය දහම් පාසැල් අධ්‍යක්ෂක පියතුමෙක් යටතේ හා ඇතැම් දිස්ත්‍රික්ක වල සංවර්ධන නිලධාරීන් යටතේ පිරිවිතර අධීක්ෂණයකට යටත්කර නිවැරදි කර ඉදිරියට ගෙන යන බව අනාවරණය විය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| **සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව<br>2018 මාර්තු 21** | | |
| 1. | සමූපකාර සංවර්ධන අරමුදල හා සමූපකාර අතිරික්ත අරමුදලේ අරමුණුවලට පටහැනිව ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට ගිවිසුමක් මත 2013දී ලබාදුන් රු.75,000,000/-ක්වූ ණය, පනතට අනුකූලද යන්න පිළිබඳව හා එම මුදලින් 2016 දෙසැම්බර් 31 දිනට අය වීමට ඇති හිඟ ණය හා පොළී ශේෂයන් පිළිවෙලින් රු. 62,091,327/-ක් හා රු. 15,893,123/-ක් ව පැවතීම හා ගිවිසුම ප්‍රකාර ණය ගෙවීමට නියමිත කාලය ඉක්මවූ විට වත්කම් උගස්කරවලින් ණය මුදල් අයකරගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු නොකිරීම. | මෙම මුදල අය කරගැනීමට දෙපාර්තමේන්තුව විසින් ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට ලිපි යොමුකර ඇති අතර ඒ පිළිබඳ නීතිමය කටයුතු සිදුකරමින් පවතින බව ග.නි. පැවසීය. ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව අයත් අමාත්‍යාංශ ලේකම්වරයාට මේ පිළිබඳ දැනුම්දෙන ලෙසත් මෙම ගැටළුව පිළිබඳ වාර්තාවක් මසක් තුළ ලබාදෙන ලෙසත් කාරක සභාව ග.නි. වෙත නියෝග කළේය. |
| 2. | 2011 වර්ෂය - කෝප්නෙට් වැඩසටහන<br>2009 වර්ෂයේ ආරම්භ කළ, කෝප්නෙට් වැඩසටහන 2011 වර්ෂය අවසාන වනවිටත් ආරම්භක අවස්ථාවේ පැවතීම හා 2011 වර්ෂය අවසාන වනවිට ඇස්තමේන්තුගත වියදමවූ රු.මිලියන258.5න් රු. 2,416,711/-ක මුදලක් දෙපාර්තමේන්තුව විසින් වැය කර මෙහි සංශෝධිත යෝජනා සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමට ජාතික සමූපකාර සංවර්ධන ආයතනයට පවරා දී තිබුණද අදාළ නිර්දේශ ඉදිරිපත් නොකිරීම. | මූලික අධ්‍යයන කටයුතු හා උපදේශකවරයෙක් බඳවා ගැනීම සඳහා රු. මිලියන දෙකකට ආසන්න මුදලක් වියදම් කර ඇති බවද මෙම උපදේශකවරයා විසින් BPR (Business Process Reengineering) අධ්‍යයනයක් කර මෘදුකාංගය නිපදවීමට ජාතික සමූපකාර සංවර්ධන ආයතනයට ලබාදුන්නද එවැනි මෘදුකාංගයක් නිපදවීමට පහසුකම් නොමැති බැවින් ජාතික සමූපකාර සංවර්ධන ආයතනය එය ක්‍රියාවට නංවා නොමැති බව හා එවකට සිටි අමාත්‍යවරයාගේ නියෝගය ප්‍රකාරව මෙම වැඩසටහන 2012 වර්ෂයේදී තාවකාලිකව අත්හිටුවා ඇතිබවද අනාවරණය විය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 3. | 2012 වර්ෂය - සමුපකාර සමිති විගණනය.<br><br>සමිති හා සංගම් 54න් 6ක් විගණනයට භාජනය නොකිරීම හා සමුපකාර සමිති විසින් ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් පැවතීම. | දෙපාර්තමේන්තු විගණන නිලධාරී හිඟය මේ සඳහා හේතුවූ බවද පනත ප්‍රකාරව ඉදිරියේදී බාහිරින් වරලත් ගණකාධිකාරීන් යොදවා ගෙන විගණනය කිරීමට කටයුතු කරන බවද ග.නි. පැවසීය.<br><br>දෙපාර්තමේන්තුව යටතේ සමුපකාර සමිති ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය හා පවතින සමුපකාර සමිති ගණන වර්ගීකරණය කර දෙපාර්තමේන්තුවේ දැනට අනුයුක්ත විගණන නිලධාරීන් 18 දෙනා අතර විගණන ක්‍රියාවලියේදී ඒවා බෙදී යන ආකාරය ද ඇතුලත් ලිඛිත වාර්තාවක් එම නිලධාරීන්ගෙන් ලබාගෙන මෙතෙක් ප්‍රමාද වූ විගණන ක්‍රියාවලිය අදාළ සමිති වල සම්පූර්ණයෙන් අවසන් කරන ආකාරය පිළිබඳ දින වකවානු සහිත සම්පූර්ණ වාර්තාවක් අප්‍රේල් 20 දිනට පෙර ලබා දෙන ලෙස ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය. |
| 4. | 2013 වර්ෂය - මෙගා කෝප්සිටි<br><br>2010 වර්ෂයේදී මෙගා කෝප්සිටි 40ක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද, 2014 වර්ෂය වනවිට ආරම්භ කර තිබුනේ වෙළඳසැල් 17ක් බවත් ඉන් 04ක් අක්‍රිය තත්වයේ පැවතීම හා ආරම්භ නොකළ මෙගා කෝප්සිටි 23න් 08ක් ආරම්භ කර ක්‍රියාත්මක තත්වයේ පවතින බවත් | පළාත් සමුපකාර සමිති, මධ්‍යම රජයේ සහය මෙම මෙගා කෝප්සිටිවල දියුණුවට බලාපොරොත්තු වන බවද දැනට මෙගා කෝප්සිටි 28ක් ක්‍රියාත්මක තත්වයේ පවතින බවද අනාවරණය විය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | අනාවරණය විය. එසේම කෝප්සිටි 04ක සැලසුම් සකස් කිරීම වෙනුවෙන් වැයකළ රු.542,524/-ක් නිශ්කාර්ය වියදමක් බවට පත්වීම | |
| 5. | කාර්ය මණ්ඩලය<br>පරිපාලන සේවා නිලධාරීන්ගේ අනුමත තනතුරු 04 න් 04ම පුරප්පාඩු වීම හා පරිගණක තොරතුරු තාක්ෂණ නිලධාරීන්ගේ අනුමත තනතුරු 08න් 08ම පුරප්පාඩු වීම | මෙම පුරප්පාඩු පිරවීමට වහාම පියවර ගන්නා ලෙස කාරක සභාව නියෝග කළේය. |
| 6. | දායක මුදල් අයකර ගැනීම<br>සමුපකාර සමිති/සංගම්වල 2016 වසර ආරම්භයේ පැවති ලැබිය යුතු දායක මුදල් රු. 44,773,055/-කින් සමාලෝචිත වර්ෂයේදී රු. 4,869,469/-ක් පමණක් අයකරගෙන තිබුණු බවත් 2016 දෙසැම්බර් 31 වනවිට අක්‍රිය තත්වයේ පැවති සමිති 13 කින් රු. 22,413,246/-ක මුදලක් අයවිය යුතු බවත් අනාවරණය විය. | මේ වනවට රු. මිලියන 178 ක් අය කරගෙන ඇති බවත් 2017.12.31ට රු. මිලියන 62ක් අයවීමට ඇති බවත් 2017 විශේෂ වැඩපිළිවෙලක් අනුගමනය කිරීම නිසා අයකර ගැනීම වේගවත් වී ඇති බවත් ග.නි. පැවසීය. |
| 7. | සමුපකාර අතිරික්ත අරමුදලෙන් ණය ලබාදීම.<br>2011,2012 හා 2013 වර්ෂයන්හිදී සමුපකාර සමිති කිහිපයක් වෙත ලබා දී තිබුණු රු.මිලියන 335ක ණය මුදලින් 2016 දෙසැම්බර් 31 දින වනවිටත් කිසිදු ණය වාරිකයක් අයවී නොතිබුණි .ණය අයකර ගැනීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ පසුවිපරම් | වර්තමානයේදී කමිටුවක් පත්කර ණය හා ආධාර සමුපකාර සමිති සඳහා ලබා දෙන බවද දැනටමත් මෙම ණය සම්බන්ධයෙන් මූලා අපරාධ කොට්ඨාශයේ විභාග වන බවද ණය අයකරගැනීමට කටයුතු කරගෙන යන බවද ග.නි .ප්‍රකාශ කළේය.<br>මෙම අරමුදලෙන් ලබාදුන් ණය ප්‍රදාන හා ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | කටයුතු සිදු කිරීම දුර්වල මට්ටමක පැවතීම සහ ණය අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | ලබා දෙන ලෙස ග.නි .වෙත කාරක සභාව නියෝග කළේය . |
| **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොණරාගල<br>2018 මාර්තු 22** | | |
| 1. | මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොහු කුඹුර ජීව වායු ව්‍යාපෘතිය සඳහා 2007 වර්ෂයේදී රු. 499,998/- ක් වටිනා භාණ්ඩ මිලදී ගෙන මේ දක්වා ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම. | පශු සම්පත් දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු. ලක්ෂ 8 ක ඇස්තමේන්තුවක් මත ක්‍රියාත්මක කළ මෙම ව්‍යාපෘතියේ මුල් අදියරේ දී රු.499,998/-ක් වැයකර තහඩු 246ක් සහ GI බට මිලදී ගෙන තිබුණත් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොතිබුණි. පසුව 2011.11.28 දිනැති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්වර යාගේ නියෝගය මත එම භාණ්ඩ මැදගම ප්‍රාදේශීය සභාවට භාර දී ඇති අතර ඉන් තහඩු 150 ක් ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ වහලය සකස් කිරීමටත් තහඩු 96 ක් ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා සඳහාත් යොදා ගෙන ඉතිරි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා දැමීමට තීරණය කළ බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් ලබාදෙන ලෙස ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළ කාරක සභාව මෙවැනි අසාර්ථක ව්‍යාපෘති පිළිබඳව ලැයිස්තුවක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ඉදිරිපත් කරන ලෙස විගණකාධිපතිවරයාට දැනුම් දුනි. |
| 2. | වෙහෙරගල, හම්බාන, බෝහිටිය සහ තෙනගල්ලන්ද යන ස්ථානවල ජනසභා කාර්යාල ඉදිකිරිමේදි ඒවායේ වැඩ අවසන් කිරීමට පෙර සියලු ගෙවීම් කර රැඳවුම් ගාස්තු ද නිදහස්කර තිබිම. | පූර්ව ගිණුම් කාරක සභාවේ නියෝගයට අනුව පත්කළ පරික්ෂණ කමිටුවේ නිර්දේශය වූයේ මෙම අක්‍රමිකතාවයන්ට වග කිවයුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකුල ක්‍රියාමාර්ග ගත යුතු බවයි. ඒ අනුව මූලික පරීක්ෂණ කටයුතු සිදුවෙමින් පවතින අතර අදාළ වවුචර්පත් අස්ථාන ගතවී තිබිම එම පරීක්ෂණ වලට බාධාවක් වි ඇති බැවින් ඒවා අස්ථාන ගතවී ඇති ආකාරය පෙන්වා දෙන ලෙස පරික්ෂණ කමිටුවට දන්වා ඇති බව පැවසූ ප්‍ර.ග.නි./ග.නි. සති දෙකක් හෝ තුනක් ඇතුලත එම කටයුතු අවසන් කළ හැකි බව දැන්වීය. |
| 3. | රු.5,655,984/-ක් වැයකර ඉදිකරන ලද නාගහමඩ ආහාර සැකසුම් මධ්‍යස්ථානය ගොඩනැ--ගිල්ලේ වර්තමාන තත්ත්වය පිළිබඳව කාරක සභාවට වාර්තා කරන ලෙස ලබාදුන් නියෝගය අනුව 2018 මාර්තු 07 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදි එම ගොඩනැගිල්ල කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වල් බිහිවී ඇති බව අනාවරණය විය. | ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය මගින් ඉදිකරන ලද මෙම ගොඩනැගිල්ල කොහු කෙඳි කර්මාන්තයක් සදහා පොල් සංවර්ධන මණ්ඩලයට 2011.01.18 දින ලබා දි ඇතත් විවිධ හේතුන් මත එම කර්මාන්ත ශාලාව වසා දමා ඇත. පසුව කාර්ගිල්ස් ආයතනය සමග එක්ව කෘෂි නිෂ්පාදන මිලදි ගැනිමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරිමට කටයුතු කරමින් සිටින විට ජනාධිපති ලේකම් කාර්යාලය මැදිහත්ව මයියොක්කා සැකසුම් මධ්‍යස්ථානයක් පිහිටුවිම කෙරෙහි අවධානය යොමු වි ඇති බව ප්‍රකාශ කළ ප්‍ර.ග.නි./ග.නි. මෙම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ගොඩනැගිල්ල දැනට මඩුල්ල ප්‍රාදේශිය ලේකම්වරයා භාරයේ පවතින බව පැවසීය.<br><br>වසර 7 ආසන්න කාලයක් මෙම ගොඩනැගිල්ල කිසිදු ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා යොදා නොගැනීම පිළිබඳව සිය අප්‍රසාදය පලකළ කාරක සභාව ගොඩනැගිලි පරිශ්‍රය ශුද්ධ පවිත්‍ර කර ඵලදායී කාර්යයකට යොදාගෙන මාසයක් තුල කාරක සභාවට වාර්තාවක් ලබාදෙන ලෙස ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය. |
| 4. | 2008 සහ 2009 වර්ෂවල දී ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශයේ "ජන සවිය ගම නැගුම" යටතේ රු. මිලියන 3.9ක් වැය කර ඉදිකරන ලද ජනසභා කාර්යාල ගොඩනැගිල්ල අරමුණුගත කාර්යයන් සඳහා යොදා නොගෙන ආපදාවන්ට ලක්වෙමින් පැවතිම. | වැල්ලවාය ප්‍රාදේශිය ලේකම්වරයා භාරයේ පවතින මෙම ගොඩනැගිල්ල ප්‍රාදේශිය ලේකම්වරයාගේ නිල නිවාසය ලෙස භාවිතා කළ අතර ඒ සඳහා වෙනත් ගොඩනැගිල්ලක් ඉදිකර ඇති බැවින් සහකාර අධ්‍යක්ෂ තනතුරට හිමි නිල නිවාසයක් ලෙස භාවිතයට ගැනිම කෙරෙහි අවධානය යොමු වී ඇති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>මෙවැනි ගොඩනැගිලි ඵලදායි ලෙස යොදා ගැනිම පිලිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතු බව අවධාරණය කළ කාරක සභාව පවතින තත්ත්වය පිළිබඳව සවිස්තර වාර්තාවක් අප්‍රේල් 30ට පෙර කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස නියෝග කළේය. |
| 5. | 2007-2013 කාල පරිච්ඡේදයේ මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි සමාජ | සමෘද්ධි බැංකුව හරහා ශිෂ්‍යත්වලාභීන්ගේ ගිණුම්වලට බැරකළ යුතු මුදල් එයින් බැහැරව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | ආරක්ෂණ අරමුදලේ රු. මිලියන 4.6ට ආසන්න මුදලක් ප්‍රතිලාභීන්ගේ නම් සදහන් කර වංචා කිරීම. | ඔවුන්ගේ නමින් චෙක්පත් නිකුත් කර මෙම වංචාව සිදුකර ඇති බව ප්‍රකාශ කළ ප්‍ර.ග.නි./ග.නි. මූලික පරීක්ෂණවලදි එම මුදල රු.මිලියන 5.2 ක් බව සනාථ කරගෙන ඇත. ඒ අනුව චූදිත නිලධාරියාගේ සේවය අත්හිටුවා ඔහුට එරෙහිව චෝදනා පත්‍ර නිකුත් කර මොණරාගල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. ඉදිරියේදි මෙවැනි වංචා අවම කර ගැනිම සදහා විශේෂිත වැඩසටහනක් ක්‍රියාත්මක කර බැංකු කටයුතු සම්බන්ධයෙන් ද මාසික ප්‍රගති සමාලෝචනයක් සිදුකිරිමට ද කටයුතු කර ඇති බවද හෙලි විය.<br><br>මෙම පරීක්ෂණ කටයුතු වල පවතින ප්‍රමාදය පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ කාරක සභාව අමාත්‍යාංශ මට්ටමේ පරීක්ෂණයක අවශ්‍යතාවයද අවධාරණය කළේය. |
| 6. | සියඹලාණ්ඩුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ මුතුකණ්ඩිය ව්‍යාපාරය සදහා අත්පත් කර ගත් ඉඩම් කැබලි 24 ක් සදහා ගෙවිය යුතු රු. මිලියන 6.6 ක වන්දි මුදල මේ දක්වා ගෙවා නොතිබිම. | අදාළ ගෙවිම් සිදුකිරිම සදහා ප්‍රතිපාදන වාර්ෂිකව වෙන් කළද ප්‍රමාණවත් අක්මුදල් නොලැබිම වන්දි ලාභීන්ට මුදල් ගෙවිම ප්‍රමාද වීමට හේතු වූ බව ප්‍ර.ග.නි./ග.නි. පැවසිය.<br><br>මේ සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය දි කටයුතු කිරිමේ අව්‍යශ්‍යතාවය අවධාරණය කළ කාරක සභාව ප්‍රමාද වී ඇති කාලය සදහා පොලී මුදල් ද ගෙවිමට සිදුවිය හැකි බව පැවසිය. |
| 7. | මැදගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ කළුගහවාඩිය හා | ඉදිකිරිම් කටයුතු කඩිනමින් අවසන් කරන ලෙස ජාතික ජල සම්පාදන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | බකිනිගහවෙල පටස්ගලවත්ත නල ළිං දෙක සඳහා විමර්ශන ගාස්තු සහ විදීමේ ගාස්තු ලෙස රු.1,501,770/-ක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට ගෙවා තිබුණ ද 2018 මාර්තු 09 දින වන විටත් ඒවායේ ඉදිකිරීම කටයුතු ආරම්භ කර නොතිබීම. | හා ජලාපවාහන මණ්ඩලයට අවස්ථා කිපයකදි දැනුම් දි ඇතත් වායු සම්පිඩන යන්ත්‍රයක පැවති කාර්මික දෝෂයක් නිසා බකිනිගහවෙල පටස්ගලවත්ත නල ළිදේ ඉදිකිරීමේ කටයුතු ප්‍රමාද වූ බව සඳහන් කළ ප්‍ර.ග.නි./ග.නි. මාර්තු 31 වන විට එහි කටයුතු අවසන් කළ හැකි බවත්, කලුගහවාඩිය නල ළිඳ සඳහා විකල්ප ස්ථානයක් සොයා ගැනීමේ අවශ්‍යතාවය පවතින බැවින් ඉදිරියේදි සුදුසු ස්ථානයක් තෝරාගෙන එම කටයුතු කඩිනමින් අවසන් කිරීමට පියවර ගන්නා බව ද පැවසීය.<br><br>මෙම ව්‍යාපාතිය කඩිනමින් අවසන් කරන ලෙස ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට දන්වන ලෙසත් එහි පිටපතක් අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාට ද යොමු කරන ලෙසත් කාරක සභාව නියෝග කළේය. |
| 8. | 2014 වර්ෂයේ තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ බෝදාගම වසමේ පවුල් 14 ක් සඳහා ජල මීටර් ලබාදීම සඳහා ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට රු. 350,000/- ක් ගෙවා ඇතත් 2018.03.06 දින වන විටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවී පැවතිම. | බෝදාගම පානීය ජල ව්‍යාපෘතිය සඳහා ජල මනු 140 ලබාගැනීම සඳහා ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට මෙම මුදල ගෙවා තිබුණත් ලුණුගම්වෙහෙර ජල යෝජනා ක්‍රමයේ ජල ධාරිතාව ප්‍රමාණවත් නොවීම නිසා ජල සැපයුම ලබාදීමට නොහැකි බව දන්වා ඇත. එබැවින් ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කෙරෙන වෙනත් ජල ව්‍යාපෘතියක් මගින් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ජලය ලබාදීමට ඉදිරියේදි කටයුතු කරන අතර මිලදි ගත් ජල මනු, මණ්ඩලයේ ගබඩාවල පවතින බවත් හෙලි විය. |
| 9. | සියඹලාණ්ඩුව සහ ඇතිමලේ ජනපදයේ ග්‍රාම නිලධාරී වසම් වල දිර්ඝ කාලීන ඉඩම් බලපත්‍රලාභීන් 16 දෙනෙකු සඳහා බදු ක්‍රමය යටතේ ලබා දී තිබූ ඉඩම් වලින් 2017 දෙසැම්බර් 31 දිනට අයකර ගෙන නොමැති හිඟ මුදල රු. 10,353,657/- දක්වා වැඩි වීම. | දීර්ඝ කාලීන බදු ක්‍රමය යටතේ සියඹලාණ්ඩුව ඇතිමලේ ඉඩම් කොටස් 9 ක් සහ මුතුකණ්ඩිය ඉඩම් කොටස් 7 ක් වෙතින් මෙම මුදල අයවිය යුතුව ඇතත් මුතුකණ්ඩිය ඉඩම් කොටස් 2 ක් සඳහා සින්නක්කර ඔප්පු නිකුත් කර 2012.11.21 දිනැති ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර ඇත. ඉඩම් හිමිකරුවන්ගෙන් අයවිය යුතුව ඇති රු.මිලියන 3.6 ක පමණ හිඟ මුදල කපා හැරීම සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ද අපේක්ෂා කර ඇත. සින්නක්කර ඔප්පු නිකුත් කිරිමට විරෝධය පළකරමින් අනෙක් ඉඩම් හිමිකරුවන් බදු මුදල් ගෙවිම පැහැර හැරීම නිසා හිඟ බදු ප්‍රමාණය ඉහළ ගොස් ඇති බව ප්‍රකාශ කළ ප්‍ර.ග.නි./ග.නි. මෙම වසර අවසානයට පෙර ඉඩම් ඔප්පු 7058 ක් නිරවුල් කිරිමට සැලසුම්කර ඇති බවද පැවසිය.<br><br>සින්නක්කර ඔප්පු මගින් නිරවුල් කර ඇති මුතුකණ්ඩිය ඉඩම් කොටස් 2 පිළිබඳව සවිස්තර වාර්තාවක් ඉඩම් නිරවුල් කිරීමේ කොමසාරිස් වෙතින් කැඳවීමට කටයුතු කරන ලෙස කාරක සභාව නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 10. | මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 04 දරන පරිපාලන නිලධාරීන් සඳහා උපලේඛන ගත රජයේ නිවාසය 2003 වර්ෂයේ නියෝජ්‍ය අමාත්‍යතුමියකට සම්බන්ධීකරණ කාර්යාලයක් පවත්වාගෙන යාමට ලබාදී 2015 දෙසැම්බර් 08 වන දින ආපසු ලබාගෙන ඇතත් එම කාල සීමාව සඳහා ඊට ලැබිය යුතු කුලීය රු.362,750/- සහ හිඟ ජල බිල්පත් ගාස්තුව රු.337,994/- ක මුදල අයකර ගැනිමට කටයුතු කර නොතිබිම. | 2003 වර්ෂයේ ලිඛිත ගිවිසුමක් නොමැතිව මෙම ගොඩනැගිල්ල නියෝජ්‍ය අමාත්‍යතුමියට කාර්යාල යක් පවත්වාගෙන යාම සඳහා ලබා දී තිබූ අතර 2015.10.26 දිනැති තක්සේරුවට අනුව කුලිය හා ගාස්තු ලෙස ඉහත මුදල ගෙවන ලෙස එතුමිය වෙත දන්වා තිබුණි. පොදු කටයුත්තක් වෙනුවෙන් එය භාවිතයට ගෙන තිබූ බැවින් කුලී ගෙවිම ඇය විසින් ප්‍රතික්ෂේප කිරිම නිසා ඒ සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගැනිමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කළ විට අමාත්‍යතුමියගේ මතය පිළිගනිමින් හිඟ මුදල් ගෙවීමෙන් ඇය නිදහස් කිරිමට කමිටුව තිරණය කර ඇත. එහෙත් අමාත්‍යාංශය එම තීරණයට එකඟ නොවන බැවින් හිඟ මුදල් අයකර ගැනිමට කටයුතු කරන ලෙස යළි දන්වා තිබුණු බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>මෙම නිවාසය පරිහරණය කළ කාල සීමාවේදි අමාත්‍යතුමිය එහි ජල හා විදුලි බිල්පත් ගෙවිමේ වගකීමට බැඳි ඇති හෙයින් හිඟ මුදල් වාරික ලෙස හෝ ගෙවිමට කටයුතු කරන ලෙස ඇයට දන්වන ලෙස කාරක සභාව නියෝග කළේය. |
| 11. | වලංගු ලියාපදිංචියක් නොමැති පූර්ව බදු ලියාපදිංචි අංක 901442681 දරන බදුකරුට 2014 හා 2015 වර්ෂවලදි රු. | 2014-2015 ව්‍යාපෘති සඳහා අදාළ කොන්ත්‍රාත්කරු ලබාදුන් වැට් බදු ලියාපදිංචි අංකයට ගෙවිම් සිදුකර ඇතත් දේශීය ආදායම් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | 2,036,250/- ක එකතු කළ අගය මත බදු ගෙවා ඇතත්, මෙතෙක් අදාල මුදල් අයකර ගැනීමට කටයුතු නොකිරීම. | දෙපාර්තමේන්තුව විසින් ඒවා අයකර ගැනීම සිදුකර නොමැති බැවින් වංචා සහගත ලෙස කටයුතු කර ඇති කොන්ත්‍රාත්කරුට එරෙහිව නිත්‍යානුකුලව කටයුතු කරන බවට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දන්වා ඇති බව හෙලි විය.<br><br>නිෂ්කාශන වාර්තා ලබාගැනිමකින් තොරව ගෙවිම් සිදුකර ඇති බව නිරීක්ෂණය කළ කාරක සභාව මේ අයුරින් සිදුවන බොහෝ වංචා අවම කර ගැනිම සඳහා අමාත්‍යාංශය විසින් නිසි උපදෙස් හා මගපෙන්වීම් ලබාදිය යුතු බවට අවධාරණය කළේය. |
| 12. | සෙවනගල දිවිනැගුම ප්‍රජාමූල බැංකුවල සිදුව ඇති මූල්‍ය අක්‍රමිකතා | සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ නම් සඳහන් කර සමෘද්ධි බැංකු කළමනාකරුවෙකු සහ සමෘද්ධි සංවර්ධන නිලධාරියෙකු විසින් වංචා කිහිපයක් සිදුකර ඇති බැවින් ඔවුනට එරෙහිව විනයානුකූල පියවර ගෙන ඇති බවත් අක්‍රමිකතා අවම කිරිමේ අපේක්ෂාවෙන් බැංකු අධික්ෂණ නිලධාරියෙකු පත්කර බැංකු ශාඛා අහඹු පරික්ෂාවට ලක්කිරිමත් මාසික ප්‍රගති සමාලෝචන පවත්වා නිසි උපදෙස් ලබාදිම සහ බැංකු ශාඛා වෙත ගොස් ගනුදෙනු පරික්ෂා කිරිම ආදි ක්‍රියාමාර්ග දැනට ගෙන ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි පැවසිය.<br><br>මෙම කටයුතු විධිමත් කිරිම සඳහා සියළුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත පොදු චක්‍රලේඛයක් නිකුත් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | කිරීමට කටයුතු කරන ලෙස කාරක සභාව නියෝග කළ අතර එම චක්‍රලේඛයේ පිටපතක් විගණකාධිපතිවරයාටද යොමු කරන ලෙස දැන්වීය. |
| **මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**<br>**2018 අප්‍රේල් 06** | | |
| 1. | මුස්ලිම් පුණ්‍යාධාර අරමුදලට මුදල් ලබාදුන් දේවස්ථාන පිළිබඳ තොරතුරු ක්‍රමවත් අයුරින් පවත්වාගෙන ගොස් නොතිබීම. | අදාළ චෝදනාව සම්බන්ධයෙන් තමා එකඟවන බවත් පනතේ විධිවිධාන අනුව විගණන සමාගමක් තෝරාගැනීමේ බලතල වකුප් කමිටුව වෙත පැවරී ඇති බැවින් 2014 සහ 2015 වර්ෂවල පෞද්ගලික සමාගමක් මගින් විගණනය සිදුකර ඇති බව ගණන්දීමේ නිලධාරී පැවසීය. කෙසේ වෙතත් එම අරමුදලට රජයේ මූල්‍යාධාර නොලැබුණත් සියලු තොරතුරු දත්ත සංචිතයක් මගින් ක්‍රමවත්ව පවත්වාගෙන යාමට කටයුතු කරන ලෙසත් අරමුදලේ සියලු බලතල අධ්‍යක්ෂවරයා සහ ගණකාධිකාරිවරයා වෙත පවරා ඇති බවත් අනාවරණය විය.<br><br>මේ සම්බන්ධයෙන් පිළිගත් ක්‍රමවේදයක් මත කටයුතු කිරීමේ අවශ්‍යතාවය කාරක සභාව දැඩිව අවධාරණය කළේය. |
| 2. | 2015 වර්ෂයේ මුස්ලිම් දේවස්ථාන සඳහා රු. මිලියන 29 ක මූල්‍ය ආධාර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 59 හරහා නිකුත් කර ඇති අතර | දිස්ත්‍රික්ක 8 ක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 29 ක් සහ නැගෙනහිර පලාතේ සියලුම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ආවරණය වන පරිදි |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | ඒවා උපයෝජනය කර ඇති ආකාරය පිළිබඳව දෙපාර්තමේන්තු මට්ටමේ පසු විපරමක් සිදු වී නොමැත. තවද 2016 වර්ෂයේ දේවස්ථාන සහ දහම් පාසල් සංවර්ධනය සඳහා දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් රු. මිලියන 36 ක මුදල සඳහා ලදුපත් ඉදිරිපත් කර තිබුනේ රු. මිලියනකට පමණි. | නිලධාරීන් අනුයුක්ත කර ඇති බවත් දෙපාර්තමේන්තුව විසින් මුදල් නිකුත් කර ඇති සියලු ලේඛන තමා සතුව පවතින බවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ලබාදී ඇති මුදල් සඳහා ලදුපත් ලැබී ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br>දෙපාර්තමේන්තුව මගින් ලබාදෙන මුදල් වෙනුවෙන් ලදුපත් ලබාගැනීම වහා සිදුකළ යුතු බවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දෙපාර්තමේන්තුව අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනිමට වැඩ පිළිවෙලක් සකස් කළ යුතු බවත් ජනගහන ව්‍යාප්තිය සැලකිල්ලට ගනිමින් සේවක ප්‍රමාණ ලේඛනයක් සකස් කිරීම කෙරෙහි වහා අවධානය යොමු කළ යුතු බව කාරක සභාව අවධාරණය කළේය. |
| 3 | හජ් අරමුදලේ වර්තමාන තත්ත්වය. | ආපසු ගෙවිය යුතු තැන්පතු ලෙස රු.මිලියන 50 ට ආසන්න මුදලක් අනුර් නැමති ගිණුමක තැන්පත් කර ඇති අතර එහි මුදල් වසර පුරා ආපසු ගෙවීමට සිදුවන බැවින් ආයෝජනය කිරීම දුෂ්කර බවත් සැම වසරකම හජ් වන්දනාව සඳහා අයදුම්කරුවන් ලියාපදිංචිය සිදුකරන නමුත් වසරකට 3000කට පමණ එම අවස්ථාව සැලසෙන බවත් දැනට 12,000 ට ආසන්න පිරිසක් ලියාපදිංචි වී ඇති අතර අයදුම්පත් ලැබෙන අනුපිළිවෙලට තෝරාගැනීම සිදුවන බැවින් වසර 5 ට වතාවක් හෝ අවස්ථාව ලබාදීම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | අපේක්ෂාව බවත් 2015 වසරේ හඳුන්වාදුන් නව වැඩපිළිවෙල හේතුවෙන් සාධාරණ අයකිරීම් යටතේ සැමට අවස්ථාව සලසා දීමට හැකි වූ බවත් ගණන්දීමේ නිලධාරී ප්‍රකාශ කළේය.<br><br>සැම අයෙකුටම එක් වතාවක් හෝ අවස්ථාව සැලසෙන පරිදි යාන්ත්‍රණයක් සකස් කිරීමේ අවශ්‍යතාවය පවතින බැවින් පරිගනක මාර්ග-ගත වැඩ සටහනක් (online) හඳුන්වා දීම පිළිබඳව අවධානය යොමු කළ යුතු බව කාරක සභාවේ අදහස විය. |
| **ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ විශේෂ පරීක්ෂණය**<br><br>**2018 අප්‍රේල් 05** | | |
| 1. | අර්ධ රාජ්‍ය ආයතනවලට ලබා දෙන භාණ්ඩාගාරයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොමැති ණය ශේෂ පැවතීම. | අර්ධ රාජ්‍ය ආයතනවල ශේෂ පත්‍ර ශක්තිමත් නැති අවස්ථාවල රජය විසින් එම ණය සඳහා ඇප වන අතර එම ආයතනවලට ණය ගෙවීමේ අපහසුතාවයක් පවතී නම් ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ඇතිව ලබා දෙන ප්‍රදාන විසර්ජන පනතේ මාරුකිරීම් ලෙස ඇතුලත් වන බවත් එම ප්‍රමාණයන් අයවැය හිඟය මූල්‍යනය කිරීම (gap financing) සඳහා යොදා ගන්නා බවත් ප්‍ර.ග.නි./ ග.නි. පැවසීය. එසේම, එම සහනාධාර රාජ්‍ය ආයතන සඳහා ලබා දෙන සංක්‍රාම ගෙවීම් ලෙස ගිණුම්වල සටහන් කිරීම මගින් ගිණුම්කරණ පරස්පරතා උද්ගත වී ඇති බවත්, එම තත්ත්වය නිවැරදි කර ගැනීම සඳහා |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | විගණකාධිපතිවරයා යම් යෝජනාවක් ඉදිරිපත් කරන්නේ නම් එම යෝජනාව අනුව එම නිවැරදි කිරීම් මෙම වසරේ සිදු කළ හැකි බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |
| 2. | 2002 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා භාණ්ඩාගාර ගිණුම් සම්බන්ධයෙන් විගණන මත | 2016 වර්ෂයේ මතය ව්‍යාවනය කිරීම සඳහා වත්කම් ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවයක් පැවතීම හේතු වූ බව විගණකාධිපතිවරයා විසින් පැහැදිලි කරන ලදී<br><br>ශේෂ පත්‍ර සකස් කිරීම 2005 වර්ෂයේ සිට ආරම්භ කළ බවත්, ඒකාබද්ධ අරමුදලට ලැබෙන සියළු ලැබීම් හා ගෙවීම් ඒ අනුව ගිණුම්ගත කරන බවත්, ප්‍රාග්ධන ස්වරූපයේ ලැබීම් හා ගෙවීම් සම්බන්ධයෙන් ජනිත වන වත්කම් හා වගකීම් පෙන්වීමට මෙම ක්‍රමය යටතේ ක්‍රමවේදයක් නොමැති බවත්, එම වත්කම් හා වගකීම් ආධාරක සටහන් (supporting entries)හරහා ගිණුම්ගත කරන බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසීය. එසේම ආයෝජනය ට්‍රිලියන 8 ක ප්‍රමාණය ආධාරක සටහන් පමණක් වන බැවින් ඒවායේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට ක්‍රමවේදයක් නොමැති බවත් ප්‍ර.ග.නි./ග.නි. වැඩිදුරටත් පැවසීය.<br>මේ සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ නියෝජිතයෙකුගෙන්ද සැදුම්ලත් කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුව විසින් සිදු කරන ලද විමර්ශනයකින් අනතුරුව ඉදිරිපත් කළ කමිටු වාර්තාවට අනුව ශුද්ධ වත්කම් ගැලපීම් ගිණුමක් මගින් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | පෙන්වීමට තීරණය කර ඇති බවත්, ඒ අනුව 2017 වසරේ ගිණුම් සකස් කිරීම නිසා එම තත්ත්වය නිවැරදි වී ඇති බවත් ප්‍ර.ග.නි/ ග.නි වැඩිදුරටත් පැවසීය<br><br>එමෙන්ම, උපචිත පදනමක් මත මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට 2018 අයවැය යටතේ යෝජනා කර ඇති බැවින් භාණ්ඩාගාරයට විශේෂිත වූ ගිණුම් ක්‍රමවේදයක් සකස් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බවද ප්‍ර.ග.නි./ග.නි පැවසීය |
| 3. | මූල්‍ය ප්‍රකාශන හා වාර්තාවල ප්‍රාග්ධන වියදම් යටතේ වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරන ලද වියදම මගින් ජනිත වන මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් ජනරජ ගිණුම මගින් නිරූපණය කිරීම සඳහා එකී වියදමට සමාන නාමික ස්වරූපයේ ගිණුම් හඳුන්වා දීම. | ණය මගින් අත්පත් කර ගන්නා ලද වත්කම් හඳුනා ගැනීම හා ගිණුම්ගත කිරීම සඳහා භාණ්ඩාගාරය විසින් විධිමත් වැඩපිළිවෙළක් සකස් කර ඇති බව ප්‍ර.ග.නි/ග.නි පැවසීය. මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමට ක්‍රමවේදයක් 2015දී නොතිබූ බැවින් ගිණුම් ක්‍රමය වෙනස් කරමින් ඒ සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දී ඇති බවද, මේ වන විට බිලියන 814ක වත්කම් ගිණුම්ගත කර ඇති බවත්, වසර දෙකක් ඇතුලත සිගාස් වැඩසටහන හරහා මෙම හඳුනා ගැනීම අවසන් කිරීමට බලාපොරොත්තු වන බවත් ප්‍ර.ග.නි/ග.නි. පැවසීය.<br><br>මේ වසරේ සිට වත්කම් ගිණුම්ගත කිරීම සඳහා ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වෙමින් විගණකාධිපතිවරයාගේ එකඟත්වය ඇතිව, පත් කර ඇති විශේෂඥ කමිටුවේ නිර්දේශය පරිදි නව ආකෘතියක් සකස් කරන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී. එසේම නිවැරදි කර ගත යුතු ගිණුම්කරණ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | දෝෂ හා ඒවා නිවැරදි කර ගැනීමට අපේක්ෂා කරන කාල රාමුව ඇතුලත් වාර්තාවක් කඩිනමින් කාරක සභාව වෙත ලබා දෙන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී.<br><br>ඒ සඳහා දැනටමත් වැඩපිළවෙලක් භාණ්ඩාගාරයේ උපදෙස් මත රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන බවත්, ඒ යටතේ කාර්තුමය පදනමක් මත ගිණුම්කරණ දෝෂ නිවැරදි කර ගැනීමේ ප්‍රගතිය විමසුමට ලක් කරන බවත්, 2017සිට එකඟ වූ ක්‍රමවේදය යටතේ ගිණුම් ඉදිරිපත් කරන බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |
| 4. | 2017 ගිණුම් සම්බන්ධයෙන් භාණ්ඩාගාරය විසින් ඒකාබද්ධ අරමුදලට ගිණුම් ප්‍රකාශයක් හා ජනරජ ගිණුමක් ලෙස ගිණුම් දෙකක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විගණන මතය ඉදිරිපත් කළ යුත්තේ ඒකාබද්ධ අරමුදලේ ගිණුම් සම්බන්ධයෙන්ද නැතහොත් ජනරජ ගිණුමටද යන්න සම්බන්ධයෙන් නීතිපති මතය විමසා ඒ අනුව ගිණුම් වාර්තා ඉදිරිපත් කරන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී. |
| 5. | "රාජ්‍ය ණය" සම්බන්ධ නිර්වචනය | රාජ්‍ය ණය ලෙස සලකනු ලබන්නේ රජය විසින් ලබා ගන්නා, ඒකාබද්ධ අරමුදලේ සඳහන් ණය පමණක් වන බව කාරක සභාවේ විමසුමට පිළිතුරු ලෙස ප්‍ර.ග.නි./ග.නි පැවසීය. කෙසේවුවද, පළාත් සභා, පළාත් පාලන ආයතන, අර්ධ රාජ්‍ය ආයතන හා ව්‍යවස්ථාපිත ආයතන මගින් ලබා ගන්නා ණය ප්‍රමාණය සම්බන්ධයෙන් අදහසක් මෙම ගිණුම් මගින් නිරූපණය නොවන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | බවද, එවැනි අදහසක් ලබා ගත හැකි නම් කාරක සභාවට මෙන්ම පොදුවේ මහජනතාවට වැදගත් කරුණක් බව කාරක සභාවේ අදහස විය. |
| 6. | මුදල් අමාත්‍යාංශයේ ගිණුම්වල අවිනිශ්චිත වගකීමක් (contingency liability) සඳහන් වන රාජ්‍ය ආයතන විසින් ලබා ගෙන ඇති ණය රු. බිලියන 563.7ක ප්‍රමාණයෙන් මහාභාණ්ඩාගාරය විසින් ගෙවනු ලබන ප්‍රමාණය. | එම ප්‍රමාණයෙන් මහා භාණ්ඩාගාරය විසින් ගෙවනු ලබන්නේ ඉතා සුළු ප්‍රමාණයක් බව ප්‍ර.ග.නි /ග.නි පැවසීය. එම ණය ප්‍රමාණයෙන් අදාළ ආයතන විසින් මාසිකව/වාර්ෂිකව ගෙවන ප්‍රමාණය හා මහා භාණ්ඩාගාරය විසින් මාසිකව /වාර්ෂිකව ගෙවන ප්‍රමාණය හා ඉදිරියට ගෙවීමට ඇති ප්‍රමාණය සම්බන්ධයෙන් වාර්තාවක් 2018 අප්‍රේල් මස 30 වන දිනට පෙර විගණකාධිපතිවරයාටද පිටපතක් සහිතව කාරක සභාව වෙත එවන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි. වෙත නියෝග කරන ලදී . |
| **ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව<br>2018 ජූනි 07** | | |
| 1. | 2016, 2017 සහ 2018 යන වර්ෂ සඳහා සකස් කර තිබූ වාර්ෂික ක්‍රියාකාරී හා ප්‍රසම්පාදන සැලසුම් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 1/2014 ට අනුකූල නොවීම. | 1987 ප්‍රාදේශිය සභා පනතේ අතුරු ව්‍යවස්ථා 42 ක් සහ පළාත් පාලන අතුරු ව්‍යවස්ථා 10 ක් යටතේ සලසා ඇති ප්‍රතිපාදනයන්ට අනුකූලව ප්‍රාදේශීය සභාවේ කටයුතු සිදු වුවත් විෂයයන් 10 ට අදාළව අනුව්‍යවස්ථා සභාව විසින් පනවාගෙන ඇති බවත් එමෙන්ම පැවති දුර්වලතා හඳුනාගෙන ඒවා අවමකර ගැනීම සඳහා වැඩමුළු කීපයක් ද පවත්වා ඇති බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | සභාව විසින් පනවාගෙන ඇති අතුරු ව්‍යවස්ථා පිළිබඳව සවිස්තර වාර්තාවක් ලබාදෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය. |
| 2. | මුදල් රෙගුලාසි අංක 133 සහ උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ අංක 4 /2015 දරන චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ ගනුදෙනු සහ කාර්යයන් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් 2017 දෙසැම්බර් 31 දින දක්වා සිදුකර නොතිබීම. | දෙපාර්තමේන්තු මට්ටමින් විගණනයක් සිදුකළත් සභාව මගින් අභ්‍යන්තර විගණනයක් මේ දක්වා සිදුකර නොමැති බවත් කලින් මෙම විෂය භාරව කටයුතු කළ නිලධාරියාගේ පැවති ගැටලුකාරී තත්වයක් නිසා නව නිලධාරියෙකු ඒ සඳහා පත්කළ බවත් පැවති දුර්වලතාවයන් හඳුනාගනිමින් එම අංශයේ කටයුතු ක්‍රමවත් කිරීමට කටයුතු කර ඇති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසිය. |
| 3. | 1999 වර්ෂයේ පොකුණු ව්‍යාපෘති 12 ක් සඳහා ගෙවිය යුතුව තිබූ මුදලින් කොටසක් නොගෙවීම හේතුවෙන් ප්‍රාදේශීය සභාවට එරෙහිව සොඩියැක් ලුබ්රිකේටින් සර්විස් නැමති ආයතනය විසින් අධිකරණයේ පවරා තිබූ නඩු 12 ට අදාළව තවදුරටත් එම ආයතනයට ගෙවීමට නියමිතව තිබූ රු.මිලියන 4.2 මුදල සහ නෛතික පොලිය සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගය. | මෙම සිදුවීම සම්බන්ධයෙන් අධිකරණය රු.මිලියන 7.6 ක බැඳීමකට ප්‍රාදේශීය සභාව යටත් කර තිබුණු අතර එම මුදලින් රු. මි.3.3 ක් සහා වත්කම් වෙන්දේසි කර සෝඩියැක් ලුබ්රිකේටින් සර්විස් ආයතනයට ගෙවා තිබුණි.<br>2018.01.31 වන විට රු. මිලියන 4.2ක් සහ නෛතික පොළිය අදාළ ආයතනයට ගෙවිය යුතුව ඇතත් හිඟ මුදල පමණක් ගෙවා ගැටළුව නිරාකරණය කර ගැනීමේ උත්සාහයක දැනට නිරතව සිටින බවත් එවකට කටයුතු කළ තාක්ෂණ නිලධාරීන් වර්ෂවසානයේ ප්‍රතිපාදන වෙන් කර ගැනීමේ අරමුණින් කාර්යය අවසන් කිරීමකින් තොරව ව්‍යාජ මිනුම්පත් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | හා ගෙවීම් වවුචර් ඉදිරිපත් කර පළාත් සභාවෙන් මුදල් ප්‍රතිපාදන ලබාගැනීමට දැරූ උත්සාහයක් හෙළිවීම නිසා පළාත් සභාව මුදල් ලබා දිම අත්හිටුවා තිබූ බව සඳහන් කළ ප්‍ර.ග.නි./ග.නි. ඊට වගකිව යුතු නිලධාරින් සොයා ගැනිම අපහසු බවත් එම කාලවකවානුවේ සභාපති, ලේකම් තනතුරු හෙබවූ අයද මියගොස් ඇති බවත් පැවසීය.<br>කෙසේවෙතත්,මේ සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ඊට වගකිව යුතු අයගෙන් පාඩුව අයකර ගැනිමට කටයුතු කරන බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br>සාවද්‍ය වාර්තා ඉදිරිපත්කර අධිකරණය ඉදිරියේ සභාව වැරදිකරු කිරිමට කටයුතු කළ නිලධාරීන්ට මෙන්ම නිතීමය පියවරක් නොගෙන තම වගකිම නිසි ලෙස ඉටුකිරීමට ක්‍රියා නොකළ හිටපු පළාත් පාලන කොමසාරිස්වරයාට කාරක සභාවේ අප්‍රසාදය පළ විය.<br>මේ සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන්ගෙන් පාඩුව අයකර ගැනිම හෝ ඔවුන්ට එරෙහිව නිතීමය ක්‍රියාමාර්ග ගැනිම වහා සිදුකළ යුතු බවට නියෝග කළ කාරක සභාව මාස 2 ක් තුල ඒ පිළිබඳ සවිස්තර වාර්තාවක් ලබාදෙන ලෙස ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 4. | අශ්වයාබැඳිවැව සහ ඉහළගම යන ගම්මානවලට පානීය ජලය ලබාදිම සඳහා ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය ලේකම් විසින් 2009-2012 කාලය තුල රු.18,759,980/- ක පිරිවැයක් දරා වැඩ නිම නොකළ ප්‍රජා ජල ව්‍යාපෘතියක් 2014 දී ප්‍රාදේශීය සභාවට පවරා දී තිබුණද ජල ටැංකියේ සහ නල පද්ධතියේ පැවති දෝෂ හේතුවෙන් එම ගම්මානවල ජනතාවට පානීය ජලය ලබාදිමට 2018 ජනවාරි 31 දින වන විටත් නොහැකි වීම. | දිසාපතිවරයාගේ මැදිහත්විම මත අසාර්ථක ව්‍යාපෘතියක් ලෙස නම්කර වගකිවයුත්තන්ගෙන් අදාළ පාඩුව අයකර ගැනීමට තිරණය කර ඇති බව ප්‍ර.ග.නි./ ග.නි. පැවසිය.<br><br>විශේෂයෙන් මෙම ව්‍යාපෘතියේ මුල්‍ය හා ඉදිකිරීම් යන අංශවලට සම්බන්ධ වු නිලධාරීන් දැනට සේවයේ නිරත වන බැවින් සියලු දෙනා එක්ව මෙම ගැටළුව පිළිබඳව අවධානය යොමුකර යහපත් එකඟතාවයකට එළඹීමේ අවශ්‍යතාවය පවතින බැවින් ඊට මැදිහත්වන ලෙස වගකිවයුතු අංශවලින් ඉල්ලා සිටින බව ගණන්දීමේ නිලධාරී පැවසිය.<br><br>මෙම ගැටලුව නිරාකරණය කිරිම සඳහා දිසාපතිවරයාගේ මැදිහත්විම මත ගෙන ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය මාස 2 ක් තුල කාරක සභාවට වාර්තා කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය. |
| 5. | 2012 වර්ෂයේ දැයට කිරුළ ව්‍යාපෘතිය මගින් ගලෙන්බිඳුණුවැව නාගරික ජල සම්පාදනය සඳහා ලබා දි තිබුණු ප්‍රතිපාදන වලින් 2013 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.මිලියන 3.4 ක් පමණ වටිනා PVC ජලනල තොගය 2018 ජනවාරි මස 31 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන දිරාපත්වෙමින් නිෂ්කාර්යව පැවතීම. | දැයට කිරුළ වැඩසටහන යටතේ යාන්ඔය ප්‍රදේශයේ ජල ව්‍යාපෘතියක දිගුවක් සඳහා රු.මිලියන 5 ක් වැයකර මෙම ජල නල මිලදි ගෙන තිබුණත් 2013 වර්ෂයේ බලපෑ ගංවතුර තර්ජනය නිසා එහි වැඩ කටයුතු සිදුනොවූ බැවින් ජලනල තොගය කිසිදු කාර්යයකට නොගෙන සහා භූමියේ තබා ඇති බවත් ඉදිරියේදි ජල සම්පාදන මණ්ඩලය වෙතින් තත්ත්ව වාර්තාවක් ලබාගැනිමෙන් අනතුරුව ඒවා වෙන්දේසි කර |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | දැම්මට කටයුතු කරන බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |
| 6. | මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය යටතේ 2011 වර්ෂයේදි ලැබී තිබුණු රු.1,280,163/- ක මුදල ජංගම බැංකු ගිණුමක තැන්පත් කර තිබූ අතර කොන්ත්‍රා -ත්කරුවෙකු විසින් සභාවට එරෙහිව අනුරාධපුර දිසා අධිකරණයේ පවරා තිබූ නඩුවක් හේතුවෙන් ගිණුමේ ගනුදෙනු අත්හිටුවා ඇත. මේ නිසා 2018 ජනවාරි 31 දින වනවිටත් අපේක්ෂිත අරමුණු ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම. | පිළිසරු ව්‍යාපෘතියේ කටයුතු ඇනහිට ඇතත් ගොඩනැගිල්ලේ වහල මට්ටම දක්වා ඉදිකිරීම් කටයුතු සිදුකර ඇති බැවින් මේ වසර ඇතුලත ව්‍යාපෘතිය නිමකළ හැකි බව ග.නි. පැවසීය. |
| 7. | 2014 වර්ෂයේ සභාව මගින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිවල පරිපාලන වියදම් අතරින් රු.226,252/- ක මුදලක් උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්ගේ 2009/10 චක්‍රලේඛයට පටහැනිව සභාවේ නිලධාරීන් 10 දෙනෙකුට දීමනා ලෙස ගෙවා තිබීම. | මෙම මුදල් ආපසු අයකර ගැනීම කඩිනම් කරන ලෙසත් අදාළ නිලධාරින්ට එරෙහිව නීතිමය පියවර ගන්නා ලෙසත් කාරක සභාව නියෝග කළේය. |
| 8. | 2017 නොවැම්බර් 30 දිනට වරිපනම් බදු ඒකක 552 කින් රු.3,362,979/- ක මුදලක් අයවිමට තිබූ අතර, අදාළ ශේෂය තුල වර්ෂ 05 ඉක්මවූ හිඟහිටි වරිපනම් රු.1,085,254/-ක් පැවතීම ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනිම නිසි පරිදි සිදුකර නොතිබිම. | වරිපනම් කලාප නිශ්චිත ලෙස ගැසට් කර නොතිබිම, නියමිත වරිපනම් පටිපාටියක් නොතිබිම, ආර්ථික වශයෙන් සවිමත් ජනතාවක් නොසිටීම යන කරුණු සභාවේ වරිපනම් ආදායම අඩුවීම කෙරෙහි බලපා ඇතත් පසුගිය වසරේ රු. ලක්ෂ 8 පමණ මුදලක් අයකර ඇති බව ග.නි. පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| **ශ්‍රී ලංකා ගුවන් හමුදාව<br>2018 ජුනි 21** | | |
| 1. | 2016 වර්ෂයේ මූලධන ඇස්තමේන්තු යටතේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් 77.6%ක ඉතිරිවීමක් පෙන්නුම් කර තිබීම | 2016 වසරේ රුසියානු ණය යෝජනා ක්‍රමය යටතේ ගුවන් යානා පිරිවැඩියා මධ්‍යස්ථානයක් ඉදි කිරීම වෙනුවෙන් රු මිලියන . 1400ක් ඉල්ලුම් කළ බවත්, මේ සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින්ද රු මිලියන. 13,250ක ප්‍රතිපාදන සලසා තිබූ බවත්, එබැවින් ප්‍රථමයෙන් ඉල්ලුම් කළ මුදල අනවශ්‍ය බැවින් එම මුදල ගිණුම්ගත කිරීමේ අවශ්‍යතාවයක්ද පැන නොනැගුණ බැවින් එය ඉතිරියක් ලෙස පෙන්වන බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසීය .<br>2015අයවැය ඇස්තමේන්තු සඳහා එම ප්‍රතිපාදන ලබා දී නොතිබූ 2016 වසරේ නිසා එම මුදල ලබාදීමට නියමිතව තිබූ බවද ගිණුමේ ප්‍රතිපාදන ඉතිරි වී තිබූ නිසා ගිණුම්ගත නොකළ ගනුදෙනු ගිණුම්ගත කිරීමට මහා භාණ්ඩාගාරය තීරණය කළ බවද, මෙම මුදල 2014 වසරේ ගිණුම්ගත කළ යුතුව තිබූ නමුදු ණය සීමා නිසා මෙම ප්‍රතිපාදන ලබා දී නොතිබූ බවද මහා භාණ්ඩාගාර නියෝජිතයකු පැවසීය<br>ප්‍රතිපාදන ඉතිරිවීමට හේතුව සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාවක් කාරක සභාව වෙත හා විගණකාධිපතිවරයා වෙත 2018/07/05 දිනට පෙර යොමු කරන ලෙස කාරක සභාව මුදල් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නියෝග කළේය |
| 2. | සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ ශ්‍රී ලංකා හෙලිටුවර්ස් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලෙස රජයේ නිලධාරීන් කටයුතු කිරීම සම්බන්ධව පවතින නීතිමය තත්ත්වය | ඒ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ උපදෙස් ඉල්ලා ඇති බවත් එම උපදෙස් තවම ලැබී නොමැති බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසීය.<br>වර්තමානයේදී හෙලිටුවර්ස් ආයතනයෙන් ලැබෙන ආදායම් කිසිවක් ගුවන් හමුදාව වෙත රඳවා නොගෙන එම සියළු ආදායම් ඒකාබද්ධ අරමුදල වෙත යොමු කරන බව ප්‍ර.ග..නි/ග.නි පැවසීය.<br>ඉහත කරුණු සැලකිල්ලට ගෙන ආයතනයේ සුභසිද්ධියද සැලසෙන පරිදි එම අරමුදල් පරිපාලනය කිරීම සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් හා ත්‍රිවිධ හමුදාපතිවරුන් ද කැඳවා විධිමත් වැඩපිළිවෙලක් සකසන මෙන් කාරක සභාව මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නියෝග කළේය. |
| 3. | ශ්‍රී ලංකා ගුවන් හමුදාව මඟින් සපයන ලද ගුවන් ගමන් වෙනුවෙන් 2017.12.31 දිනට අයවිය යුතුව ඇති රු. මිලියන 13.47ක හිඟ මුදල අයකර ගැනීමේ ප්‍රගතිය. | අදාළ අමාත්‍යාංශවල ලේකම්වරු කැඳවා එම මුදල සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කර කාරක සභාව වෙත වාර්තා කරන මෙන් කාරක සභාව මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නියෝග කළේය. |
| 4. | 2009 වර්ෂයේදී පෞද්ගලික සමාගම් දෙකකින් ලබා ගත් රු.19,691,000/- ක් වටිනා වසර 15ක වගකීමකට යටත්ව මිලදී ගත් සූර්යබල වීථි පහන් 187කින් 148ක් හා බැටරි 33ක් 2015 වසර වනවිට ක්‍රියා විරහිත වී තිබීම නිසා | සූර්යබල වීථි පහන් මිලදී ගත් ආයතනය මේ වන විට වසා ඇති බවද, මේ සම්බන්ධයෙන් යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට නීතිපති උපදෙස් ඉල්ලා ඇති බවද , මෙම ආයතනය මේ වන විට ඇවර කර ඇති බැවින් ඇවරකරුට විරුද්ධව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | සිදුවූ රු.මිලියන 16ක අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. | එන්තරවාසි යැවීමට නියමිතව ඇති බව නීතිපති විසින් දන්වා ඇති බවද ප්‍ර.ග.නි/ග.නි පැවසීය.<br>තාක්ෂණික ස්වරූපයේ මිලදී ගැනීමකදී සැපයුම්කරු තෝරා ගන්නා විට ආයතනයේ පැවැත්ම සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගත යුතු බවද, ඒ සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කළ යුතු බවද විගණකාධිපතිවරයා අවධාරණය කළේය. |
| 5. | ගිනි නිවීමේ ඒකකයේ අහස් ඉනිමං ස්ථානගත කිරීම සඳහා කොළඹ ආසන්නයේ සුදුසු ස්ථානයක් නොමැති වීම | ඒ සඳහා සුදුසු ඉඩමක් සොයා ගෙන තිබුණද අනවසර පදිංචිකරුවන් සඳහා වන්දි ගෙවීමට මිලියන 192ක මුදලක් අවශ්‍ය වී ඇති බවද, එම මුදල ගෙවා ඉඩම නිදහස් කර ගැනීමේ හැකියාවක් ගුවන් හමුදාවට නොමැති බවද ග.නි. පැවසීය. එමෙන්ම අවශ්‍ය ඉදිකිරීම් කටයුතු සඳහාද ප්‍රතිපාදන අවශ්‍ය බව ප්‍ර.ග.නි./ග.නි. වැඩිදුරටත් පැවසීය<br><br>දිනෙන් දින කොළඹ නගරය තුළ ඉදි වෙමින් පවතින මහල් ගොඩනැගිලි ගින්නෙන් ආරක්ෂා කර ගැනීම සඳහා ගිනි නිවීමේ ඒකකයට අවශ්‍ය සම්පත් ලබා දීම අතිශයින් වැදගත් කරුණක් බව අවධාරණය කළ කාරක සභාව, ඒ සඳහා මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයටද විශාල වගකීමක් පැවරෙන බැවින්, ගිනි නිවීමේ ඒකකයට අවශ්‍ය ඉඩමක් ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත නියෝග කළ කාරක සභාව, |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | කාරක සභාවේ එම නියෝගය මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා යවන මෙන්ද, ඉදි කිරීම් කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා වූ යෝජනාව 2019 වසරේ අයවැය යෝජනාවලට ඇතුලත් කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් සමග මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමු කරන මෙන්ද ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය. |
| 6. | ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් රේඩාර් රිසීවරයක් සහ ඇන්ටනා ස්කෑනරයක් 2014 අප්‍රේල් 04 දින වන විට අලුත්වැඩියා කටයුතු සඳහා චීනයට යවා තිබුණ නමුත් ඉහත භාණ්ඩ අස්ථානගත වීම හේතුවෙන් ගුවන් හමුදාවට රු 74,457,100/-ක අලාභයක් සිදු වී තිබුණු අතර එම අලාභයට වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගෙන අලාභය අය කර ගැනීමට කටයුතු කර නොතිබීම මෙන්ම මෙම උපකරණය සඳහා රක්ෂණාවරණයක් ලබා ගෙන නොතිබීම. | මෙම උපකරණය අලුත්වැඩියා කිරීමට චීනයට යැවීම සඳහා Care Logistics නමැති ආයතනයට භාර දුන් බවත් එහෙත් අතරමගදී එම උපකරණය අස්ථානගත වීම හේතුවෙන් එය චීනයට ළඟා වී නොමැති බවත්, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු ඉදිරියට කර ගෙන යාම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දී ඇති බවත් ප්‍ර.ග.නි./ ග.නි. පැවසීය.<br><br>එමෙන්ම උපකරණයට අදාළ තක්සේරු වාර්තාව මේ වන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇති බවත්, වරදකරුවන්ට එරෙහිව දඬුවම් ලබා දීමට මෙන්ම අස්ථානගත වූ උපකරණයේ වටිනාකම ආපසු අය කර ගැනීමටද කටයුතු කරන බවත් හෙතෙම ප්‍රකාශ කළේය.<br>අදාළ අලාභය අය කර ගැනීමට සිවිල් නඩුවක් පැවරීමේ හැකියාව පිළිබඳව නීතිපතිවරයාගෙන් විමසන බව ප්‍ර.ග.නි/ග.නි. පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| | | රක්ෂණාවරණය ලබා ගැනීමට ක්‍රියා නොකළ නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රියා කරන ලෙසද, අදාළ උපකරණය අස්ථානගත වීම හේතුවෙන් සිදු වූ අලාභය අය කර ගැනීමට ක්‍රියා කරන මෙන්ද, ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් මේ සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ඉල්ලා යැවූ ලිපිය හා ඒ සඳහා නීතිපතිවරයා විසින් ලබා දුන් පිළිතුරද, මෙම කරුණ සම්බන්ධයෙන් වාර්තාවක් සති දෙකක් ඇතුලත කාරක සභාව වෙත යොමු කරන මෙන්ද කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී. |
| | **ත්‍රිකුණාමලය නගර සභාව**<br>**2018 ජුලි 04** | |
| 1. | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ජාලගත පරිගණක කළමනාකරණ තොරතුරු පද්ධතියේ, ත්‍රිකුණාමල නගර සභාව විසින් ලබා ඇති දුර්වල කාර්ය සාධන මට්ටම | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ජාලගත පරිගණක කළමනාකරණ තොරතුරු පද්ධතියට අනුව 2015 මුදල් වර්ෂය සඳහා ත්‍රිකුණාමල නගර සභාවේ සාමාන්‍ය ලකුණු මට්ටම 46.5ක්ව පවතින බවත් නගර සභා 41ක් අතරින් අවම ලකුණු සංඛ්‍යාව ලබාගෙන ඇති නගර සභාව බවත් කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදි. එමෙන්ම මෙම දින පවත්වනු ලැබූ කාරක සභාවට ත්‍රිකුණාමල නගර සභාව කැඳවීමට මූලික හේතුව මෙය වූ අතර, මෙම තත්ත්වය මගහරවා ගැනීම සඳහා සභාවේ ගිණුම්වල පවතින විෂමතාවයන් හෝ අඩුපාඩු නිවැරදි කිරීම සඳහා හා විගණන විමසුම් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා මාස |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | 3කට වරක්වත් විගණන හා කළමනාකරණ කමිටුව පවත්වන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත උපදෙස් දෙන ලදි. |
| 2. | නගර සභාවේ ජ්‍යෝෂ්ඨ මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 02ක් (නගර සභාවේ ලේකම් තනතුර හා ගණකාධිකාරී තනතුර) ප්‍රාථමික මට්ටමේ තනතුරුවල සේවකයින් 27ක අතිරික්තයක්, ද්විතීයික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 42ක් හා තෘතීයික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 01ක් පැවතීම. | ත්‍රිකුණාමල නගර සභාව සංචාරක කර්මාන්තය හරහා විශාල ආදායමක් උපයා ගැනීමේ හැකියාවක් ඇති ආයතනයක් බැවින් එහි ආදායම කළමනාකරණය කිරීම සඳහා අවම වශයෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ලේකම්වරයෙකුවත් සිටිය යුතු බව කාරක සභාව අවධාරණය කළේය.<br><br>දිස්ත්‍රික්කය තුළ සේවය කරන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ හා ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ නිළධාරීන්ගේ හිඟයක් පවතින බවත්, රාජ්‍ය කළමනාකරණ සහකාර විශේෂ ශ්‍රේණියේ හා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ නිළධාරීන් විසින් පිළිවෙලින් එම තනතුරු දෙකෙහි රාජකාරි ආවරණය කරනු ලබන බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>අවම වශයෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ එක් නිළධාරියෙක් හා අනුමත කාර්ය මණ්ඩලයක් පත්කර ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන, කළමනාකරණ, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 3. | 2014 වර්ෂයේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25 යටතේ සේවකයින් 54 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබා දීමෙන් පසු ප්‍රාථමික මට්ටමේ නිළධාරීන් 21ක අතිරික්තයක් පැවතීම. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දරන්නාට පුද්ගලිකවන (personal-to-holder) පදනම යටතේ අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කර ඇති බවත්, එම අතිරික්ත කාර්ය මණ්ඩලය විශ්‍රාම යෑමෙන් පසුව පුරප්පාඩු ඇති නොවන බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>එමෙන්ම 2014 අංක 25 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලට අනුව එම පත්වීම් ලබා දී ඇති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |
| 4. | නගර සභාවට අයත් ඉඩම් පර්චස් 3212ක් පුද්ගලයන් 576කට හිටපු සභාපතිවරයා විසින් 2008 වර්ෂයේ දී ලබා දී ඇති බවත් පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් ( 2010.08.11 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ) පත් කරන ලද විශ්‍රාමික මහාධිකරණ විනිසුරුවරයකු විසින් මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර ඊට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස නිර්දේශ කර තිබීම හා 2015 මැයි 26 දින පැවති පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීමේ දී ගනු ලැබූ තීරණයක් අනුව පත්කරන ලද පළාත් සභාවේ මහඇමතිතුමාගේ සභාපතීත්වය දරන කමිටුව විසින් 2018 ජූනි 29 දින වන විටද එහි වාර්තාව ඉදිරිපත් කර නොමැති | නගර සභා සේවකයන් සහ නගර සභාවේ ඉඩම්වල පදිංචිකරුවන් අතර ඉඩම් බෙදා හැර තිබුණු බවත් නගර සභාවට අයත් සින්නක්කර ඉඩම් පෞද්ගලික පදිංචිකරුවන්ට බෙදාහැරීමට නගර සභාවේ සභාපතිවරයාට අධිකාරියක් නොමැති බැවින් එම ගණුදෙනුව නිත්‍යානුකූල නොවන බවත් ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. එම වංචනික ගණුදෙනුව සම්බන්ධයෙන් හිටපු සභාපතිවරයා ඉවත්කර ඇති බවත්, වත්මන් පදිංචිකරුවන්ට කල්බදු පදනම යටතේ ඉඩම් බෙදා හැරීමට කටයුතු කරන බවත් ප්‍ර.ග.නි./ග.නි. තවදුරටත් පැවසීය.<br><br>මේ සම්බන්ධ සවිස්තර වාර්තාවක් මාස තුනක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කරන මෙන් කාරක |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | වීම සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම තවදුරටත් ප්‍රමාද වීම. | සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය. |
| 5. | අපවිත්‍ර ජලය පිරිසිදු කර පරිසරයට මුදාහැරීමේ අරමුණින් යුක්තව 2014 වර්ෂයේ දී රු.4,404,907/-ක වියදමින් ඉදි කරන ලද මලාපවහන පිරිසිදු කිරීමේ පද්ධතියේ අත්‍යවශ්‍යම අංගයක් වන කොහු කෙඳි දැමීමේ කාර්යය සිදු වී නොතිබීමෙන් එම පද්ධතියේ ඉදිකිරීම් අවසන්ව නොමැති බවත්, අපවිත්‍ර ජලය තවමත් පරිසරයට මුදා හැරීම සිදුවන බව හා එම දූෂණය මෙතෙක් වලක්වා ගැනීමට අපොහොසත්ව පැවතීම. | මලාපවහන පිරිසුදු කිරීමේ පද්ධතියට මෙතෙක් විදුලිබලය ලබා දී නොමැති බවත් එහි සම්පූර්ණ ක්‍රියාකාරීත්වය සඳහා විදුලිය බලය අවශ්‍ය බවත්, වල් අලින් පැමිණීම වැළැක්වීමේ අරමුණින් යුක්තව රු.618,858/-ක වියදමින් ඉදිකළ විදුලි වැටද මෙම ව්‍යාපෘතියට ඇතුළත් බවත්, ඉන්වොයිසියට අනුව මෙම පද්ධතියේ වියදම රු.2,201,230/-ක් බව හා අලින් විසින් මෙම පවිත්‍රාගාරයේ (Night Soil Treatment Plant) මුල් ව්‍යුහයට හානි සිදුකර ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>මලාපවහන පිරිසුදු කිරීමේ පද්ධතියට හා විදුලි වැට ඉදිකිරීම වෙනුවෙන් 20%ක මූලික ගෙවීමක් සිදුකළ බව හා ඉතිරි 80% ක මුදල සභා ගිණුමේ පවතින බවත්, මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් සිදුකරනු ලබන CGL International Eco (Pvt.) Ltd සමාගම විසින්, එහි ඉදිකිරීම් නියමිත කාලය තුළ අවසන් කිරීමට පියවර ගනු ඇති බවත් ව්‍යාපෘතියට වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන නිසා අතිරේක මුදල් අවශ්‍ය වනු ඇති බවත් ප්‍ර.ග.නි. /ග.නි. වැඩිදුරටත් පැවසීය.<br><br>මෙම ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය හා ප්‍රගතිය පිළිබඳ සවිස්තර වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | මෙන් කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය. |
| 6. | 2017 වර්ෂයේ දී රෝහල් මඟින් ඉවත දමන පරිසරයට අහිතකර අපද්‍රව්‍ය දහනය කිරීමේ අරමුණින් නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි වීර්නගර් ප්‍රදේශයේ රු. 4,230,155/-ක වියදමින් උදුනක් ඉදිකර තිබුණද මෙතෙක් එය අක්‍රියව පවතින බව හා කින්නියා ප්‍රදේශයේ විවෘත භූමියකට තවදුරටත් මෙම රෝහල් අපද්‍රව්‍ය අපහරණය කරමින් පැවතීම. | 2018 පෙබරවාරි මස 14 වන දින ලංකා විදුලිබල මණ්ඩලයෙන් තෙකලා විදුලිය ලබාගැනීම සම්බන්ධව ඉල්ලීමක් කර තිබුණද, විදුලි සම්බන්ධතා සඳහා ඇස්තමේන්තු තවමත් ලබා දී නොමැති බව ප්‍ර.ග.නි. / ග.නි. පැවසීය.<br><br>මෙම විදුලිය සැපයීමේ ගැටළුවට අදාළව වාර්තාවක් විදුලි බල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ලබාගන්නා ලෙසත්, මෙම උදුන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විදුලිය සපයා ගැනීමට පියවර ගන්නා ලෙසත් ඒ සම්බන්ධ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය.<br>මෙම ක්‍රියාවලිය සෞඛ්‍යයට හා ප්‍රදේශවාසීන්ගේ ආරක්ෂාවට තර්ජනයක් බව, අවධාරණය කළ කාරක සභාව අපද්‍රව්‍ය භූමියට යාබදව පාසැලක් හා මුස්ලිම් පල්ලියක් පිහිටා තිබෙන බවද නිරීක්ෂණය කළේය. |
| 7. | සභාවට අයත් කඩකාමර 299න් කඩකාමර 90ක් කුලියට ලබා නොදී 2011 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතීමෙන් වසර 7ක් පුරා ආසන්න වශයෙන් වසරකට රු. මිලියන 20ක ආදායමක් නගර සභාවට අහිමිව පැවතීම. | නාගරික සංවර්ධන අධිකාරිය විසින් එම අධිකාරියේ අරමුදල් භාවිතයෙන් මෙම ගොඩනැගිල්ල සැලසුම් කොට ඉදිකර ඇති බවත්, සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මෙම ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ කඩකාමර 90ක අවන්හල් ආරම්භ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | කිරීම සඳහා සලකා බලමින් සිටින බවත් ප්‍ර.ග.නි. / ග.නි. පැවසීය.<br><br>මෙම කඩකාමර සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නිර්දේශ ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් පළාත් සභා කොමසාරිස්වරයා වෙත නියෝග කරන ලදි. |
| 8. | නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක ව්‍යවසායන් 109ක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමකින් තොරව එම ව්‍යවසායන් පවත්වාගෙන යාම සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබීම. | සියළුම "සී" කාණ්ඩයන් සඳහා වෙළඳ බලපත්‍ර මේ වන විට නිකුත් කර ඇති බවත්, පරිසර බලපත්‍ර නගර සභාව විසින් නිකුත් කිරීම සඳහා පියවර ගෙන ඇති බවත් ප්‍ර.ග.නි. / ග.නි. පැවසීය.<br><br>පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත් කිරීමෙන් තොරව වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි. / ග.නි. වෙත නියෝග කරන ලදි. |
| 9. | සභාව විසින් කඩකාමර 259ක් පෞද්ගලික ව්‍යවසායකයන්ට කුලියට ලබා දී තිබූ අතර එම කඩකාමරවලින් වසර 07කට වඩා පැරණි රු. 14, 899,765/- ක හිඟ ආදායමක් අයකර ගෙන නොතිබීම සහ එම හිඟ මුදල් 2016 දෙසැම්බර් 31 දින වන විටද අයකර ගැනීමට කටයුතු කර නොමැති වීම. | කඩකාමරවල හිඟ කුලී මුදල් ගෙවා නොමැති පුද්ගලයන්ට එරෙහිව නීතිමය පියවර ගෙන ඇති බව අනාවරණය විය. |
| 10. | 2012 වර්ෂයේ සිට පැවත එන රු.මිලියන 101ක හිඟ වරිපනම් ආදායම් 2017 වර්ෂය වන විටද පැවතීම. | බොහෝ හිඟ මුදල් වසර 8කට වඩා පැරණි බවත් 2010 වර්ෂය වන විට හිඟ ආදායම රු.මිලියන 98/-ක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | බවත් ප්‍ර.ග.නි. / ග.නි. පැවසීය. එමෙන්ම නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු රු.මිලියන 10ක පමණ හිඟ ආදායම් පවතින බවද මෙහිදී හෙලිවිය. |
| 11. | සභාව විසින් 2016, 2017 හා 2018 වර්ෂයන්හිදී රු. මිලියන 32ක් පමණ ගණුදෙනු හා සම්බන්ධ විගණන විමසුම් 07ක් සඳහා පිළිතුරු එවීමට කටයුතු කර නොතිබීම. | සති 02ක් ඇතුළත අදාළ විගණන විමසුම්වලට පිළිතුරු ඉදිරිපත් කිරීමට පියවර ගන්නා බව ප්‍ර.ග.නි. / ග.නි. පැවසූ අතර මේ සම්බන්ධ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි. / ග.නි. වෙත නියම කරන ලදි. |
| 12. | සෞඛ්‍ය ගැටළු | ත්‍රිකුණාමල නගර සභාව සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 5දෙනකු පත්කර ඇති බවත්, නගර සභාව විසින් එම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා මාර්ගෝපදේශ නිකුත් කර නොමැති අතර, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් නිකුත් කරන මාර්ගෝපදේශ යටතේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ක්‍රියාත්මකවන බවත් හෙළි විය.<br><br>සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීන් විසින් එසේම නිශ්චිත රාජකාරී ඉටුකිරීම සඳහා නගර සභාවලට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් නිදහස් කරන බවත්, ඔවුන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවලට අනුයුක්ත කර ඇති බවත් ප්‍ර.ග.නි. / ග.නි. පැවසීය.<br><br>සියළුම පළාත් පාලන ආයතනවලට අනුයුක්තකර ඇති මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට රාජකාරි පැවරීම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | සහ නියාමනය කිරීම සම්බන්ධ පොදු ක්‍රමවේදයක් තිබීමේ වැදගත්කම අවධාරණය කළ කාරක සභාව ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි. / ග.නි. වෙත නියම කරන ලදි. |
| 13. | රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය මඟින් පළාත් පාලන ආයතනවල විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය අර්ථකථනය කර නොතිබීම. | පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකාරී සහ පළාත් පාලන ආයතනවලට අදාළව චක්‍රලේඛයේ පවතින අඩුලුහුඩුකම් මගහරවා ගැනීම සම්බන්ධ සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි. / ග.නි. වෙත නියම කරන ලදි. |
| **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව<br>2018 ජූලි 06** | | |
| 1. | දෙපාර්තමේන්තුගත තනතුරු දරන නිලධාරින් අනුරූප ඒකාබද්ධ සේවාවන්ට අන්තර්ග්‍රහනය කිරීමේ නියෝගයේ හා සේවා ස්ථාන මාරු කිරීමට ලක්වන නිලධාරින් තේරීමේදී අමාත්‍යාංශය විසින් සකසන ලද විධිමත් ක්‍රමවේද යටතේ සිදු කිරීමේ වර්තමාන තත්ත්වය | වසර 5ක සේවා කාලය සම්පූර්ණ කළ නිලධාරින් 387ගේ තොරතුරු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ඉල්ලීම පරිදි ලබාදුන් බව ග.නි. සඳහන් කළේය. ඒ අනුව අදාල ඉදිරි පියවර ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිසම වෙත එම තොරතුරු ඉදිරිපත් කර ඇති බව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ද කාරක සභාවට වාර්තා කර තිබුණි.<br><br>කෙසේ වෙතත්, කාරක සභාව විසින් දීර්ඝ කාලයක් තිස්සේ දිගින් දිගටම ලබාදුන් නියෝග පරිදි මෙම නිලධාරින්ගේ සේවා ස්ථාන මාරු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | කිරීම තවදුරටත් ප්‍රමාද වීම පිළිබඳ කාරක සභාවේ අප්‍රසාදය පළ වූ අතර මේ සම්බන්ධව කඩිනම් පියවර ගෙන රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශ ලේකම්ට වාර්තා කරන මෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට ලිපියක් යොමු කිරීමට කාරක සභාව මෙහිදී තීරණය කරන ලදී. |
| 2. | ඊ-මෝටරින් ව්‍යාපෘතියේ ප්‍රගතිය | අදාල ව්‍යාපෘති ප්‍රදාන පත්‍රය අදාල සමාගම වෙත නිකුත් කර ඇති බවත්, මේ වන විට ගිවිසුම් කෙටුම්පත නීතිපති වෙත යොමුකර ඇති බවත්, එහි අනුමැතිය ලබා ගැනීමෙන් පසු ගිවිසුම අත්සන් කිරීමට නියමිත බවත් ප්‍ර.ග.නි. පැවසීය. |
| 3. | රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේදී අදාල ලිඛිත පරීක්ෂණය සඳහා විභාග ප්‍රශ්න පත්‍ර සැකසීම, විභාග පැවැත්වීම, පිළිතුරු පත්‍ර පරීක්ෂාව, පිළිතුරු පරිගණක ගත කිරීම, පිළිතුරු පත්‍ර තබා ගැනීම සහ විභාග තහනම් කිරීම යන සියලු කටයුතු මෝටර් රථ පරීක්ෂකවරු විසින් සිදු කර තිබීම හා රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේදී අදාල පිළිතුරු පත්‍රවල අනුක්‍රමික අංක ක්‍රමයක් දෙපාර්තමේන්තුව විසින් භාවිතා නොකිරීම නිසා ව්‍යාජ පිළිතුරු පත්‍ර ඇතුලත් කිරීමට හැකියාවක් පැවතීම. | මෙම ලිඛිත පරීක්ෂණය සඳහා ස්පර්ශ තිර මඟින් පිළිතුරු සැපයිය හැකි ක්‍රමවේදයක් සහිත පද්ධතියක්, කාරක සභාවේ මඟපෙන්වීමද යටතේ නිර්මාණය කර ඇතැයිද, එය 2018 ජුලි මස 12 වනදා සිට ක්‍රියාත්මක වීමට නියමිත යැයිද ග.නි. පැවසීය.<br><br>මෙම ඉලෙක්ට්‍රොනික පිළිතුරු පත්‍ර ගබඩා කිරීම, එම පිළිතුරු පත්‍රවල ආරක්ෂාව සහ පද්ධතියේ දත්ත ආරක්ෂණය සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් ගෙන ඇති පියවර කාරක සභාවේ දැඩි අවධානයට යොමු විය.<br><br>මෙම දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | හඳුනාගත් කාරක සභාව, තොරතුරු තාක්ෂණ අංශයේ නිලධාරීන් පුළුල් කිරීමේ සීමාව සඳහන් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ලිපියක් යොමු කිරීමට උපදෙස් දුනි. |
| 4. | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ රියදුරු බලපත්‍ර මුද්‍රණය සඳහා වූ කොන්ත්‍රාත්තුව BOT පදනම යටතේ වර්ෂ 7ක කාලයකට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු වෙත පවරා තිබීම හා අදාළ කොන්ත්‍රාත් කාලය 2018 මාර්තු 26 දින දක්වා අවස්ථා 2කදී දීර්ඝ කර තිබීම. මෙම ගිවිසුම යටතේ 2016 වර්ෂයේ රියදුරු බලපත්‍ර මුද්‍රණය සඳහා පමණක් අදාල කොන්ත්‍රාත්කරුට රු. මිලියන 968ක් ගෙවා තිබීම. | මෙලෙස කොන්ත්‍රාත්කරුට දිගින් දිගටම විශාල මුදල් ප්‍රමාණයක් ගෙවීමට සිදු වීම, කොන්ත්‍රාත් කාලය දිගු කිරීමේදී ගෙවිය යුතු මුදල් ප්‍රමාණය අඩු කර ගැනීමට අවධානය යොමු නොකිරීම, BOT පදනම යටතේ අදාල කාලයේදී මෙහි කටයුතු දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීම සඳහා විධිමත් සැලැස්මකින් තොරව වගකීම් විරහිත අයුරින් ක්‍රියා කිරීම සම්බන්ධයෙන් කාරක සභාවේ බලවත් අප්‍රසාදය පලවිය. මේ සම්බන්ධව නව විගණන පනතට අනුව කටයුතු කරන ලෙස කාරක සභාව විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත නියෝග කරන ලදී.<br><br>රියදුරු බලපත්‍ර මුද්‍රණයට අදාල ගිවිසුම් පරිශීලනය කොට, මෙම ප්‍රතිපත්තිමය තීරණ නිසා පාරිභෝගිකයාට හා රජයට සිදුව ඇති පාඩුව පිළිබඳව මූල්‍යමය ගණනයක් කොට කාරක සභාවට මසක් ඇතුළත වාර්තා කරන ලෙස කාරක සභාව විසින් මුදල් අමාත්‍යාංශයට නියෝග කරන ලදී. |
| 5. | ඊ-මෝටරින් ව්‍යාපෘතියේ ප්‍රගතිය | ඊ-මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවෙන ආකාරය හා දින වකවානු ඇතුළත් වාර්තාවක්ද, මෙම නව පද්ධතියට පරිලෝකනය කරන ලද පැරණි ලිපිගොනු ඇතුළත් කිරීම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | කෙසේ ක්‍රියාවට නැංවෙන්නේද යන්න පිළිබඳ දින වකවානු ඇතුළත් වාර්තාවක් ද සපයන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි. / ග.නි. වෙත නියෝග කරන ලදී. |
| 6. | රියදුරු බලපත්‍ර නිකුත් කිරීම සඳහා වන ලිඛිත විභාගය මාර්ගගත ක්‍රමයට සියලුම දිස්ත්‍රික් කාර්යාලවල පැවැත්වීම. | දැනට වේරහැර කාර්යාලයේ පමණක් මාර්ගගත ක්‍රමයට විභාගය පැවැත්වෙන බවත්, අදියර කිහිපයක් යටතේ අනෙකුත් දිස්ත්‍රික් කාර්යාලවලට ද මෙය ව්‍යාප්ත කිරීමට කටයුතු යොදා ඇති බවත් ග.නි. පැවසීය. හැකි ඉක්මනින් දිවයින පුරා පිහිටි දිස්ත්‍රික් කාර්යාලවල රියදුරු බලපත්‍ර නිකුත් කිරීම සඳහා වන ලිඛිත විභාගය මාර්ගගත ක්‍රමයට පැවැත්වීමට කටයුතු යෙදිය යුතු බවත්, එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන අයුරු දැක්වෙන දින වකවානු ඇතුළත් වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි. / ග.නි. වෙත නියෝග කරන ලදී. |
| 7. | 302 කාණ්ඩය යටතේ වාහන ලියාපදිංචි අංක 302-2108 අංකය දක්වා පමණක් සිදුකර එතැන් සිට ඉංග්‍රිසි අක්ෂර හඳුන්වා දී තිබුණි. එහෙත් 302-0001 සිට 302-2108 දක්වා වාහන ලියාපදිංචි අංක 45ක් පමණ වාහන ලියාපදිංචියෙන් තොරව මඟහැරී තිබුණි. නමුත් 2017 දෙසැම්බර් 26 දින සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී ඉහත සඳහන් පරිදි ලියාපදිංචියෙන් තොරව පැවැති වාහන අංක 10ක් | මෙම වාහන 10 දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇත්තේ කවදාද? ඒ සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇත්තේ කවදාද? ඉල්ලුම්පත් භාර ගෙන ඇත්තේ කවුරුන්ද? වාහනවල භෞතික පරීක්ෂාව සිදු කර ඇත්තේ කවුරුන්ද? බලපත්‍ර ලියාපදිංචි කළේ කවුරුන්ද? ලිපිගොනු භාරව සිටියේ කවුරුන්ද? බලපත්‍ර හිඟ ගාස්තු ලබාගත්තේ කවුරුන්ද? ඊට අදාලව දඩ මුදල් කොපමණ ගෙවා ඇත්ද? |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | සඳහා වාහන ලියාපදිංචි කර තිබූ බව නිරීක්ෂණය විය. මෙලෙස වාහනය ලියාපදිංචි කල දින සිට වර්ෂ 07ත් 15ත් වැනි දීර්ඝ කාලයක් මෙම වාහන සඳහා එකම දින එකවර ආදායම් බලපත්‍ර ලබාගෙන තිබීම හා මෙම වාහන 10ට අදාල ලිපිගොනුද දෙපාර්තමේන්තු ලේඛනාගාරයේ නොමැති බව අනාවරණය වීම. | යනාදිය සඳහන් කර පොදුවේ මේ පිළිබඳ අමාත්‍යාංශයේ නිර්දේශය සඳහන් කර අදාල නිලධාරින්ගේ නම් හා දින වකවානු සහිත වාර්තාවක් ජුලි මස 20 දින වන විට කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. / ග.නි. වෙත නියෝග කරන ලදී.<br><br>එම වාර්තාව ලද පසු මෙම සිදුවීම සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශය සඳහන් වාර්තාවක් ද අවශ්‍ය බව දැන්වූ කාරක සභාව ඉන් පසු මෙම සිදුවීම නීතිපති වෙත යොමුකර මේ සම්බන්ධයෙන් බාහිර පරීක්ෂණයක් ලබා ගත හැකි දැයි යන්න පිළිබඳ නීතිපති මතය විමසීමට තීරණය කරන ලදී. |
| 8. | වාහන අංක තහඩු මුද්‍රණයට අදාල නව කොන්ත්‍රාත් ප්‍රදානය | දිගු කලක් තිස්සේ විවිධ පෞද්ගලික සමාගම් වෙත වාහන අංක තහඩු මුද්‍රණයට අදාල කොන්ත්‍රාත් ප්‍රදානය කරමින් පැවතීම කාරක සභා රැස්වීම් ගණනාවකදීම සාකච්ඡාවට බඳුන් වූ අතර, මෙම කාර්යය පිළිබඳ ලංකා-ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයෙන් විමසන ලෙසත්, වෙනම ඒකකයක් ස්ථාපිත කර හෝ ඔවුන්ට මෙම කාර්යය කළ හැකි දැයි විමසා වාර්තාවක් ලබා ගන්නා ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි. / ග.නි. වෙත නියෝග කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 9. | ව්‍යාජ ලෙස ලියාපදිංචි කොට ඇති ප්‍රාඩෝ වර්ගයේ ජීප් රථ 7 පිළිබඳ විමර්ශන කටයුතුවල මූලික විමර්ශන වාර්තාව | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද මූලික විමර්ශන වාර්තාවට අනුව ඉදිරි කටයුතු කිරීම සඳහා චෝදිත නිලධාරින්ට අදාල චෝදනා පත්‍ර සකස් කර ඉදිරිපත් කරන ලෙස දන්වා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් වෙත ලිපියක් යොමු කර ඇතැයි ප්‍ර.ග.නි. / ග.නි. පැවසීය. |
| **විදේශ කටයුතු අමාත්‍යාංශය<br>2018 අගෝස්තු 07** | | |
| 1. | විදේශයන්හි ඇති විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකාවට අයත් ගොඩනැගිලි සංඛ්‍යාව | ස්ථිර ගොඩනැගිලි 27ක් හා කුලී පදනම මත 350ක් පවතින බවද රටවල ස්වභාවය අනුව ස්ථිර පදනම හෝ කුලී පදනම මත ගොඩනැගිලි ලබා ගන්නා බවද ප්‍ර.ග.නි පැවසීය. මෙම ගොඩනැගිලි මිලදී ගැනීම / කුලී පදනම මත ලබා ගැනීම පිළිබඳ මූල්‍යමය වාසිය හෝ අවාසිය පිළිබඳ සවිස්තරාත්මක කරුණු දැක්වීමේ වාර්තාවක් විදේශ තානාපති කාර්යාල සතු වාහන පරිහරණය පිළිබඳ විස්තරයක්ද සමග ඔක්තෝම්බර් මස 15 දිනට පෙර ලබා දෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නියෝග කළේය. |
| 2. | විදේශ දූත මණ්ඩලයන්හි කාර්ය මණ්ඩල සංයුතියන් තීරණය කරන පාර්ශවයන් හා දූත මණ්ඩලවල විවිධ ප්‍රමාණයන්ගෙන් කාර්ය මණ්ඩල පිහිටුවීමට අදාළ කරගන්නා නිර්නායකයන්. | කළමනාකරණ සේවා කමිටුව සමග කාර්ය මණ්ඩල සංයුතියන් තීරණය කර අවශ්‍යතා මත එම සංයුතීන් වරින් වර වෙනස් කරන බවද විදේශ දූත මණ්ඩලවල 42% ක් පමණ විදේශ සේවයේ නිලධාරීන්ද, |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | 3% ක් වානිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ද, කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් 43% ක්ද, අදාළ තානාපතිතුමාගේ අධීක්ෂණය යටතේ පවතින බවද දැනට 10% ක් තනතුරු පුරප්පාඩුවීම් පවතින බවද ප්‍ර.ග.නි. පැවසීය. මෙම කාර්ය මණ්ඩලය එක් එක් රටවලට බෙදීයාමේදී එක් එක් රටවලට අදාළ කරගන්නා නිර්නායක පිළිබඳ විශ්ලේෂණය කර විස්තරාත්මක වාර්තාවක් සැප්තැම්බර් 01ට පෙර ලබාදෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නියෝග කළේය. |
| 3. | ශ්‍රී ලාංකිකයන්ට විදේශයන්හි සංචාරයේදී වීසා ලබා ගැනීමේ ක්‍රමවේදයන්. | වීසා ලබාදීම එම ලබා දෙන රටේ පරමාධිකාරී බලය මත තීරණය වන බවද වීසා කොන්දේසි උල්ලංගණය කරන අවස්ථාවලදී නව වීසා කොන්දේසි පැනවීම එම රටවල් මගින් සිදු කරන බවද එබැවින් මේ පිළිබඳ බලපෑම් කිරීමට අමාත්‍යාංශයට නොහැකි බවද කෙසේවුවද මේ පිළිබඳ විනිවිදභාවයෙන් කටයුතු කරන ලෙස තම අමාත්‍යාංශය මගින් අදාළ රටවලින් ඉල්ලා සිටින බවද ප්‍ර.ග.නි පැවසීය.<br><br>මේ පිළිබඳව රටවල් අනුව වර්ගීකරණයක් සිදුකර ඒ පිළිබඳ ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය ප්‍රායෝගික ක්‍රමවේදයක් සකස් කර ඒ පිළිබඳ වාර්තාවක් මසක් තුළ කාරක සභාවට ලබාදීමට හා මාස 3ක් ඇතුළත එම ක්‍රමවේදය ක්‍රියාවට නැංවීමට කටයුතු කරන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ලෙස ප්‍ර.ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය. |
| 4. | තානාපති කාර්යාලවල කාර්යසාධනය. | 2018 වසරට ක්‍රියාකාරී සැලැස්මක් සාදා ඇගයීමක් සිදුකර ප්‍රධාන කාර්යසාධන දර්ශක වැඩිදියුණු කර අමාත්‍යාංශයේ කාර්යභාරයේ ස්වභාවය අනුව ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක දර්ශක මගින් කාර්යයන් ඇගයීමක් සිදු කරන බව ප්‍ර.ග.නි. පැවසීය. මෙම ක්‍රියාවලිය පිළිබඳ තානාපතිවරුන්ගේ වගවීම පිළිබඳ අමාත්‍යාංශය මගින් දැනුවත් කිරීමක් කළයුතු බව කාරක සභාව අවධාරණය කළේය. |
| 5. | ආයතන අතර එකිනෙකට සම්බන්ධවූ පරිගණක ජාලයක් නොපැවතීම. | මෙම කරුණ අමාත්‍යාංශයේ කාර්යසාධනය දුර්වලවීමට බලපා ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළේය. මේ පිළිබඳ වාර්තාවක් යොමු කරන ලෙස කාරක සභාව නියෝග කළේය. මේ පිළිබඳ ක්‍රියාකිරීමට ICTA ආයතනය සමග කටයුතු කර ඇතිමුත් තාක්ෂණික ගැටළුවක් හේතුවෙන් එය ප්‍රමාදවී ඇති බව ප්‍ර.ග.නි. පැවසීය. ද්විත්ව පුරවැසිභාවය ලබාගැනීමටද මෙම වැඩපිළිවෙලහි ඇති ප්‍රමාදය බලපා ඇතිබව කාරක සභාව මෙහිදී නිරීක්ෂණය කළේය. මේ පිළිබඳ වාර්තාවක් අගෝස්තු 20ට පෙර ලබා දෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නියෝග කළේය. |
| 6. | විදේශ අමාත්‍යාංශය විසින් විදේශ රටවල් සමග අත්සන් කරනු ලැබූ ගිවිසුම්. | වර්ෂ 2000-2010, 2011-2015, 2016-2018 ලෙස වර්ගීකරණයක් සිදු කර ඒ එක් එක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | කාලපරිච්ඡේදයට අදාළව විදේශ අමාත්‍යාංශය විසින් විදේශ රටවල් සමග අත්සන් කරනු ලැබූ ගිවිසුම් මොනවාද, අත්සන් කළ දිනය, කුමන රටවල් සමගද, කාර්යය, වර්තමාන තත්වය ආදී ලෙස වර්ගීකරණය කර වාර්තාවක් ලබා දෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නියෝග කළේය. |
| **ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය<br>2018 අගෝස්තු 08** | | |
| 1. | මාදු ගඟ හා මීගමු කලපු ව්‍යාපෘතියට නෙදර්ලන්ත ආධාර මගින් නිම කිරීමට නියමිතව තිබුණද, ඒ සඳහා වැය වූ මිලියන 73ක මුදල ප්‍රතිපූරණය කිරීම නෙදර්ලන්ත රජය මගින් ප්‍රතික්ෂේප කිරීම නිසා එම මුදල ආසියානු සංවර්ධන බැංකුණය හා ඉතිරිය අමාත්‍යාංශ වැය ශීර්ෂ මගින් ප්‍රතිපූරණය කිරීමට සිදු වීම. | ව්‍යාපෘතිය ඉටු කිරීමේ ප්‍රමාදය නිසා මෙම මුදල නෙදර්ලන්ත රජය මගින් ප්‍රතිපූරණය කර නොමැති බවත්, මුදල් අමාත්‍යාංශය වෙත වාර්තා කිරීමෙන් පසු මු.රෙ 66 මගින් ප්‍රතිපාදන මාරු කර ගැනීමෙන් පසු රු. 23,432, 037.73 ක ශේෂය නිරවුල් කර ඇති බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසීය<br><br>මෙම ව්‍යාපෘතිය මේ වන විට සම්පූර්ණ කර ඇත්ද, එසේ සම්පූර්ණ කර ඇත්නම් ව්‍යාපෘතිය අපේක්ෂිත කාර්යසාධනය අත්පත් කර ගෙන ඇත්ද යන කරුණු හා අනෙකුත් සියළු තොරතුරු ඇතුලත් වාර්තාවක් 2018 අගෝස්තු මස 20 වන දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි වෙත නියෝග කරන ලදී. |
| 2. | මව් යාත්‍රා 2ක් මිලදී ගැනීම සඳහා 2007 වර්ෂයේ සිංගප්පූරු සමාගමක් සමග එළඹ තිබූ ගිවිසුමට අනුව කොන්ත්‍රාත්කරු | මේ සම්බන්ධයෙන් වූ ලිපිගොනු අස්ථානගත වී ඇති බව කාරක සභාව වෙත වාර්තා කර තිබූ නමුත් එම ලිපිගොනු මේ වන විට හමු වී |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | යාත්‍රා නිෂ්පාදනය කර භාරදී නොතිබීම හා බැංකු ඇපකරය නොමැතිව අත්තිකාරම් ලෙස රු. මිලියන 113ක් හා රු. මිලියන 65ක් වැය කර තිබීම. | ඇති බවත්, මේ සම්බන්ධයෙන් අධ්‍යනය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසීය. එම කමිටු වාර්තාවට අනුව මෙම ව්‍යාපෘතිය හේතුවෙන් රු.මිලියන 65.2ක අලාභයක් රජයට සිදුවී ඇති බවත්, එම අලාභය අදාළ සිංගප්පූරු සමාගමෙන් අය විය යුතුව ඇති බවත්, මේ සඳහා නීතිපති උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කරන ලෙස එමඟින් නිර්දේශ කර ඇති බවත්, ප්‍ර.ග.නි/ග.නි පැවසීය.<br><br>කාර්යසාධන ඇපකරය අය කර ගැනීමට අපොහොසත් වූ නිලධාරීන්ට එරෙහිව අමාත්‍යාංශ මට්ටමින් පරීක්ෂණයක් සිදු කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. එමෙන්ම නීතිපති උපදෙස් කුමක්ද යන්න හා අමාත්‍යාංශ මට්ටමින් සිදු කරන පරීක්ෂණයේ ප්‍රගතිය සම්බන්ධ වාර්තාවක් සහ මෙම සිදුවීමට වගකිව යුතු නිලධාරීන් කවුරුන්ද යන්න සඳහන් වාර්තාවක්ද සැප්තැම්බර් මස 01 වැනිදාට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී. |
| 3. | වෙල්ලමංකර ධීවර වරාය ව්‍යාපෘතිය | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නියම කර ඇති ආයතනවලින් අනුමැතිය ලබා ගෙන ඇති බවටත්, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් කිසිදු හානිදායක තත්ත්වයක් උද්ගත නොවන බවටත්, මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ඵලදායී ලෙස යොදා ගැනීම සම්බන්ධයෙන් වගකීම භාර ගන්නා බවටත් සඳහන් කරමින් අමාත්‍යාංශ ලේකම් හරහා කාරක සභාව වෙත ලිපියක් යොමු කරන මෙන් කාරක සභාව ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත නියෝග කළේය. එමෙන්ම, අනුමැතිය ලබා ගැනීම සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කර ප්‍රාදේශීය ලේකම්වරයා මගින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කරන ලෙසද කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී. |
| 4. | සුනාමි ව්‍යසනය බලපෑ දිස්ත්‍රික්ක 7ක ක්ෂුද්‍ර ව්‍යාපාරිකයන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් දිස්ත්‍රික් ධීවර සමුපකාර සමිති සාමාජිකයන් 2250ගේ ආයෝජනය මත පිහිටුවන ලද පොදු සමාගම | ඒ සම්බන්ධයෙන් වැඩිදුර කරුණු විමර්ශනය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති බව ප්‍ර.ග.නි/ග.නි පැවසීය.<br>විගණකාධිපතිවරයා විසින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මතු කර ඇති කරුණු පිළිබඳ වාර්තාවක් මසක් තුළ කාරක සභාව වෙත යොමු කරන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය. |
| **ආරක්ෂක අමාත්‍යාංශය**<br>**2018 අගෝස්තු 10** | | |
| 1. | 2015 වර්ෂයේදී ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ශික්ෂණ රෝහල ඉදිකිරීම සඳහා විශ්ව විද්‍යාලය විසින් රාජ්‍ය බැංකුවකින් ලබාගෙන තිබූ ණය වෙනුවෙන් පොලී ගෙවීම සඳහා 2015 වසරේ ලබා දී තිබූ රු. මිලියන 39.43ක් වෙනත් කාර්යයන් සඳහා යොදවා | ණය සඳහා පොලී ගෙවීම්වලට අදාල මුදල් මහා භාණ්ඩාගාරයෙන් අයදුම් කරන අවස්ථාවේ තිබූ ඩොලර් මිල අනුපාතිකයට වඩා මුදල් ලබා දෙන අවස්ථාවේ වූ ඩොලර් මිල අනුපාතිකය අඩු වීම හේතුවෙන් ඉතිරි වූ අමතර මුදල විශ්ව විද්‍යාලය විසින් වෙනත් පුනරාවර්තන වියදමක් පියවීමට වැය කර ඇති බව කාරක සභාව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | තිබීම පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු විය. | හමුවේ අනාවරණය විය. ඉන්පසු මෙම වියදම නිවැරදි කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ඉල්ලා සිටියද මෙය වැරදි මුදල් භාවිතයක් වන හෙයින් එම වියදම අනුමත කළ නොහැකි බවට මහා භාණ්ඩාගාරය විසින් දන්වා තිබුණු බවද මෙහිදී හෙළි විය.<br><br>මේ වන විට අදාල විශ්ව විද්‍යාලයට ණය වාරික ගෙවීම සඳහා මුදල් ලබා දීමේදී මෙවැනි වෙනස්කම් කෙරෙහි අවධානය යොමු කර ඉතිරිය පමණක් ලබාදීමට කටයුතු කර ඇති බවද කාරක සභාව හමුවේ අනාවරණය විය. |
| 2. | 2014 වර්ෂයට අදාලව "අපි වෙනුවෙන් අපි" ව්‍යවස්ථාපිත අරමුදලේ උත්සව කටයුතු සඳහා අරමුදල විසින් වැය කළ යුතු රු. 6,292,456/-ක් අමාත්‍යාංශය විසින් දරා තිබීම හා අරමුදල මඟින් එවැනි වියදම් දැරිය නොහැකි බව අනාවරණය වීම. | 2014 වසරේ "අපි වෙනුවෙන් අපි" අරමුදල යටතේ තැනූ නිවාස ආරක්ෂක අංශ නිලධාරීන් වෙත භාර දීම සඳහා සංවිධානය කළ උත්සව සඳහා එවකට ආරක්ෂක ලේකම්වරයාගේ උපදෙස් පරිදි අමාත්‍යාංශය මඟින් මෙම වියදම දරා ඇති බව ග.නි. සඳහන් කළේය. අමාත්‍යාංශය විසින් මෙවැනි වියදමක් දැරුවේ කෙසේද යන්න පැහැදිලි කරමින් සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නියෝග කරන ලදී. |
| 3. | 2014 වර්ෂයට අදාල වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සළසා නොතිබුණු දේශීය හා විදේශීය අමුත්තන්ට ත්‍යාග ලබාදීමට හා සංග්‍රහ කිරීමට රු. 13,225,990/-ක් වෙනත් සැපයීම් හා වෙනත් සේවා යන | මේ පිළිබඳ කරුණු පැහැදිලි කරමින් සවිස්තර වාර්තාවක් එවන ලෙස ප්‍ර.ග.නි. වෙත නියෝග කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | වැය විෂයයන් යටතේ වැය කර තිබීම හා එම සියළුම වියදම් මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව මූල්‍ය බලතල පවරා නොතිබුණු යුධ හමුදා සම්බන්ධීකරණ නිලධාරියා විසින් අනුමත කර තිබීම. | |
| 4. | 2011 ජනවාරි 25 දින අමාත්‍ය මණ්ඩලය විසින් අකුරේගොඩ ප්‍රදේශයේ ත්‍රිවිධ හමුදා මූලස්ථාන ගොඩනැඟිල්ල වර්ග මීටර් 211,500කින් යුක්තව රු. බිලියන 25ක ඇස්තමේන්තුවක් මත අදියර දෙකකින් නිම කිරීමට සැලසුම් කර තිබූ නමුත් පසු කාලීනව ගොඩනැගිලි සංකීර්ණයේ ප්‍රමාණය වර්ග මීටර් 411,915ක් දක්වා වැඩි කර තිබූ අතර ඒ හේතුවෙන් පිරිවැය ඇස්තමේන්තුව රු. බිලියන 55.60ක් දක්වා වැඩි වී තිබීම සහ මෙම ව්‍යාපෘතිය ඉතා මන්දගාමීව සිදුවීමට හේතු කවරේද යන්න පිළිබඳවද කාරක සභාව විමසීය. | 2017 වසරේ අග භාගයේ සිට නිසි කළමනාකරණයකින් යුතුව මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බවත්, ප්‍රසම්පාදන කටයුතු මේ වන විට අවසන් වී ඇති අතර ගොඩනැඟිලි දෙකක වැඩ නිම කොට ලබන වසරේ අප්‍රේල් මාසයේ යුධ හමුදාව හා ආරක්ෂක අමාත්‍යංශය එම ස්ථානයේ ස්ථාපිත කිරීමට කටයුතු යොදා ඇති බවත් ප්‍ර.ග.නි. පැවසීය. |
| 5. | ත්‍රිවිධ හමුදාවේ ආහාර ද්‍රව්‍ය සැපයීම උදෙසා ඉදිරිපත් කර තිබූ මිල ගණන් ඇගයීම සඳහා සාධාරණ වෙළඳපොළ මිල ලෙස යොදා තිබුණේ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිශ්චය කරන ලද මිල ගණන් වන අතර එම ක්‍රියාවලිය අඩුපාඩු සහිත බව නිරීක්ෂණය වී තිබුණු අතර එහිදී සමහර ලංසුකරුවන්ට අසාධාරණයක් සිදුවී ඇති බවට | සාධාරණ වෙළඳපොළ මිල තීරණය කිරීමේදී තම අරමුණ වූයේ ආරක්ෂක අංශ සාමාජිකයන්ට හොඳම ආහාර නිසි මිලට ලබා දීම පමණක් වන බවත්, එහිදී ලංසුකරුවන් තාත්වික මිල ගණන් ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් එම ලංසු ප්‍රතික්ෂේප කිරීමට සිදුවූ බවත් ප්‍ර.ග.නි. පැවසීය.<br><br>ත්‍රිවිධ හමුදාවන් සඳහා ආහාර ද්‍රව්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විවිධ ගැටළු ඇති බව නිරීක්ෂණය කළ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | එල්ල වී ඇති චෝදනා සම්බන්ධව විමසීය. | කාරක සභාව මේ සඳහා පරිගණක දත්ත පද්ධතියක් පැවතීමේ අවශ්‍යතාවය අවධාරණය කළේය.<br><br>ඒ අනුව සියලු ආරක්ෂක අංශ කඳවුරු, සැපයුම්කරුවන් යනාදී මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ සියලු ආයතන සම්බන්ධ කරමින් තොරතුරු කළමනාකරණ පද්ධතියක් සැකසීමට කමිටුවක් වහාම පත්කොට, බාහිර සේවා සපයන ආයතනයක සහයෝගය ලබාගෙන කටයුතු ආරම්භ කරන ලෙසත්, එහි මූලික සාකච්ඡා පවත්වා ඒ පිළිබඳ ලිඛිත වාර්තාවක් 2018 සැප්තැම්බර් මස 01 දින වන විට කාරක සභාව හමුවට ඉදිරිපත් කරන ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි. හට නියෝග කරන ලදී. |
| 6. | ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අවශ්‍යතාවයන් සඳහා කළු උස සපත්තු ජෝඩු 75000ක් මිලදී ගැනීම සඳහා වන ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2016 වර්ෂයේදී ආරම්භ කර තිබූ අතර 2018 වර්ෂයේ ජූලි 02 දින වන තෙක් මිලදී ගැනීම් සිදුවී නොතිබීම හා මෙම ටෙන්ඩර් ප්‍රදාන ක්‍රියාවලිය අවිනිශ්චිත හා සැක කටයුතු සිද්ධීන්ගෙන් යුතු බවට කාරක සභාවේදී අනාවරණය වීම. | මෙම විගණන විමසුමට අමාත්‍යාංශය පිළිතුරු සපයා නොතිබූ බවත්, වහාම මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර, තම නිර්දේශය අමාත්‍යාංශ ලේකම් හරහා වාර්තා කරන ලෙසත් කාරක සභාව අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකට නියෝග කරන ලදී. |
| | **නැවත පදිංචි කිරීම්, පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය**<br><br>**2018 අගෝස්තු 23** | |
| 1. | 2015 සහ 2016 වර්ෂවල ඉන්දිය රජයේ ආධාර මත නිවාස 1000 ක් ඉදිකිරිමේ නියමු ව්‍යාපෘතියක් සහ | මේ අතුරින් 43,510 ක ඉදිකිරීම් කටයුතු මේ වන විට අවසන් කර ඇති අතර නිවාස 221ක කටයුතු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | රු. 6,492,000,000/- ක ඉන්දීය රජයේ මුදල් ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කළ නිවාස 46,000 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සහ විදේශ අරමුදල් මත ක්‍රියාත්මක වන අනෙකුත් නිවාස ව්‍යාපෘතිවල ප්‍රගතිය. | මේ දක්වා සිදුවී නොමැත. ව්‍යාපෘති සම්බන්ධීකරණය සහ මූල්‍ය පාලනය ඉන්දීය මහකොමසාරිස් කාර්යාලය මගින් සිදුකළ අතර ව්‍යාපෘතියට පහසුකම් සැලසීමේ කාර්යය පමණක් අමාත්‍යාංශයට පැවරී තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ ඉදිනොකළ නිවාස 221ක් වෙනුවට මඩකලපුව ප්‍රදේශයේ නිවාස 131ක නව ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ඉන්දිය මහ කොමසාරිස් කාර්යාලය කටයුතු කරගෙන යන බව ප්‍ර.ග.නි./ග.නී. පැවසිය. |
| 2. | පකිස්තානය, කසකස්තානය සහ බහරේන් යන රටවල ආධාර මත ක්‍රියාත්මක කළ නිවාස 537 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය. | 2015-2017 කාලය තුල විදේශ රටවල මූල්‍යාධාර මත නිවාස 537 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළ අතර ඒ සඳහා පකිස්තානය රු. මිලියන 193.35, කසකස්තානය රු.මිලියන 27.95 සහ බහරේන් රාජ්‍යය රු. මිලියන 187.92 ක් මූල්‍ය ප්‍රතිපාදන ලබා දී ඇත. විවිධ අමාත්‍යාංශ වෙත ලැබී තිබූ මෙම මුදල් 2015 විසර්ජන ගිණුම හරහා මෙම අමාත්‍යාංශය වෙත ලබාදුන් අතර ඒවා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 7 මගින් නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා යොදවා ඇත.<br><br>ව්‍යාපෘති ගිවිසුමට අනුව වර්ග අඩි 550 ක නිවසක් ඉදිකිරීම සඳහා රු.550,000/- ක මූල්‍යාධාර විදේශ අරමුදලින් ලබාදීමටත් ඉතිරිය මහා භාණ්ඩාගාරය විසින් දැරීමටත් එකඟ වී ඇත. එම ආධාර මුදල රු. 800,000/- දක්වා වැඩි කිරීමට |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | තීරණය කිරීම හේතුවෙන් කලින් මුදල ලබාගත් ප්‍රතිලාභීන් ඊට විරෝධය පළ කරමින් අනුමත ඉතිරි මුදල ඔවුනටද ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇත. දැනට ව්‍යාපෘතියේ කටයුතු ද ඇනහිට ඇති අතර ආධාර මුදල් ලබාගත් අය මුදලට සරිලන කාර්යයක් ඉටුකර නොමැති බැවින් ඉතිරි මුදල් නිදහස් කිරීමේ ගැටළුවක් ද මතු වී ඇති බවත් එබැවින් 2017 දෙසැම්බර් 31 දිනට රු.16,975,000/- ක ප්‍රතිපාදන ඉතිරියක් වාර්තා වි ඇති බවත් ප්‍රකාශ කළ ප්‍ර.ග.නි./ග.නි. ව්‍යාපෘතියේ වැය වාර්තා කිසිවක් අමාත්‍යාංශය වෙත මේ දක්වා ලබා දි නොමැති බවද පැවසීය.<br><br>2018 වර්ෂයට නිවාස ඉදිකිරීම සඳහා අමාත්‍යාංශයට කිසිදු මූල්‍ය ප්‍රතිපාදනයක් සලසා නොමැති බැවින් නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය වෙතින් ප්‍රතිපාදන ලබාදෙන ලෙස ඉල්ලීම් කළත් ඊට සතුටුදායක ප්‍රතිචාරයක් ලැබී නොමැති බව ඔහු වැඩිදුරටත් පැවසීය.<br><br>මෙම ව්‍යාපෘතිවල සාර්ථකත්වයක් දක්නට නොමැති වීම පිළිබඳව කණස්සල්ල පලකළ කාරක සභාව මූල්‍ය හා භෞතික ප්‍රගතියක් නොමැති ව්‍යාපෘතින් පිළිබඳව මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අවධානය යොමු විය යුතු බවත් එවැනි ව්‍යාපෘති පිළිබඳව පසු විපරමක් සිදුකර වෙන්කර ඇති |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | මුදල් ඵලදායි ලෙස යොදාගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග අදාළ නිලධාරීන් සමග සාකච්ඡා කර සුදුසු වැඩපිළිවෙලක් සකස් කොට මාසයක් තුල කාරක සභාවට වාර්තා කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය. |
| 3. | 2015 වර්ෂයේදී අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති ආයතන 7 ක් පවත්වාගෙන යාම සඳහා වර්ග අඩි 35,000 ක ගොඩනැගිල්ලක් කුලියට ගැනීමේදී රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ වටිනාකම ඉක්මවා මසකට රු. 889,500/- බැගින් මාස 27 කාලයක් සඳහා රු.මිලියන 24 ක් සහ එකතු කළ අගය මත බදු වැඩිපුර ගෙවා තිබීම. | අමාත්‍යාංශය ස්ථාපිත කිරීම සඳහා සුදුසු ගොඩනැගිල්ලක් කුලී පදනමින් ලබාගැනීමට විවෘත මිල ගණන් කැඳවනු ලැබූ අතර වර්ග අඩියක් සඳහා පිළිවෙලින් රු. 39.93 ක්, රු.140.00 ක් සහ රු.145.00 ක් ලෙස මිල ගණන් තුනක් ඉදිරිපත් කර තිබුණි. අදාල ගොඩනැගිල්ල හිස්ව නොපැවතීම නිසා රු. 39.93 ක අවම මිල ඉදිරිපත් කර තිබූ ටෙන්ඩරය ප්‍රතික්ෂේප වූ අතර රු. 140.00 ක් වූ දෙවන ටෙන්ඩරය අමාත්‍යාංශය සහ අනෙකුත් ආයතනවල අවශ්‍යතාවයට වඩා ඉඩ ප්‍රමාණයක් සහිත ගොඩනැගිල්ලක් වීම සහ එය කාර්යාලය පරිශ්‍රයකට නුසුදුසුව පැවතීමත් නිසා එය ප්‍රතික්ෂේප වූ බවත් අවසානයේ රු. 145.00 ක මිල ඉදිරිපත් කර තිබූ ටෙන්ඩරය පිළිගැනීමට ප්‍රසම්පාදන කමිටුවට සිදුවූ බවත් ප්‍ර.ග.නී/ග.නී. පැවසීය.<br><br>වර්තමාන ගොඩනැගිල්ලේ වසර 2 ක කාලයක් අමාත්‍යාංශය සහ අනෙකුත් ආයතන පවත්වාගෙන යන අතර 2018 වර්ෂය සඳහා වර්ග අඩියක් රු.180.00 ක උපරිමයකට යටත්ව මිල ගණන් කැඳවූ විට මෙම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ගොඩනැගිල්ලේ හිමිකරු පමණක් වර්ග අඩියක් සඳහා රු. 185.00 ක මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. කෙසේවෙතත්, මිල සංශෝධනයක් සඳහා දැනට සාකච්ඡා පවත්වමින් සිටින අතර එය රු. 156.00 දක්වා අඩුකර ගැනීමට අපේක්ෂා කරන බවත් මෙම ක්‍රියාදාමයේදි සිදුවී ඇති ප්‍රමාදය නිසා දැනට අතිරේක කාල දිගුවක් ලබාගැනිමට ද සිදුවී ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසිය.<br><br>ප්‍රසම්පාදන රෙගුලාසිවලට අනුකූලව මෙම කටයුතු සිදුකරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි.ට නියෝග කළේය. |
| 4. | නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිවල ප්‍රගතිය සම්බන්ධයෙන් අමාත්‍යාංශය ඉදිරිපත් කර ඇති ලේඛණවලට අනුව එම කටයුතු සෑහිමකට පත්විය හැකි තත්ත්වයක නොපැවතීම. | අවතැන් වු 164,000 ක පමණ පවුල් සංඛ්‍යාව සලකා බලන විට නැවත පදිංචි කිරිමේ කටයුතු වෙනුවෙන් වාර්ෂිකව වෙන්වන මුදල ප්‍රමාණවත් නොවන බවත් පසුගිය වර්ෂයේ වෙන් කළ රුපියල් බිලියන 14 ක මුළු ප්‍රතිපාදනයෙන් නිවාස ඉදිකිරිම සඳහා පමණක් රුපියල් බිලියන 12 ක් වැය කිරිමට සිදුවී ඇති බවත් පුද්ගල ගණනින් ප්‍රගතිය සලකා බැලිම ප්‍රායෝගික නොවන බැවින් ප්‍රතිපාදන මත සංසන්දනාත්මකව එය ගණනය කළ යුතුව ඇති බවත් සඳහන් කළ ප්‍ර.ග.නී./ග.නී. නැවත පදිංචි කිරීමේ කටයුතුවල 98% පමණ ප්‍රගතියක් අත්කර ගැනිමට අමාත්‍යාංශයට හැකිවූ බවත් පැවසිය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| **හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව 2018 අගෝස්තු 23** | | |
| 1. | දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ තත්‍ය සේවක සංඛ්‍යාවේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව | 2017 වර්ෂයේ පුරප්පාඩු 58ක් පැවති බවත්, 2018 ජූලි 31වන විට එය 38 දක්වා අඩුකරගෙන ඇති බවත්, ජ්‍යෙෂ්ඨ නිළධාරී තනතුරුවල පවතින පුරප්පාඩු සම්බන්ධයෙන් ඉල්ලීම්කර ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>මෙම දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරීවරයා උසස්වීමක් ලැබ වෙනත් අමාත්‍යාංශයක සේවයේ යෙදෙන අතරතුර 2018 ජනවාරි මස සිට මෙම දෙපාර්තමේන්තුවේ තාවකාලිකව, වැඩ බලන ගණකාධිකාරීවරයා ලෙස කටයුතුකරමින් සිටීම සම්බන්ධව කාරක සභාව අවධානය යොමු කළ අතර, නව ගණකාධිකාරීවරයකු පත් කිරීමට ඉලිලීම් කර ඇති බවත් , 2019 ජනවාරි මාසයේදී නව පත්වීම ලබා දෙන බව දැනුම් දී ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි පැවසීය. |
| 2. | 2013 අගෝස්තු 07 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශයන්ට අනුව කෝවිල්වලට ආධාර ලබා දීමේ දී සලකා බැලිය යුතු නිර්නායක ඉදිරිපත් කිරීම. | කෝවිල්වලට ආධාර ලබා දීමේදී සලකා බැලිය යුතු නිර්ණායකයන් හයක් ඇතුලත් පස් අවුරුදු සැලැස්මක් දියත් කර ඇති බවද, සම්පූර්ණ සැලැස්ම උදෙසා රු.මිලියන 1200ක් අවශ්‍යාව ඇතත් වාර්ෂිකව අයවැය හරහා වෙන් කරනුයේ රු.මිලියන 80ක් බැවින් එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම දුෂ්කර බවද ප්‍ර.ග.නි/ග.නි. ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | අපේක්ෂිත අරමුදල් ලැබෙන තුරු සැලසුම තාවකාලිකව අත්හිටුවන බවත්, දැනට ක්‍රියාත්මක සාමාන්‍ය ක්‍රියාපටිපාටියට අනුව කෝවිල්වලට ආධාර ලබා දෙන බවත් මෙහිදී හෙලිවිය. මේ සම්බන්ධව වාර්තාවක් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි. වෙත කාරක සභාව නියම කළේය. |
| 3. | හින්දු සංස්කෘතික අරමුදලෙහි විෂය පථය හා ඒ සම්බන්ධ අයවැය ලේඛන සැකසීම | මෙම අරමුදල හින්දු දහම් පාසල් සංවර්ධනය උදෙසා පමණක් ක්‍රියාත්මක බවත්, 2016 වර්ෂය අවසන් වන තුරු අරමුදල් රැස් නොකිරීම හේතුවෙන් අයවැය සැකසීමේ දුෂ්කරතා පැවති බවත් ප්‍ර.ග.නි./ග.නි පැවසීය.<br><br>2018 විගණන විමසුමට අනුකූලව අයවැය ලේඛනය ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට දැනුම් දුන් බවත් දැනට අරමුදල් රැස්කිරීම ආරම්භව පවතින බැවින් මීළඟ වර්ෂයන්ට අදාළව නියමිත කාලසීමාව තුළ අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත් ප්‍ර.ග.නි./ග.නි පැවසීය |
| 4. | හින්දු සංස්කෘතික අරමුදල් පනත ක්‍රියාත්මක කිරීම | 1985 අංක 31 දරණ හින්දු සංස්කෘතික අරමුදල් පණතට අනුව 2016 වර්ෂයේ සිට අරමුදල් රැස් කිරීම ආරම්භ කළ බවත්, 2016 වර්ෂයේ දී රු.මිලියන 3.7ක් හා 2017 වර්ෂයේ දී රු.මිලියන 11.7ක් රැස් කළ බවත් ප්‍ර.ග.නි/ග.නි. පැවසීය.<br><br>යුද්ධ කාල සීමාව තුළ උතුරු නැගෙනහිර ප්‍රදේශ තුළ විනාශ වු , නැවත නවීකරණය කළ යුතු හින්දු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | කෝවිල් 1600ක් අතරින් සම්පූර්ණයෙන් විනාශ වූ කෝවිල් ප්‍රමාණය 830 ක් ඇති බවද විනාශ වූ කෝවිල්වලට අයවැය හරහා ලබා දෙන අරමුදල් ප්‍රමාණය සීමිත බවද ප්‍ර.ග.නි/ ග.නි. පවසන ලදි.<br><br>එසේම පානදුර කෝවිලෙන් ලැබෙන අධාර මෙන්ම විශේෂයෙන් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ මුරුකන්ඩි පිල්ලෙයාර් කෝවිලට ලැබෙන ආධාර මුදල් (මාසිකව රු.500,000/-) එම ප්‍රදේශය තුළ යුද්ධයෙන් විනාශ වූ කෝවිල් සංවර්ධනය උදෙසා යොදවන බවද පැවසීය.<br><br>හින්දු සංස්කෘතික අරමුදලෙහි විෂය පථය පුළුල්කිරීම හරහා වැඩි අරමුදල් ප්‍රමාණයක් රැස්කර ගැනීමට හා එම අරමුදල විවෘතව තබා ගැනීම කෙරෙහි කාරක සභාව සිය අවධානය යොමු කළේය. |
| 5. | 2016 දෙසැම්බර් 31 දිනට රජයේ නිළධාරීන්ට අත්තිකාරම් ගිණුමේ අයවීම් හිඟහිට තිබුණු රු.86,931/-ක් වූ ශේෂය වර්ෂ 17 සිට වර්ෂ 27 දක්වා කාලපරාසයක් තුළ අයකර ගැනීමට අපොහොසත්ව පැවතීම. | මෙම එක් එක් ණය ශේෂයන් රු.10,000/- වැඩි බැවින් එය කපා හැරිය නොහැකි බවත් ණයකරුවන්ද නිශ්චිතව හඳුනාගත නොහැකි බැවින්, මේ සම්බන්ධව භාණ්ඩාගාරයට දැනුම් දුන් බවත්, භාණ්ඩාගාරය විසින් ඇපකරුවන්ගෙන් එම ණය ශේෂ අයකරගන්නා ලෙස දැනුම්දුන් නමුත් පැරණි ණය ශේෂ සම්බන්ධ ලිපි ගොනු නොමැති වීම හේතුවෙන් එසේ අයකරගැනීම ද දුෂ්කර බවත් ප්‍ර.ග.නි/ග.නි. පැවසීය.<br><br>මෙම හිඟහිටි ණය ශේෂ කපාහැරීමට හෝ නැවත |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | අයකරගැනීමට නිශ්චිත ක්‍රමවේදයක් නොමැති බැවින් සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධව නිරන්තර විගණන විමසුම් ඉදිරිපත් කරන බැවින් භාණ්ඩාගාරයේ විශේෂ අනුමැතිය මත මෙම හිඟහිටි ණය ශේෂ නිරවුල් කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව සොයාබලා ඒ අනුව සුදුසු ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන ලෙස මහා භාණ්ඩාගාරය වෙත කාරක සභාව නියම කළේය. |
| 6. | හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මඟින් පාලනයවන කතරගම සංචාරක නිවාසය සඳහා නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීම හා මේ සඳහා 2015 වසරේදී පෞද්ගලික ආයතනයක් වෙත රු.29,475,632/-ක් ගෙවීම සම්බන්ධව පැවති අඩුපාඩු කිහිපයක් කාරක සභාව හමුවේ අනාවරණය වීම. | මෙම සංචාරක නිවාසයේ නව ගොඩනැගිල්ලේ මුල් ඉදිකිරීම් කටයුතු සිසිර ඉදිකිරීම්කරුවන් විසින් හා එහි සුපරීක්ෂණය ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) විසින් සිදුකළ බවත්, මේ වන විට එහි තිබූ අඩුපාඩු නිවැරදි කර ඇති බවත් ප්‍ර.ග.නි/ග.නි. පැවසීය.<br>මුල් කොන්ත්‍රාත්කරු ගොඩනැගිල්ලේ නව කොටස ඉදිකිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් නව කොටස ඉදිකිරීම කතරගම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැවරූ බවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා නව කොන්ත්‍රාත්කරු අතර ගිවිසුම ඇතිකර ගත් බවත් එහි අධීක්ෂණය එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරියකු විසින් සිදු කරන බවත් ප්‍ර.ග.නි/ග.නි. පැවසීය.<br><br>ගොඩනැගිල්ලේ නව කොටස ඉදිකිරීම හා සම්බන්ධව පැවති අඩුපාඩු යථාතත්වයට පත් කිරීමට අදාළ ජායාරූප සාක්ෂි සහිත |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | වාර්තාවක් සතියක් තුළ කාරක සභාව වෙත එවන ලෙස ප්‍ර.ග.නි වෙත නියම කරන ලදී. |
| **අධ්‍යාපන අමාත්‍යාංශය**<br>**2018 අගෝස්තු 24** | | |
| 1. | ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය පිළිබඳ වර්තමාන තත්ත්වය | දස අවුරුදු ස්ථාන මාරු අදියර තුනම ක්‍රියාත්මක කර අවසන් බවත්, අභියාචනා කටයුතුද මාරු මණ්ඩලද පවත්වා අවසන් බවත් ප්‍ර.ග.නි. සඳහන් කළේය. එහෙත් සමහර දුෂ්කර පළාත්වල මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ගැටළු මතුවී ඇති බැවින් ඒ සඳහා පළාත් සභා සමඟ සම්බන්ධ වෙමින් ගුරුවරුන් හුවමාරු කරගැනීමට කටයුතු සිදු කෙරෙමින් පවතින බවත් සැමට සාධාරණයක් සිදු වන අයුරින් මෙම ප්‍රතිපත්තිය ඉදිරියට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවත් ඔහු වැඩිදුරටත් සඳහන් කළේය. |
| 2. | පාසැල් පද්ධතියේ සිදුවූ අක්‍රමිකතා හා අවිනය ක්‍රියා හේතුවෙන් පාසැල් පද්ධතිය තුළ නොවිසඳී පැවතුණු ගැටළු පිළිබඳ වර්තමාන තත්ත්වය කාරක සභාවේ විමසීමට භාජනය විය. 2018 ජනවාරි 19 දින වන විට විසඳා අවසන් කර නොතිබුණු විනය ගැටළු ප්‍රමාණය 554ක් බව කාරක සභාවේදී අනාවරණය විය. | මෙම ගැටළු නිරාකරණය සඳහා විශාල කාලයක් ගත වීම හා ඒ හේතුවෙන් වෙනත් ගැටළු මතුවීම පිළිබඳව කාරක සභාවේ දැඩි අවධානය යොමු වූ අතර මෙම ගැටළුකාරී තත්ත්වය පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අවධානය යොමු කර පාසැල් පද්ධතියේ සිදු වන අක්‍රමිකතා හා අවිනය ක්‍රියා හේතුවෙන් මතු වී ඇති පැමිණිලි හා ගැටළු නිරාකරණය සඳහා ඇති යාන්ත්‍රණය හා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් රාජ්‍ය සේවා |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | කොමිෂන් සභාවෙන් කැඳවීමට තීරණය කරන ලදී. |
| 3. | විදුහල්පතිවරුන් බඳවා ගැනීම පිළිබඳව වර්තමාන තත්ත්වය කාරක සභාවේ විමසීමට ලක් විය. 2017 දෙසැම්බර් 31 දිනට ජාතික පාසල් 353න් 259ක විදුහල්පති පුරප්පාඩු පැවති අතර, ඒ සඳහා වැඩ ආවරණ කරන පත්වීම් ලබා දී තිබීම. | ජාතික පාසැල්වල විදුහල්පතිවරුන් සඳහා වන නීත්‍යානුකූල පත්කිරීම් සිදුකිරීම සඳහා අයදුම්පත් කැඳවා ඇති බවත් 2018 සැප්තැම්බර් මස අදාල අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සිදු කිරීමට නියමිත බවත් ප්‍ර.ග.නි. පැවසීය. |
| 4. | ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුව ජාත්‍යන්තර පාසැල් අධීක්ෂණය කිරීම අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණු අතරින් එකක් වුවත් ඒ පිළිබඳ වැඩපිළිවෙළක් මෙතෙක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම හා ජාත්‍යන්තර පාසැල්වල සිසුන් වර්ෂය අතරමැදදී රජයේ පාසැල්වලට ඇතුළත් කිරීම සම්බන්ධයෙන් නව චක්‍රලේඛයක් නිකුත් කර නොතිබීම. | ජාත්‍යන්තර පාසැල් නියාමනයට මෙතෙක් තම අමාත්‍යාංශයට බලතල නොතිබූ බව සඳහන් කළ ප්‍ර.ග.නි. අගමැතිතුමා ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවකට අනුව එම බලතල ලැබීමට නියමිත බවද, ඒ අනුව ජාත්‍යන්තර පාසැල්වල සියලු කටයුතු අධීක්ෂණයට නියාමන කමිටුවක් හෝ කොමිසමක් පත් කිරීමට යෝජිත බවද සඳහන් කළේය.<br><br>ජාත්‍යන්තර පාසැල්වල ඉගෙනීම මත එම දරුවන් වෙනස්කමකට භාජනය නොවිය යුතු බවත්, හිතකර නියාමනයක් සිදු වීම වැදගත් බවත් කාරක සභාව අවධාරණය කළේය. |
| 5. | පිරිවෙන් නියාමනය ක්‍රමානුකූල කර පිරිවෙන් අධ්‍යාපනය පිරිහීමට බලපා ඇති කරුණු අධ්‍යනය කිරීමේ වර්තමාන තත්ත්වය | පිරිවෙන් අධීක්ෂණය මෙතෙක් සිදු කරනු ලැබුවේ ගරුතර ස්වාමීන් වහන්සේ නමක් බවත්, මේ වන විට පරිපාලන සේවයේ සිවිල් නිලධාරියෙකු මේ සඳහා පත් කර ඇති බවත්, මේ වන විට දිස්ත්‍රික්ක කිහිපයක පිරිවෙන් අධීක්ෂණ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | කටයුතු අවසන් කර බොහෝ අතපසුවීම් හා වැරදි නිවැරදි කරමින් පවතින බවත් ප්‍ර.ග.නි. සඳහන් කළේය. |
| 6. | Sky Management ආයතනය මඟින් නිර්මාණය කර ඇති පරිගණක වැඩසටහනක් පිළිබඳ ඉදිරිපත් කිරීම එම ආයතනයෙන් සහභාගී වූ නිලධාරින් විසින් සිදු කළ අතර මෙය ඔවුන් සමාජමය වගකීමක් ලෙස ස්වෙච්ඡාවෙන් සිදු කළ කාර්යයක් බවද සඳහන් කරන ලදී. මෙමඟින් සියලු ශිෂ්‍යාත්වලාභීන්ගේ දත්ත පද්ධතියක් පවත්වාගෙන යමින් ඔවුන්ගේ බැංකු ගිණුම්වලට මුදල් ගෙවීමේ පහසුකම ඇති බවත්, විදුහල්පතිවරුන්ට එය නියාමනය කිරීමේ පහසුකම් ලබා දී ඇති බවත් ඔවුන් සඳහන් කරන ලදී. | මෙම පරිගණක පද්ධතිය පිළිබඳ පළාත් සභා දැනුවත් කර ඔවුන්ගේ එකඟතාවය ලබාගෙන පළාත් සභා පාසැල් ඇතුළු සියලු පාසැල් සඳහා අමාත්‍යාංශය මඟින් ශිෂ්‍යාධාර ගෙවීමට කටයුතු කරන ලෙස කාරක සභාව නියෝග කරන ලදී.<br><br>මෙම පරිගණක පද්ධතිය 2018 ඔක්තොම්බර් මස 01 දින සිට ජාතික පාසැල් සඳහා ක්‍රියාත්මක කරන ලෙසත්, 2019 ජනවාරි 01 දින සිට සියලු පාසැල් සඳහා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි. හට නියෝග කරන ලදී. |
| 7. | සිසුන්ගේ හා ගුරුවරුන්ගේ තොරතුරු ඇතුළු සියලුම තොරතුරු ඇතුළත් ක්‍රමවත් පරිගණක වැඩසටහනක් නිර්මාණය කිරීම හා ඊට අදාල ඉදිරිපත් කිරීමක් (Power Point Presentation) සිදු කරන ලෙස ලබාදුන් නියෝගය | පරිගණක පද්ධතිය කාරක සභාවේ අගය කිරීමට ලක් වූ අතර සිසුන්ගේ හා ගුරුවරුන්ගේ කාර්ය සාධනය ඇගයීමද පද්ධතිය මඟින් සිදු කිරීමේ හැකියාව සොයා බලන ලෙස කාරක සභාව මෙහිදී යෝජනා කරන ලදී.<br><br>මෙම පරිගණක දත්ත පද්ධතියේ මූලිකාංග, ඉන් සිදුකළ හැකි කාර්යයන්, පද්ධතියට අදාල මානව හා භෞතික සම්පත් කළමනාකරණය සිදු කරන ආකාරය, මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ආකාරය, දත්ත පද්ධතිය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | යාවත්කාලීන කිරීම හා එය අඛණ්ඩව පවත්වා ගෙන යාම ආදී සියලු කරුණු හා දින වකවානු ඇතුළත් කාර්ය සැලැසුමක් 2018 සැප්තැම්බර් 14 දින වන විට කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නියෝග කරන ලදී. |
| **මාතලේ මහනගර සභාව**<br>**2018 සැප්තැම්බර් 06** | | |
| 1. | 2013 වර්ෂයේ සිට අඛණ්ඩ හිඟ ආදායම් පැවතීම හා 2017 වර්ෂයේ රු. මිලියන 76 ක් වන සමස්ථ ආදායමින් රු. මිලියන 32 ක් හිඟ ශේෂයක් ලෙස වාර්තාකර තිබීම. | රාජ්‍ය ආයතන වෙතින් අයවිය යුතු වරිපනම් නිසි කලට නොලැබීම හිඟ ආදායම් වැඩිවීමට හේතුවක් වී ඇති බවත් ඒ අතර සෞඛ්‍ය, ජල සම්පාදන, අධ්‍යාපන සහ පොලීසිය වැනි ආයතන පවතින බවත් ඇතැම් ආයතනවලින් හිඟ මුදල් ලැබී ඇති බවත් ඉතිරි හිඟ මුදල් ද අයකර ගැනීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කළ ප්‍ර.ග.නි./ග.නි. පලපුරුදු නිලධාරීන්ගේ හිඟකම සහ කෙටි කාල පරාසයක් තුල ස්ථාන මාරුවීම් ලබා ගැනීම සභාවේ කටයුතුවලට විශාල බාධාවක් වී ඇති බැවින් එම තත්ත්වයට පිළියමක් ලෙස පලවෙනි ශ්‍රේණියේ ගණකාධිකාරීවරයෙකු නගර සභාවට පත්කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළේය. |
| 2. | 2009 වර්ෂයේ ටෙන්ඩර් මත ලබා දී තිබූ සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩකාමර බදුකරුවන් 14 දෙනෙකුගෙන් එකවර ගෙවීමේ ගාස්තු (Key Money) අය නොවීම නිසා සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවති රු.18,860,263/- | කලින් හිඟ මුදල් අයකර ගැනීමේ ප්‍රමාදයක් පැවතියත් පවතින ගැටළු විසඳා ගනිමින් මෙම වර්ෂය අවසානයට පෙර එය නිරාකරණය කළ හැකි බව ප්‍ර.ග.නි/ ග.නි ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | ක හිඟ මුදල අයකර ගැනීමේ ප්‍රගතිය | |
| 3. | 2016 වර්ෂයේ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ රු. 10,000,000/- ප්‍රතිපාදනය සහ ඉතිරිය සභා අරමුදලින් දැරීමේ ඒකාබද්ධත්වය මත ක්‍රියාත්මක කළ වාහන අංගනය 2018 අගෝස්තු 30 වන විටත් නිෂ්කාර්යව පැවතීම. | අමාත්‍යාංශ මූල්‍ය ප්‍රතිපාදන මත ඉදිකර තිබෙන මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු දැනට නැවතී තිබුණත් මෙම වසරේ ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර ඇති බැවින් යළි මිල ගණන් කැඳවීමෙන් පසුව එහි කටයුතු ආරම්භ කිරීමට අදහස් කර ඇති බව ප්‍ර.ග.නි/ග.නි. පැවසීය. |
| 4. | 2012 වර්ෂයේ ප්‍රදේශයේ කඩ හිමියන්ගේ සහ සභා අරමුදලින් රු.796,500/- ක් වැය කොට ඉදිකරන ලද ඝන මීටර් 44 ක ධාරිතාවයෙන් යුතු ජීව වායු ඒකකය සහ 2015 වර්ෂයේ විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයේ රු.3,200,000/- ක ප්‍රතිපාදන මත ඉදිකළ ඝන මීටර් 50 ක ධාරිතාවයෙන් යුත් ජීව වායු ඒකකය 2018 අගෝස්තු 30 වන විටත් නිශ්කාර්යව පැවතීම. | නගරයේ මස් වෙළඳසැල් හිමියන්ගෙන් මුදල් එකතු කර සකස් කළ ඝන මීටර් 44 ක ජීව වායු ඒකකය සහ බලශක්ති අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ඉදිකරන ලද ඝන මීටර් 50 ක ජීව වායු ඒකක දැනට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින බවත් තාක්ෂණික ක්‍රියාකාරිත්වය පිළිබඳව අවබෝධයක් ඇති අයෙකු සොයා ගැනීමේ දුෂ්කරතාවය ඊට හේතුව වී ඇති බවත් ග.නි. ප්‍රකාශ කළේය. |
| 5. | 2018 අගෝස්තු 30 වන විටත් නිෂ්කාර්යව පැවති ඩෝල කොම්පෝස්ට් ව්‍යාපෘතිය. | මෙම කොම්පෝස්ට් ව්‍යාපෘතිය නගරය මධ්‍යයේ පිහිටුවා තිබීම නිසා එයින් නික්මෙන දුගඳ නගරය පුරා විහිදී යාම නාගරිකයන්ට ගැටළුවක් වී ඇති බැවින් දැනට මෙහි දිරා නොයන කසළ පමණක් එකතුකර යලි ආරම්භ කිරීමට කටයුතු කරන බව ග.නි. පැවසීය. |
| 6. | වසර 15 ක් පැරණි කෘතිම තණ නිල්ල නිසා ක්‍රීඩා කිරීමට නොහැකිව පවතින ජාත්‍යන්තර හොකී ක්‍රීඩාංගනය | මේ සම්බන්ධයෙන් ගරු අගමැතිතුමාගේ අවධානය යොමුකර ඇති බවත් ඊට අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමෙන් පසු නවීකරණ කටයුතු ආරම්භ කිරීමට |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | අදහස් කර ඇති බවත් ප්‍ර.ග.නී./ග.නී. පැවසිය. |
| 7. | 2015 වර්ෂයේ මාතලේ දුම්රිය බඩු ගබඩාවේ පොදු වෙළඳපලක් ඉදිකිරිමේ කටයුතු ආරම්භකර තිබුණු අතර එය 2018 අගෝස්තු වන විට අඩක් නිමි තත්ත්වයේ පැවතිණි. එසේම 2018 ජුනි 08 දිනට හිඟ බදු කුළිය ඇතුළුව රු. 1,035,000/- ක් දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවා තිබු නමුත් බදු ගිවිසුමකට එළඹ නොතිබුණි. එහි වර්තමාන තත්ත්වය. | මෑතකදි දුම්රිය දෙපාර්තමේන්තුව විසින් මෙහි මාසික කුලිය රු. 70,000/- දක්වා වැඩිකර ඇති බැවින් වෙළඳසැල්වලින් දැනට දිනකට අයකරන රු. 100/-ක කුළී මුදලින් ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවන බැවින් ඉදිරියේදි තක්සේරුව වටිනාකම වැඩිකර දිනකට රු.1000/- බැගින් අයකිරීමට අදහස් කර සිටින බවත් මාතලේ නගරය පුරා විසිරී සිටින සියලු මස් කඩ මෙහි ස්ථානගත කර වැඩි ආදායමක් උපයාගත හැකිවන අයුරින් සකස් කරන බවත් ප්‍ර.ග.නි./ ග.නි. පැවසීය. |
| 8. | දේශිය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගත් රු.119,230,940/- ක මුදල වැයකර 2014 වර්ෂය වන විට ඉදිකර තිබූ මහල් 4 සමන්විත සුපිරි වෙළඳ සංකීර්ණයේ වර්තමාන තත්වය | නිසි සැලසුමකින් තොරව ඉදිකර තිබූ මෙම සුපිරි වෙළඳ සංකීර්ණයට වාහන නැවතුම් ස්ථානයක් නොතිබිම විශාල අඩුපාඩුවක් වූ බැවින් පළාත් මහ ඇමතිවරයා ද දැනුවත් කර ආදායම් ඉපැයිය හැකි ආකාරයට එය සකස් කිරීමට වැඩ පිළිවෙලක් සකසා ඇති බව ප්‍ර.ග.නි./ ග.නී. පැවසීය.<br><br>පළාත් පාලන ආයතනවල වැඩ අවසන් කර නොමැති මෙවැනි ව්‍යාපෘති පිළිබඳව නිතර නිතර විගණන විමසුම් ඉදිරිපත් කෙරෙන බැවින් ඒවා පිළිබඳව නිසි අධ්‍යනයක් සිදුකර එම ව්‍යාපෘති අවසන් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කරන ලෙස පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්වරයාට කාරක සභාව නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 9. | මහ නගර සභාවට අයත්ව තිබුණු දියබුබුලේ පිහිටි ඉඩම පොලිස් ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2005 වර්ෂයේ දී පොලිස් දෙපාර්තමේන්තුවට පවරා දී ඇතත් ඒ වෙනුවට පැරණි පොලිස් ස්ථානය පිහිටි ඉඩම නගර සභාවට මෙතෙක් පවරා නොදීම සහ පොලිස් නිලධාරීන්ගේ පදිංචිය සඳහා මහ නගර සභා අරමුදලින් රු. 510,000/- ක වැයකර කුලී පදනම මත ලබාගත් නිවාස 4 ක් ප්‍රයෝජනයට නොගෙන පැවතීම. | නගර මධ්‍යයේ පිහිටා ඇති ඉහළ වටිනාකමකින් යුත් මෙම ඉඩමේ භුක්තිය ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් මහ නගර සභාවට භාරදීමට කටයුතු කර ඇතත් ප්‍රාදේශීය ලේකම්වරයා එය නිරවුල් කිරීමට කටයුතු නොකිරීම නිසා තවදුරටත් එය පොලිසිය භාරයේ පවතින බැවින් ඒ පිලිබඳව නීතිය හා සාමය පිලිබඳ ගරු අමාත්‍යතුමා සහ පොලිස්පතිවරයාගේ අවධානය යොමුකරවීමට අදහස් කර සිටින බව ප්‍රකාශ කළ ප්‍ර.ග.නි./ග.නි. නාගරික සංවර්ධන අධිකාරිය හා එක්ව නාගරික මධ්‍යස්ථානයක් සහ රථ ගාලක් ඉදිකිරීමට සැලසුම් කර ඇති බැවින් ගිණුම් කාරක සභාව හෝ මැදිහත්ව මෙම ගැටලුව විසඳා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේය.<br><br>මෙම ඉල්ලීම සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු වූ බැවින් අදාළ ඉඩම නිරවුල් කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාළ පාර්ශ්වයන් වෙත දන්වා යැවීමට කටයුතු කරන ලෙස කාරක සභා ලේකම්ට නියෝග කළේය. |
| 10. | 1988 වර්ෂයේදි නාගොල්ල පිහිටි ඉඩමේ බිම් කොටස් 11 ක් පුද්ගලයින් දසදෙනෙකුට විධිමත් බදු ගිවිසුමකට එළඹීමකින් තොරව වරිපනම් අංක ලබාදී රු. 446,117/- ක මුදලකට බදු දී තිබීම සහ වර්තමාන තක්සේරු වටිනාකම වන රු.75,000/- මත | හිටපු නගරාධිපතිවරයා විසින් ඉතා අඩු වටිනාකම් මත බදු දී තිබූ මෙම බිම් කොටස් වල වර්තමාන වටිනාකම තක්සේරු කරන ලෙස දෙපාර්තමේන්තුවෙන් කළ ඉල්ලීමට ප්‍රතිචාර ලෙස 1989 සැලසුම පදනම් කර ගනිමින් බිම් කොටසක් සඳහා රු. 75,000/- ක වටිනාකම ලබාදී ඇතත් 2011 නව සැලස්මට අනුකූලව තක්සේරුව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | බදු කුලී අයකර ගැනිමට කටයුතු නොකිරිම. | යළි සිදුකරන ලෙස 2017.12.21 දිනැති ලිපිය මගින් දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇති බවත් ඒ පිළිබඳ සිහිකැඳවීමක් 2018 වර්ෂයේදි කර ඇති බවත් ප්‍ර.ග.නි./ග.නී. පැවසිය. |
| 11. | මාතලේ එම්.සි.පාරේ පිහිටි හිස් ඉඩම් කැබලි 103, විජය මාවතේ ඉඩම් කැබලි 16 සහ හිග්ගොල්ල සැක්ෂන් පාර්ක්හි අක්කර 2 පර්චස් 14 ක ඉඩමේ අනවසර පදිංචි කරුවන් සම්බන්ධයෙන් මෙතෙක් ක්‍රියාමාර්ග නොගැනීම සහ එම්.සි.පාරේ ඉඩම සම්බන්ධයෙන් පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2016.10.05 දිනැති ලිපියට නිරික්ෂණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබිම. | මහ නගර සභා ආඥාපනතට අනුව ගරු ජනාධිපතිවරයාගේ අනුමැතිය සඳහා එය යොමුකර ඇති බවත් මෙම ඉඩම එහි පදිංචි කරුවන් වෙත ලබාදීම සඳහා සභාවේ අනුමැතියද ලැබි ඇති බවත් ඉදිරියේදි නියමිත බදු මුදල් අයකරගෙන ඒවා ලබාදීමට කටයුතු කරන බව සඳහන් කළ ප්‍ර.ග.නි./ග.නි. සභාවේ අතපසුවීමක් නිසා අමාත්‍යාංශය වෙත නිරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට මේ දක්වා කටයුතු කර නොමැති බව පැවසීය. |
| 12. | වාරියපොලවත්තට කසල බැහැර කිරිම සම්බන්ධයෙන් නගර සභාවට හා මධ්‍යම පරිසර අධිකාරිට එරෙහිව පවරන ලද නඩුව සඳහා 2017.12.31 දිනට රු. 3,515,919/-ක මුදලක් නඩු ගාස්තු වශයෙන් වැයකර ඇති අතර පැවති ජනතා විරෝධයට පිළියමක් ලෙස රු. 2,000,000/-ට මිලදී ගෙන රු. 400,000/- ක ශක්‍යතා සැලසුම් සකස් කර තිබූ මෙම ඉඩමට විධිමත්ව කසල බැහැර කිරීමක් සිදු නොවීම, රු. 4,500,000/- වැයකර ඉදිකර තිබූ ඩෝල පාරේ කොම්පෝස්ට් අංගනය 2018.08.30 වන විටත් නිෂ්කාර්යව පැවතීම සහ පිළිසරු ව්‍යාපෘතිය යටතේ රු. | මානුෂීක හේතූන් මත රෝහල් බලධාරින්ගේ ඉල්ලීමට එකඟ වෙමින් මහ රෝහල ආසන්නයේ ස්ථාපිත කර තිබූ හිග්ගොල්ල කොම්පෝස්ට් අංගනයේ කටයුතු අත්හිටුවා දැමීමට සිදුවූ බවත් වාරියපොලවත්තට කසල වර්ගකර බැහැර කිරිම දැනට සිදුකරගෙන යන බවත් ප්‍රකාශ කළ. ප්‍ර.ග.නි/ග.නි. ඩෝල කොම්පෝස්ට් අංගනයේ කටයුතු ආරම්භ කර ඇති බවද පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | 9,343,457/- ක් වැයකර ඉදිකරන ලද හිග්ගොල්ල කොම්පෝස්ට් අංගනයේ නිෂ්පාදන කටයුතු 2018 ජුනි 15 සිට නවතා දමා තිබීම. | |
| 13. | 2007 වර්ෂයේ සිට පරිසර ආරක්ෂණ බලපත්‍රයක් රහිතව පවත්වාගෙන යමින් තිබූ පල්දෝරු පද්ධතියට බලපත්‍රයක් ලබාගැනිමට 2015.03.24 දින ඉල්ලුම් කර ඇතත් ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව 2018 වර්ෂය තුල අවස්ථා 263 දි ගලි බවුසරය කුලියට ලබාදෙමින් රැස්කර තිබූ මළ අපද්‍රව්‍ය අක්‍රීය තත්ත්වයේ පැවති පල්දොරු පද්ධතිය තුලට හා සභාවට අයත් ඉඩම්වලට විවෘතව බැහැර කර තිබිම පිලිබඳව කාරක සභාවේ අවධානය යොමු විය. | පසුගිය කාලයේ එවැනි මළ අපද්‍රව්‍ය බැහැර කිරිමක් සිදුවී ඇති බව පිලිගත් ප්‍ර.ග.නි./ග.නි. නව පල්දෝරු පද්ධතිය සකස් කිරීමෙන් පසු පවතින ගැටලුවලට විසඳුම් ලැබෙන බවත් එය 2018 දෙසැම්බර් මාසයට කලින් අවසන් කළ හැකි බවත් පැවසීය. |
| | **විදේශ රැකියා අමාත්‍යාංශය**<br>**2018 සැප්තැම්බර් 07** | |
| 1. | විදේශ රැකියා අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර හා ප්‍රධාන කාර්යයන්. | මේ පිළිබඳ ප්‍ර.ග.නි. සිදුකළ පැහැදිලි කිරීමෙන් සෑහීමකට පත්විය නොහැකි බව පවසා අමාත්‍යාංශයට පැවරුණු වගකීම් හඳුනාගෙන ඒවා ඉටු කිරීමට මූලිකවන දැක්මක් නිර්මාණය කළ යුතු බවද එම කටයුතු ඇරඹූ දිනය එය සම්පූර්ණ කළ දිනය ආදිය ඇතුලත් විස්තරාත්මක වාර්තාවක් 2018 නොවැම්බර් 10 දිනට පෙර කාරක සභාවට ලබාදෙන ලෙස ප්‍ර.ග.නි. වෙත නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 2. | මැදපෙරදිග සුරක්ෂා ස්ථානවල රඳවා සිටින ශ්‍රී ලාංකිකයන් ප්‍රමාණය විශාල ලෙස වැඩිවීම. | මේ පිළිබඳ පියවර ගතයුතු වගකිවයුතු නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාව පිළිබඳව කාරක සභාවේ අප්‍රසාදය පළවූ අතර සුරක්ෂා ආයතනවල එක් අයෙකු සිටින කාල සීමාව අනුව නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවව පිළිබඳව යම් අදහසක් ලබාගත හැකි බවද පැවසීය. කෙසේවුවද එම ශ්‍රී ලාංකිකයන් නැවත ගෙන්වා ගැනීමට අවශ්‍ය පියවර වහාම ගතයුතු බවට කාරක සභාව අවධාරණය කළේය. |
| 3. | විදේශ සේවා නියුක්ති කාර්යාංශයට හා අමාත්‍යාංශයට දිනපතා ලැබෙන පැමිණිලි / අභියාචනා සංඛ්‍යාව ප්‍රමාණයෙන් වැඩි අගයක් ගැනීම. | එම පැමිණිලි ඇතුලත්කරන ලද පරිගණක තොරතුරු පද්ධති ක්‍රියාවලිය හා එම පැමිණිලිවල වර්ගීකරණය පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මක් මාස 2ක් තුළ කාරක සභාවට ලබාදෙන ලෙස ප්‍ර.ග.නි. වෙත නියෝග කළේය. |
| 4. | ශ්‍රී ලංකාවේ වසරකට අසාධු ලේඛනගත කරනු ලබන පෞද්ගලික විදේශ රැකියා ඒජන්සි ප්‍රමාණය හා අසාධු ලේඛනගත කරනු ලබන නිර්ණායක. | මේ පිළිබඳ පසුගිය වර්ෂ 8හි තොරතුරු ඇතුලත් වාර්තාවක් මසක් තුළ කාරක සභාවට ලබාදෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය. මෙවැනි අවස්ථාවල ආයතනය පමණක් නොව අධ්‍යක්ෂක මණ්ඩලය හා කොටස් හිමියන් ද අසාධු ලේඛනගත කළයුතු බව කාරක සභාවේ අදහස විය. මේ පිළිබඳ අදාළ පනත සංශෝධනය කිරීමට අමාත්‍යවරයා සමග සාකච්ඡාවක් පැවැත්වූ බව ප්‍ර.ග.නි. /ග.නි. පැවසීය. තවද කාරක සභාව විසින් විදේශ රැකියා අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | පද්ධතියේ කාර්යක්ෂමතාවය පිළිබඳ වාර්තාවක්ද මසක් තුළ කාරක සභාවට ලබාදෙන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කළේය. |
| 5. | අමාත්‍යාංශය විසින් මෙහෙයුම් කල්බදු ක්‍රම යටතේ ඩබල් කැබ් රථ 05ක් ප්‍රසම්පාදනය කර මාස 10ක කුලිය ලෙස 2017 වර්ෂයේ රු. 7,956,850/-ක් ගෙවා තිබීම. | 2016/03/17 දිනැති අංක 01/2016 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1 ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම් සහභාගිත්වය දරන කමිටුවක් මගින් වාහන අවශ්‍යතාවය සමාලෝචනය කළ යුතු වුවද, සභාපතිත්වය ලේකම්වරයා දරා නොතිබුණු අතර කමිටු වාර්තාව ලැබීමට පෙර භාණ්ඩාගාර අනුමැතිය ලැබී තිබුණි. මේ පිළිබඳ අදාළ ක්‍රියාවලිය නිවැරදිව සිදු නොවීම නිසා ඇතිවී ඇති ගැටළුකාරී තත්වය පිළිබඳ කාරක සභාවේ අවධානය යොමුවූ අතර මෙවැනි ගැටළු ඇති නොවීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දීමේ වැදගත්කම අවධාරණය කළේය. |
| 6. | ශ්‍රී ලංකා රජය සහ ස්විට්සර්ලන්ත රජය එක්ව 2010 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරමින් පවතින "යහපත් රැකියා ශ්‍රම විගමණිකයන්ගේ සහ ශ්‍රී ලංකාවේ සිටින ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාව සහ යහපැවැත්ම" නංවන වැඩසටහන. | මෙම වැඩසටහනහි 2014 වර්ෂයේ දී ආරම්භ කළ දෙවන අදියරට ස්විස්ටර්ලන්ත රජයෙන් ඇ.ඩො. 3,875,000 ක ආධාර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ලැබිය යුතු වුවද දැනට රජ්‍ය නොවන සංවිධානයක් හරහා ලැබීම පිළිබඳ කාරක සභාව සිය අවධානය යොමු කළේය.<br>මෙය අදියර කිහිපයක් යටතේ සිදුවන අතර පළමු අදියරට අමාත්‍යාංශය හරහා නොමැතිව ජාත්‍යන්තර කම්කරු සංවිධානය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | සමග සෘජුවම අරමුදල් ලබාදී ඇති බව හා 2 වන අදියරේදී අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමේදී එහි පැහැදිලිව සඳහන් වී ඇත්තේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා අරමුදල් ලබාදිය යුතු බව වුවත් ගිවිසුමේදී එම කොන්දේසිය ඉවත්කර තිබීම මත නැවතත් පෙර පරිදිම සෘජුවම අරමුදල් ලබා දී ඇති බව ප්‍ර.ග.නි. පැවසීය.<br><br>කෙසේවුවද මෙහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය ලබා ගෙන මෙම ක්‍රියාවලිය අමාත්‍යාංශයේ ව්‍යාපෘති උපදේශන කමිටුව මගින් 2017 හා 2018 වර්ෂවලදී අධීක්ෂණය කරමින් පවතින බවද ප්‍ර.ග.නි. වැඩිදුරටත් පැවසීය. මේ පිළිබඳ අමාත්‍යවරයා දැනුවත් කර අමාත්‍ය මණ්ඩලයට දන්වන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නියෝග කළේය. |
| 7. | 2016 නොවැම්බර් 09 දිනැති අංක අපම/16/2048/741/011 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රජයේ කඩිනම් සහන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කල යුතු විගමණික සේවකයන් සඳහා වූ විශ්‍රාම වැටුප් ක්‍රමයට අදාළ පනත.<br><br>මෙය 2018 අගෝස්තු 30 දින වන විටත් අනුමැතිය සඳහා ඉදිරිපත් කර නීතිපති දෙපාර්තමේන්තුවේ පැවතීම හා මෙහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය. | මේ සඳහා ඇති කුවේට් අරමුදල විදේශ රැකියා නියුක්ති කාර්යාංශය යටතේ ඇති බව හා එයට පොළියක් ලැබෙන බවද එම අරමුදලින් ලබාදුන් කොටසක් ආරම්භක ප්‍රාග්ධනය ලෙස යෝජිත විශ්‍රාම වැටුප් ක්‍රමයට යොදා ගෙන ඇති බවද පනත සම්මත වූ පසු එම මුදල මෙම විශ්‍රාම වැටුප් ක්‍රමයට යොදාගන්නා බවද ප්‍ර.ග.නි. පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 8. | විගමනික ශ්‍රමිකයන් පිළිබඳව පවුල් පැතිකඩ නිර්මාණය කිරීම සහ මීට අදාළ තොරතුරු පරිගණක ගත කර දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට හා යාවත්කාලීන කිරීමට අදාළව විධිමත් සැලැස්මක් සහ ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳ අධ්‍යයනයකින් තොරව 2016/2017 වර්ෂවලදී රු. 35,500,959/-ක් වැයකර පරිගණක 277ක් මිලදී ගැනීම හේතුවෙන් වැයකළ පිරිවැයෙන් අපේක්ෂා කරන අරමුණු ඉටු වී නොමැති වීම. | මේ පිළිබඳ මුල් අවස්ථාවේදී අවශ්‍ය පූර්ව ඇගයීම් සිදු කිරීමට පියවර ගැනීමේ දුර්වලතාව කාරක සභාවේ අප්‍රසාදයට ලක්විය. මේ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබුණු බවත් මෙම වසර අවසානයට පෙර මෙම දත්ත පද්ධතිය ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවත් ප්‍ර.ග.නි. පැවසීය. |
| 9. | 2012 වර්ෂයේදී රජයේ තක්සේරුකරු විසින් රු.2,800,000 කට තක්සේරු කර තිබූ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතියද ලද අමාත්‍යාංශයට අයත් වාහනය 2014 වර්ෂය දක්වා අපහරණය කර නොතිබූ අතර නැවත අභ්‍යන්තර කමිටුවක් විසින් රු.400,000කට තක්සේරු කර රු.1,274,900 කට විකිණුවද වාහනයේ ලියාපදිංචි සහතික නොමැතිවීම නිසා ගැනුම්කරු වෙත ආපසු මුදල් ගෙවා තිබුණි. පසුව අපහරණ ක්‍රියාවලිය අවිධිමත්ව සිදුකර තිබුණ අතර ඒ සඳහා වන පුවත්පත් දැන්වීම් වෙනුවෙන් අවස්ථා දෙකකදී රු.170,526 ක් දරා තිබීම හා ලියාපදිංචි සහතික පිටපත් ලබාගෙන 2018 ජූලි 20දින රු.1,365,367කට විකිණීම. | මේ පිළිබඳ අමාත්‍යාංශය මට්ටමින් පරීක්ෂණයක් සිදුකරන ලෙසත් පොලිසියට හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුම්දෙන ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නියෝග කළ අතර මේ පිළිබඳ පරීක්ෂණයක් ආරම්භ කරන බවට ප්‍ර.ග.නි. පොරොන්දු විය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| **බස්නාහිර පළාත් සභාව**<br>**2018 සැප්තැම්බර් 18** | | |
| 1. | අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලයේ ඇතුළත් කළමනාකරණ සහකාර තනතුරු 14 හා අභ්‍යන්තර විගණනයට ඔවුන්ගේ ඇති අවශ්‍යතාවය.<br><br>ආණ්ඩුකාරවරයාගේ දීමනානුගත කළ චක්‍රලේඛයේ කළමනාකරණ සහකාරවරු ඇතුළත් නොමැති හෙයින්, විගණන නිලධාරීන්ට ගෙවනු ලබන දීමනාව ඔවුන්ට ද ගෙවීම. | අභ්‍යන්තර විගණන නිලධාරීන් ලෙස බඳවා ගත් බහුතරයක්, උපාධිධාරී මුල් පත්වීම් ලද අභ්‍යාසලාභීන්වන අතර, රාජකාරී හා විගණන කාර්යයන් අධික බැවින් හා පළපුරුදු නිලධාරීන් විගණනයට අවශ්‍ය වූ බැවින් එවකට සිටි අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) හා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ මත සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව කළමනාකරණ සහකාරවරු බඳවා ගත් බවත්, ඔවුන් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් බවත් ග.නි පැවසූ අතර, මූල්‍ය සීමාවන්ට යටත්ව ගමන් වියදම් හා සංයුක්ත දීමනා ඔවුන්ට ගෙවන බවද පැවසීය. |
| 2. | 2018 ජූනි 30 දිනට ආයතන 02 කට අදාළව පැවති නිරවුල් නොකළ රු. 606,461,812/-ක අග්‍රිම ශේෂය | අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළ රු.2824/- ශේෂය මේවන විට නිරවුල්කර ඇති බවත්, රජය විසින් ගෙවිය යුතු සීමාවාසික වෛද්‍යවරුන්ගේ වැටුප් ගෙවීම් ඇතුළු කරුණු පහකට අදාළ ගෙවීම් රජය වෙනුවෙන් පළාත් සභාව විසින් ගෙවා පසුව සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කරගන්නා නමුත් එසේ දීර්ඝ කාලීනව ප්‍රතිපූර්ණය නොකළ හිඟ මුදල් රු.මිලියන 500ක පමණ ප්‍රමාණයක් ද එම නිරවුල් නොකළ අග්‍රිම ශේෂය තුළ අන්තර්ගත බවත් ප්‍ර.ග.නි/ග.නි. පැවසීය.<br><br>මෙම ගැටළුව සියළුම පළාත් සභාවලට පොදු වූ බැවින් පළාත් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | 09ටම අදාළව මේ සම්බන්ධ තොරතුරු ලබාගන්නා ලෙස ප්‍ර.ග.නි.වෙත කාරක සභාව නියම කළේය. |
| 3. | පළාත් පාලන දෙපාර්තමේන්තුවට අදාළව 2015 වර්ෂයට පෙර සිට පැවත එන පොදු තැන්පත් ගිණුමේ ශේෂයෙහි, දෙපාර්තමේන්තු පොත් අනුව හා පළාත් භාණ්ඩාගාර පොත් අනුව රු.6,122,459/-ක වෙනසක් 2017/12/31 වන තුරුම පැවතීම හා 2018 ජූලි 31 දින වන විටද එයට හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබීම. | මෙම ශේෂයන්ගේ වෙනස දීර්ඝ කාලීනව පවතින ගැටළුවක් බවත් එය නිරාකරණය කිරීම උදෙසා විශ්‍රාමික සහකාර විගණකාධිපතිවරයෙක් පත්කර ඇති බවත් ග.නි.පැවසීය. |
| 4. | 2011 සිට 2017 වර්ෂය අවසානය දක්වා පළාත් සභාවේ අරමුදල් කෙටිකාලීන ආයෝජනවල යොදවා තිබීම. | 2017 වර්ෂය අවසානයේ පැවති රු. මි.6750ක් වූ කෙටිකාලීන ආයෝජනවලින් රු. මි.3075ක් හා රු.මි.750ක පරිපූරක 2018 වර්ෂය තුළදී පළාත් සංවර්ධනය සඳහා යොදවා ඇති බව ග.නි. පැවසීය. |
| 5. | ආදායම් ගිණුම් අනුව 2017/12/31 දිනට ආදායම් සංකේත 12කට අදාළව රු. 2,596,501,783/-ක හිඟ ආදායම් පැවතීම | මෙම මුදලින් රු. මි.28ක හිඟ ආදායම පෞද්ගලික වෛද්‍ය පනත යටතේ ලියාපදිංචි කරනු ලබන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි ගාස්තුවලින් පළාත් සභාවට ලැබිය යුතු 50%ක හිඟ මුදල බව ප්‍ර.ග.නි. /ග.නි. පැවසීය.<br><br>පළාත් ඉඩම් හා සම්බන්ධ රු. මි.2094ක හිඟ ආදායම තුළ අන්තර්ගත ගුවන් විදුලි සංස්ථාවට අයත් රු.මි.1200ක හිඟ මුදල දෝෂසහගත ඇතුළත් වීමක් බව පළාත් ඉඩම් කොමසාරිස්වරිය පැවසීය. ගුවන් විදුලි සංස්ථාව ස්ථාපනය කළ පනත හරහා සියළු චංචල හා නිශ්චල දේපළ සංස්ථාවට පැවරෙන නමුත් 2012 වර්ෂයේදී |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | සභාපතිවරයා ඉඩම සඳහා දිගුකාලීන බද්දක් ඉල්ලුම්කර ඇති අතර එය සංස්ථාවේ දේපළක් බැවින් එසේ බද්දකට යාම අවශ්‍ය නොවන බව කොමසාරිස්වරිය තවදුරටත් පැවසීය.<br><br>මෙම මුදල කපා හැරීමට කටයුතු කරන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි./ග.නි. වෙත නියම කළ අතර ඒ සඳහා කමිටුවක් පත්කර එම මුදල ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව ප්‍ර.ග.නි. පැවසීය.<br><br>මෙම හිඟ ආදායම් ලැබිය යුතු රාජ්‍ය හා පෞද්ගලික ආයතන සහ ඊට අදාළ වර්ෂයන් කවරේද යන්න පිළිබඳ සාරාංශයක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව නියම කළේය. |
| 6. | කොළඹ අධ්‍යාපන කලාප බල ප්‍රදේශයේ ගුරුවරුන්ගේ හා නිලධාරීන්ගේ සමාලෝචිත වර්ෂය අවසානය වන විට පැවති වැටුප් රහිත නිවාඩු සඳහා අයවිය යුතු මුදල්. | සමස්ථ කලාපයේම වැටුප් රහිත නිවාඩු සඳහා අයවිය යුතුය තිබූ මුදල රු. මි.7.7ක් බවත් එය වාරික වශයෙන් අදාළ නිලධාරීන්ගෙන් අය වෙන බවත්, විදේශ නිවාඩු අවසන්ව තිබූ පළාත් පාලන අමාත්‍යාංශයේ පරිපාලන නිලධාරිනියකගෙන් අයවිය යුතු රු.981,000/-ක මුදල ගෙවීමට ඇයද එකඟ වී ඇතිබවත් ග.නි. පැවසීය.<br><br>වැටුප් රහිත නිවාඩු, අත්තිකාරම් මුදල්, අනුමැතියකින් තොරව ලබාගන්නා විදේශ නිවාඩු ආදී පොදු ගැටළු පිළිබඳව සමස්ත පළාත් සභාවටම අදාළව සම්බන්ධීකරණයක් සිදුකරන ලෙස, ග.නි වෙත, කාරක සභාව විසින් දැනුම් දෙනු ලැබීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 7. | ගම්පහ කලාප අධ්‍යාපන බලප්‍රදේශය තුළ අඩක් නිමකර ඇති ගොඩනැඟිලි 61ක් වෙනුවෙන් රු.277,693,238/-ක් වැය කර තිබීම.(2016 වාර්තාව) | ගම්පහ කලාපයේ එවැනි ගොඩනැගිලි 63කට රු. මි.419ක් මේ වසරේ වෙන් කර ඇති බවත් 2018.12.31වන විට නිම කිරීමට නියමිත බවත්, සමස්ත කලාපය තුළ අඩක් නිමි පාසල් 176 සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් රු. මි.1236ක් වෙන් කර ඇති බවත් ග.නි. පැවසීය.<br><br>එවැනි අඩක් නිමි පාසල් ගොඩනැගිලි අවසන් කිරීමට නිශ්චිත වැඩපිළිවෙලක් යෝජනා කර මාසයක් තුළ ඉදිරිපත්කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි.ට නියම කළේය. |
| 8. | ජා ඇල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ රාගම ප්‍රීතිපුර ළමා නිවාසය පිහිටි රජයේ ඉඩමෙන් පර්චස් 156ක කොටසක් දීර්ඝකාලීන බදු පදනම මත 2005 වර්ෂයේ සිට කොළඹ උතුරු නගර ජල සම්පාදන ව්‍යාපෘතියට ලබාගැනීමට ඉල්ලීමක් කර තිබුණද 2018 අගෝස්තුවන විටද එම ඉඩම නිෂ්කාර්යව පැවතීම හා ජල සම්පාදන මණ්ඩලයේ සේවකයින් 2008 වර්ෂයේ සිට අනවසරයෙන් එහි පදිංචිව සිටීම. | මේ පිළිබඳව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ස්ථානීය පරීක්ෂාවක් සිදුකර ඇති බව හා ඊට අදාළ තීන්දුව ප්‍රකාශ කරන තෙක් එම ඉඩමේ අනවසරයෙන් පදිංචි වී ඇති සේවකයා ඉවත් කිරීම තාවකාලිකව නවතා ඇති බව පළාත් ඉඩම් කොමසාරිස්වරිය පැවසීය. |
| 9. | මහර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි පර්චස් 80ක ඉඩමක් 2007 වර්ෂයේ දී බෙටන්ස් ගෲප් සමාගම වෙත වර්ෂ 50කට බදු දී ඇති නමුත් එම ආයතනය එහි ව්‍යාපාර කටයුතු ආරම්භ නොකිරීම නිසා වර්ෂයකට ලැබිය යුතු රු.144,000/-ක බදු ආදායම නොලැබීම හා ඉඩම අවලංගු | රාජ්‍ය දේපළ සන්තකය නැවත ආපසු ගැනීමේ නීතිය යටතේ එම සමාගමට එරෙහිව නඩු ගොනුකර ඇති බව පළාත් ආදායම් කොමසාරිස්වරිය පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | කිරීමට ගත් තීරණය ක්‍රියාත්මක කර නොතිබීම. | |
| 10. | මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මෙට්ල්වුඩ් ඉන්ඩස්ට්‍රිස් හා සන්වෙල් ඉංජිනියරින් (පුද්.) සමාගම් දෙක වෙත 2007 වර්ෂයේ සිට දීර්ඝකාලීන බදු පදනම මත ලබා දී තිබූ ඉඩම් සඳහා 2017 දෙසැම්බර් වන විට පිළිවෙලින් රු.2,994,750/-ක් හා රු.3,872,000/-ක බදු මුදල් ගෙවා නොතිබීම. | මෙට්ල්වුඩ් ඉන්ඩස්ට්‍රිස් (පුද්.) සමාගම රු.300,000 බැගින් වාරික 11ක් ගෙවීමට එකඟ වී ඇති බවත් ඒ සම්බන්ධව අවශ්‍ය උපදෙස් හා සන්වෙල් ඉංජිනියරින් (පුද්.) සමාගම කිසිදු මුදලක් නොගෙවීම සම්බන්ධව අවශ්‍ය අධිකරණමය ක්‍රියාමාර්ග ගැනීමට අදාල උපදෙස් ප්‍රාදේශීය ලේකම්, ඉඩම් කොමසාරිස්ගෙන් විමසා ඇති බව පළාත් ඉඩම් කොමසාරිස්වරිය පැවසීය. |
| 11. | දොඩම්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දොඩම්ගොඩ උතුර ග්‍රාම නිලධාරී වසමට අයත් අක්කර 11 පර්චස් 26ක ඉඩම ගල්ලෙනයාලන්ද නැමති ඉඩම් බදුකරු විසින් බදුගෙන ව්‍යාජ ඔප්පු සකස්කර පුද්ගලයන් 20දෙනකුට විකුණා තිබීම. | මේ පිළිබඳව පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය විසින් සිදුකළ ස්ථානීය පරීක්ෂණයට අනුව, 1987/10/19 දින දරණ පැවරුම්කරණය රජයට භාරගෙන එය අවලංගුකර එහි පදිංචිකරුවන්ට 2008 චක්‍රලේඛය අනුව ඉඩම් කච්චේරි ක්‍රමයට ලබාදීමට අදාළ නිර්දේශය ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාට ඉදිරිපත්කර ඇති බව පළාත් ඉඩම් කොමසාරිස්වරිය පැවසීය.<br><br>මෙම සිදුවීමට අදාල අනුමැතිය හා අනුමැතිය දුන් කාලයද එම ඉඩම විකිණීම හා සම්බන්ධ තොරතුරුද ඇතුළත් විධිමත් වාර්තාවක් මාසයක් තුළ කාරක සභාවට ඉදිරිපත්කරන ලෙස කාරක සභාව නියම කළේය. |
| 12. | බස්නාහිර පළාතේ ආගමික ස්ථානවල පවත්වාගෙන යන දහම් පාසල් සඳහා පොදු පහසුකම් | මෙම සමස්ත ඇස්තමේන්තුව පිළිබඳ වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත්කරන ලෙස කාරක සභාව විසින් ග.නි.වෙත නියම කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | සැලසීමේ "සරුදම් අරුණැල්ල" ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා රු.261,114,300/-ක මුදලක් අධිකාරියට ලැබී තිබුන අතර එහි ප්‍රචාරණ හා සංග්‍රහ කටයුතු සඳහා රු.මි.16ක වියදමක් දරා තිබීම. | |
| 13. | 2010 වර්ෂයේ ඉදිකිරීම ආරම්භ කර තිබූ මීගමුව ඒත්තුකාල වෙරළ උද්‍යානය වෙනුවෙන් 2015 අවසාන වන විට රු.165,921,430/-ක වියදමක් දරා තිබීම සහ මෙම ජල ක්‍රීඩාංගනය 2017 මැයි 17 දින බදු දී තිබූ නමුත් බදුකරු ගිවිසුම් ප්‍රකාරව බදු මුදල් නොගෙවීම හේතුවෙන් බදු ගිවිසුම අවලංගුකර ඇති නමුත් බදුකරු 2018 අගෝස්තුවන වන විටද එහි ආදායම් උපදවමින් සිටීම. | ඔහුගේ භුක්තියෙන් ඔහු ඉවත් කිරීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව හා ඔහුගේ ඇපකර මුදල් ලක්ෂ 50 ස්ථාවර තැන්පත්කර ඇති බවත් මේ සම්බන්ධව පාඩුවක් නොවීමට ක්‍රියාකරන බවත් ලේකම්වරිය පවසන ලදි. |
| 14. | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2012 වසරේදී රු.මි.158ක් වියදම්කර මිලටගත් කොන්ක්‍රීට් ඇතුරුම් යන්ත්‍ර දෙකක් සහ රු.මි.6ක් වටිනා කර්බ් යන්ත්‍රය 2014 නොවැම්බර් වන විටද මාර්ග ඉදිකිරීම සඳහා යොදා නොගැනීම. | එම යන්ත්‍රය භාවිතයෙන් රු.මි.194ක පළාත් සභා පාරවල් කාපට් කර ඇති බවත්, 2018 වර්ෂයේදී රු.මි.17.5ක පාරවල් කාපට් කිරීමට අනුමත කර ඇති බවත්, මෙම යන්ත්‍රය භාවිතය සඳහා මාර්ගයක පළල මීටර් 4.2ක් වත් විය යුතු බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය.<br><br>මෙම යන්ත්‍රය ප්‍රයෝජනයට ගන්නා බව සනාථ කරමින් වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසත් හැකිතාක් දුරට මෙම යන්ත්‍රය ප්‍රයෝජන ගන්නා ලෙසටත් නියෝග කරන ලදි. |
| 15. | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සේවය කළ ශ්‍රී ලංකා | 1987 අංක 42 දරණ පළාත් සභා පණතේ 32 වගන්ති ප්‍රකාරව ගරු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරිනියකට 2007 වර්ෂයේ සිට පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණිය හා ඊට හිමි වැටුප් ගෙවා තිබීම. | ආණ්ඩුකාරතුමා විසින් පුරප්පාඩු වූ තනතුරක් පිරවීමට එම තනතුරෙහි පිහිටුවා ඊට අදාල වැටුප් තලය දී ඇති බව හා එය උසස්වීමක් නොවන බව ග.නි. පැවසූ අතර, මෙම ගැටළුව නිරාකරණය උදෙසා නීතිපති උපදෙස් ලබාගන්නා ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි. වෙත නියම කළේය. |
| 16. | කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස් ලෙස කටයුතු කළ නිලධාරිනියකට අදාළ විනය පරීක්ෂණය 2018 අගෝස්තු වන විටත් සිදුකර නොමැති බව හා පළාත් සභා අරමුදලින් වැටුප් හා දීමනා ගෙවන බවත් 2015 වර්ෂයේදී ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත අනුයුක්ත කර ඇති මෙම නිළධාරිනියට බස්නාහිර පළාත් සභාව තුළ තනතුරක් ලබා දී සේවයක් ලබා ගෙන නොතිබීම. | එම නිළධාරිනියට එරෙහි විනය පරීක්ෂණය පවත්වා ආණ්ඩුකාරවරයා විසින් ප්‍රධාන ලේකම් කාර්යාලයට අනුයුක්ත කර ඇති බවත්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලයෙන් මූලික විමර්ශනය සිදුකර චෝදනා පත්‍රය ලබා දී 2016.11.02 රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යවා ඇති බවත් එම පරීක්ෂණය තවමත් සිදුවන බව හා, ඇය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරා ඇති හෙයින් අධිකරණ නියෝගය මත සේවයේ අනුයුක්ත කර ඇති බවත් ප්‍ර.ග.නි/ ග.නි. පැවසීය. |
| 17. | 2011/12/19 දිනැති අංක PCMD1/4/23/4/4 දරන රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජනාධිපති කාර්යාලයේ ලිපියට අනුව ප්‍රධාන අමාත්‍යවරයාගේ කාර්යය මණ්ඩලය 15කට සීමා වියයුතු වුවත්, 2016 වර්ෂයේ දී කාර්ය මණ්ඩලය 45ක්ව පැවතීම. | අමාත්‍යවරයාගේ අනුමත කාර්ය මණ්ඩලය 26ක් බවත් එම අනුමත කාර්ය මණ්ඩලයට පමණක් වැටුප් ගෙවන බව හා අතිරේක සේවකයන් 15දෙනා පළාත් සභාවේම නිලධාරීන් සේවයේ අනුයුක්ත කිරීමක් පමණක් බව ප්‍ර.ග.නි/ ග.නි. පැවසීය. |
| 18. | ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අක්කර 35 රූඩ් 05 පර්චස් 59ක් වූ LL 89 දරන බදු ඉඩමේ අක්කර 24ක ප්‍රමාණයක් | ප්‍රාදේශීය සභාවෙන් මේ පිළිබඳ විමසා ඉඩම වෙන්දේසිය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන මෙන් පළාත් ඉඩම් කොමසාරිස්වරිය වෙත කාරක සභාව නියම කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | බදුකරු විසින් ව්‍යාජ ඔප්පු සකසා වෙන්දේසි කර තිබීම. | |
| 19. | බලගල ග්‍රාම නිලධාරී වසමේ අක්කර 4 රූඩ් 1 පර්චස් 18ක , කෘෂිකාර්මික කටයුත්තක් සඳහා 1997 වසරේ දී බදු දුන් රජයේ ඉඩම් කොටසක් වාණිජ කටයුතුවලට යොදා ගැනීම හේතුවෙන් ඊට අදාළ බදු ගිවිසුම 2016.12.09 දින අවලංගුකර තිබීම. | බදුකාරිනිය විසින් මෙහි ඉදිකර ඇති නිවාස වෙනුවෙන් භුක්තිය හා අතුරු බදු දී ඇති බදුකරුවන්ට දීර්ඝකාලීන බදු ලබා දෙන මෙන් ඉල්ලා සිටින බවත්, ප්‍රාදේශීය ලේකම් විසින් බදු අනුමැතිය අවලංගු කිරීමට නිර්දේශ කර ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දී ඇති බවත් පළාත් ඉඩම් කොමසාරිස්වරිය පැවසීය.<br><br>මේ සම්බන්ධ වාර්තාවක් ඉදිරිපත් කරන මෙන් ප්‍ර.ග.නි/ග.නි වෙත කාරක සභාව නියම කළේය |
| 20. | අක්කර 25කින් සමන්විත කරදියාන අපද්‍රව්‍ය රැස්කිරීමේ අංගනයේ අපද්‍රව්‍ය කසළ දියර බොල්ගොඩ ඇලට එකතුවීමේ ප්‍රවණතාවක් පැවතීම හා ඒ සම්බන්ධ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම. | මෙහි වර්තමාන තත්වය පිළිබඳ පරිසර අධිකාරියෙන් වාර්තාවක් ලබා ගන්නා ලෙස කාරක සභාවේ ලේකම්වරිය වෙත නියෝග කළේය. |
| 21. | 2007 වර්ෂයේ දී රු.3,726,236කට ආනයනයකර පරිපාලන වියදම් වශයෙන් රු. 2,973,918/-ක් ද වැය කරන ලද නමුත් ප්‍රයෝජනයට නොගත් අත් කඩදාසි නිෂ්පාදන යන්ත්‍රයක් 2013 වර්ෂයේ දී කොළොන්නාව නගර සභාවට භාර දී ඇති බවත්, 2017 වර්ෂයේ දී මෙම යන්ත්‍රය මීතොටමුල්ල කුණු කන්දට යටවීමෙන් විනාශ වී ඇතිබව හා ඒ සම්බන්ධ විධිමත් පරීක්ෂණයක් 2018 වන විටද සිදුකර නොතිබීම. | මේ පිළිබඳව පළාත් ගිණුම්කාරක සභාවේ නියමය පරිදි 2017.05.31 මූලික පරීක්ෂණය සිදුකළ බවත් 2018.12.07 දිනට ප්‍රථම පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරන බවට අදාල කමිටුව ප්‍රකාශකර ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 22. | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ මාර්ග බලපත්‍ර නිකුත් කිරීම හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | බස්රථවලට අදාළ බලපත්‍ර නිකුත් කිරීමේ දී අධිකාරියේ සභාපතිවරයාගේ මූලිකත්වයෙන් යුත් බලපත්‍ර කමිටුවක් හරහා අවම ලංසු මුදල තීරණය කරන බවත්, අවශ්‍ය සේවා ප්‍රමාණයට ආයෝජකයන් නොමැති වීමෙන් ටෙන්ඩර් කොන්දේසිවල 8.3 වගන්ති ප්‍රකාරව පසුව ඉදිරිපත් වන ආයෝජකයන්ට අවම ලංසු මුදලට 10%ක් එකතු කර සේවා අවශ්‍යතාවය අනුව බලපත්‍ර නිකුත් කරන බවත් මෙහිදී අනාවරණය විය.<br><br>මේ සම්බන්ධ ගැටළු ගණනාවක් ඉදිරිපත්ව ඇති හෙයින් වඩා සුපරික්ෂාකාරීව කටයුතුකරන ලෙස කාරක සභාව අවධාරණය කළේය. |
| 23. | පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට භුක්තිය පමණක් හිමි අක්කර 10 රූඩ් 01 පර්චස් 23.71ක ප්‍රදේශයක නෛතික හිමිකාරිත්වයක් නොමැති පිරිස් දීර්ඝකාලීනව පදිංචිව සිටීම. | දැනට එහි මැනුම් කටයුතු කර ඇති හෙයින් ප්‍රාදේශීය ලේකම් හරහා එම පදිංචිකරුවන්ට නියමානුකූලව ඉඩම් ඔප්පු පවරා දී ඉතුරු ඉඩම් අධිකාරියට ලබාගැනීමට ක්‍රියාකරන ලෙස කාරක සභාව උපදෙස් දෙන ලදි. |
| 24. | පළාත් සභාව ආරම්භයේ සිට පැවති වාර්ශික මුදල් ප්‍රකාශයට 2009 වර්ෂයේ දී කරන ලද සංශෝධනය අනුව මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා ආර්ථික ප්‍රවර්ධන යන විෂයන් ප්‍රධාන ලේකම්වරයාට පවරා දී තිබීම හා පළාත් භාණ්ඩාගාරයේ ලේකම් වශයෙන් ඔහු පළාත් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව නියෝජනය කරන | ගරු ආණ්ඩුකාරවරයාගේ සහ අමාත්‍යමණ්ඩලයේ උපදෙස් මත ඉදිරියේදී මේ සම්බන්ධව කටයුතු කරන බව ප්‍ර.ග.නි. පැවසීය.<br><br>අනෙක් පළාත් සභාවල මේ සම්බන්ධ තත්ත්වය හා ඊට අදාල නීතිමය තත්ත්වය සොයා බලා ගැටළුවක් ඇතිනම් නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි. වෙත කාරක සභාව නියම කළේය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | බැවින් අමාත්‍ය මණ්ඩල රැස්වීම් මෙහෙයවීම සහ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවලට අත්සන් තබා තිබීම. | |
| 25. | පළාත් සභාවට අයත් මාර්ග ගැසට් කිරීම. | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත අනුව ප්‍රධාන මංමාවත් නොවන මාර්ගවල අධිකාරිය ප්‍රාදේශීය සභාව සතු බවත් එහි අයිතිය තහවුරු කර ගැනීමට ගැසට් කළ යුතු බව එහි සඳහන් වන බවත් බස්නාහිර පළාත් සභාවේ නීති නිලධාරී පැවසීය.<br><br>මේ සම්බන්ධව පළාත් සභා නවයෙහිම තොරතුරු ලබාගෙන මාසයක් තුළ වාර්තාවක් එවන ලෙසත් ඉතිරි මාර්ග ගැසට් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ යම් වැඩසටහනක් සකස් කිරීමටත්, ලේඛනවල නොමැති මාර්ග සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව දැනුම්දෙන ලෙසටත් ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නියම කළේය. |
| 26. | පොදු ඉඩම්වල අනවසර නිවාස ඉදිකිරීම්, අයිතිකර ගැනීම් හා ඔප්පු නොමැති ඉඩම් | පළාත් පාලන ආයතන 38හිම ඉඩම් ලේඛන යාවත්කාලීන කර නාමලේඛනයක් සකසා පවරාගැනීමේ කටයුතු සිදුකරන තෙක් එවැනි ඉඩම් විධිමත් පරිදි නීතිගත කිරීමට කටයුතු කරන ලෙස පළාත් පාලන කොමසාරිස්වරයා වෙත කාරක සභාව නියම කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| **ගුණාත්මක ආහාර ආනයනය සම්බන්ධයෙන් අදාළ රාජ්‍ය ආයතනවල මැදිහත්වීම පිළිබඳ කාර්යසාධන විගණන වාර්තාව<br>2018 සැප්තැම්බර් 19** | | |
| 1. | කිරි සහ කිරි නිෂ්පාදන සඳහා 2010 වසරේ ආහාර නියෝග අනුව මි.ග්‍රෑම්/කි.ග්‍රෑ 1.0ක් ඉක්මවන මෙලමයින් අන්තර්ගත කිරි හෝ කිරි නිෂ්පාදන ශ්‍රී ලංකාවට ආනයනය කිරීම හා නිෂ්පාදනය කිරීම නොකළ යුතු බව සඳහන් වුවද ආනයනය කළ කිරිපිටි සඳහා නිෂ්පාදන රට විසින් නිකුත් කරන ලද අනුකූලතා සහතික මත නියැදි පරීක්ෂාවකින් තොරව කිරිපිටි තොග නිදහස් කර තිබීම හා ආහාර උපදේශක කමිටු රැස්වීමේදී ගත් තීරණයක් ප්‍රකාරව ආනයනකරු නවසීලන්ත ආහාර අධිකාරිය වෙතින් කිරිපිටි තොගය මෙලමයින්වලින් තොර බවට සහතිකයක් ලබා දෙන්නේ නම් එම කිරිපිටි තොගය මෙලමයින් සඳහා අනිවාර්යයෙන් පරීක්ෂා කිරීම අවශ්‍ය නොවන බව දක්වා තිබීම. | ආහාර පාලන ඒකකය යටතේ රේගු දෙපාර්තමේන්තුවේ සෑම ස්ථානයකම අනුයුක්ත කර සිටින ආහාර පරීක්ෂකවරුන් විසින් සෑම ආනයනික කිරිපිටි තොගයකම මෙලමයින් පරීක්ෂාව ITI ආයතනය හරහා සිදු කිරීම වසර ගණනාවක සිටම සිදු කළ බවත් එහිදී මෙලමයින් සොයා ගැනීමක් සිදු නොවූ හෙයින් වර්තමානයේ සෑම ආනයනික කිරිපිටි තොග හතරකින් එකක් සඳහා මෙලමයින් සඳහා පරීක්ෂාව සිදු කරන බව ආහාර පාලන පරිපාලන ඒකකය සඳහන් කරන ලදී. |
| 2. | 2017.03.08 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී දැනට වෙළඳපොළේ ඇති පළතුරුවල පළිබෝධනාශක ශේෂ සංඝටක අඩංගු දැයි පරීක්ෂා කරන ලෙස ලබා දුන් නියෝගය ප්‍රකාරව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සෑම දිස්ත්‍රික්කයකම වෙළඳපොළ ඇති ඇපල්, මිදි හා | මෙම පළිබෝධනාශක ශේෂ සංඝටක පරීක්ෂා කරන ලද පලතුරුවල අන්තර්ගත වූයේ ඉතා සුළු ප්‍රමාණවලින් වුවත්, එකී පළිබෝධනාශක ශ්‍රී ලංකාවේ තහනම් කර ඇති හෙයින් සුළු ප්‍රමාණවලින් වත් ආහාරවල අන්තර්ගත විය නොහැකි බැවින් මේ පිළිබඳව කාරක සභාවේ විශේෂ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | දොඩම් සාම්පල 2 බැගින් පරීක්ෂාව සඳහා එවූ බවත්, එම සාම්පලවල ශ්‍රී ලංකාවේ තහනම් කරන ලද පළිබෝධනාශකයක ශේෂ සංඝටක අඩංගු වූ බවත් සඳහන් කළ රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, ආනයනික පළතුරු තොග සාම්පල වලද ඉහත කී පළිබෝධනාශක ශේෂ සංඝටක හමු වූ බවත් වැඩිදුරටත් සඳහන් කරන ලදී. | අවධානය යොමු විය. මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ගත් ක්‍රියාමාර්ග පිළිබඳව 2018 ඔක්තෝබර් 01 දිනට ප්‍රථම වාර්තාවක් එවන ලෙසද, ශ්‍රී ලංකාවේ තහනම් කර ඇති පළිබෝධනාශක (Chlorphyrifos) තහනම් කර ඇති අන් රටවල් කවරේද යන්න පිළිබඳව සොයා බලා වාර්තා කරන ලෙසද කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කරන ලදී. |
| 3. | ආහාර රෙගුලාසිවලට අනුව සම්පූර්ණ යොදය සහිත කිරිපිටිවල ක්ෂීර මේදය 26%ට නොඅඩු ප්‍රමාණයක් අඩංගු විය යුතු වුවත්, 2012 හා 2013 කාලපරිච්ඡේද තුළ අවස්ථා 04කදී කිරිපිටි තොගවල මේද ප්‍රතිශතය තිබිය යුතු ප්‍රතිශතයට වඩා 0.4%ත් 1.4%ත් අතර වූ පරාසයකින් අඩුවී තිබුණු බව වාර්තා වී තිබීම. | මෙම ප්‍රශ්නය උද්ගත වූ ආනයනික කිරිපිටි තොග කිහිපයක් පැමිණි බවත්, ඒවා මූලික පරීක්ෂණවලින් අසමත් වූ නිසා ප්‍රතිඅපනයනය කිරීමට නියෝග කළ බවත්, වර්තමාන තත්ත්වය සොයා බලා කාරක සභාවට වාර්තා කරන බවත් සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහන් කරන ලදී. |
| 4. | ප්‍රතික්ෂේපිත ආනයනික ටින් මාළු තොග පිළිබඳව තත්ත්වය | ප්‍රතිඅපනයනය කරන ලෙස ආනයනකරුට නියෝග කර ඇති බව රේගු දෙපාර්තමේන්තු නිලධාරීන් පැවසීය. ආනයනකරුගේ ගබඩාවලට කලින් නිදහස් කරන ලද ටින් මාළු තොගවලින් සමහරක් තවමත් ප්‍රති අපනයනය කර නොමැති බව කාරක සභාවේදී හෙළි වූ අතර මේ සම්බන්ධයෙන් විස්තරාත්මක වාර්තාවක් සපයන ලෙස කාරක සභාව ශ්‍රී ලංකා රේගුවට නියෝග කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 5. | වෙළඳ පොළ විකිණීමට ඇති මස් වර්ගවල ප්‍රමිතිය කාරක සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරන ප්‍රමිති සහතිකය ස්වෙච්ඡාවෙන් ලබා ගන්නා විනා අනිවාර්ය නොවූ පසුබිමක තත්ත්ව සහතිකය ලබා නොගත් මස් හා මස් ආශ්‍රිත නිෂ්පාදනවල ප්‍රමිතිය ගැටළුකාරී බව කාරක සභාව හමුවේ අනාවරණය වීම. | ආහාර සම්බන්ධ අනු කාරක සභාවක් මඟින් මස් හා මස් ආශ්‍රිත නිෂ්පාදන ඇතුළු තවත් ආහාර වර්ග කිහිපයක් සඳහා නියාමන සකස් කෙරෙමින් පවතින බවත්, ආහාර ලේබල් කිරීම, කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන, ආහාර කල් තබා ගැනීමේ ද්‍රව්‍ය, බෝතල් කළ ජලය, අයඩිනීකෘත ජලය හා ආහාර ආකලන ද්‍රව්‍ය පිළිබඳ නියාමන සකස් කොට රජයේ නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කර ඇති බවත් සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහන් කරන ලදී. එම නියාමන කෙටුම්පත් කිරීමෙහිලා ප්‍රමුඛතාවය දී කටයුතු කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදක වෙත දැනුම් දීමට කාරක සභාව තීරණය කරන ලදී. |
| 6. | විවිධ ආයතන නියෝජනය කරන සාමාජිකයන් 25 දෙනෙකුගෙන් සමන්විත වන ආහාර උපදේශක කමිටු රැස්වීම්වල සහභාගීත්වය පිළිබඳ පරීක්ෂා කිරීමේදී 2018 ජනවාරි සිට අගෝස්තු 31 දක්වා රැස්වීම් වාර 08ක් පවත්වා ඇති බවත් ඉන් රැස්වීම් වාර අඩකට හෝ ඉන් වැඩි ප්‍රමාණයකට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, වෛද්‍ය පර්යේෂණ ආයතනය, පාරිභෝගික සේවා කටයුතු පිළිබඳ අධිකාරිය, නීති නිලධාරි (සෞඛ්‍ය අමාත්‍යාංශය), ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | ඔක්තෝබර් මස දෙවන සතියේ අඟහරුවාදා දින රැස්වීමට නියමිත ආහාර උපදේශක කමිටු රැස්වීමේදී, මෙම කාරක සභාවේදී සාකච්ඡා කළ කරුණු පිළිබඳ අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙසත්, ආහාර උපදේශක කමිටුව ලෙස මේ සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ යෝජනා ඇතුළත් වැඩසටහනක් සකස් කර ඉදිරි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ඉදිරිපත් කරන ලෙසත් කාරක සභාව නියෝග කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | යන ආයතනවල නියෝජිතයින් සහභාගී නොවීම. | |
| **ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ විශේෂ පරීක්ෂණය**<br>**2018 සැප්තැම්බර් 20** | | |
| 1. | රජයේ මූල්‍ය (ජනරජයේ) ප්‍රකාශනවලට අදාළ නෛතික පසුබිම | 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි 15 වන වගන්තියට අනුව මහාභාණ්ඩාගාරය විසින් සකස් කළ ගිණුම් සම්බන්ධයෙන් වගන්තියට අනුව මහා භාණ්ඩාගාරය විසින් සකස් කළ යුතු ගිණුම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු විය යුතු බව විගණකාධිපතිවරයාගේ අදහස විය.<br>(අ) එම ගිණුම ඒකාබද්ධ අරමුදල හරහා සිදු වන ගනුදෙනුවලට සීමා කර ඇති බවද, එහෙත් සමස්ථ රජයේම ගිණුමක් සකස් කිරීම මගින් මෙහි වර්ධනයක් සිදු කිරීමට බලාපොරොත්තු වන බව.<br>(ආ) එම පනත අනුව රජයේ මූල්‍ය ප්‍රකාශන රජයේ එක් එක් මුදල් වර්ෂය අවසන් වී මාස තුනක් ඉකුත් වීමට ප්‍රථම මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු බවද, විගණනය කරන ලද රජයේ මූල්‍ය ප්‍රකාශ සහ ඒ සම්බන්ධව විගණකාධිපතිවරයාගේ මතයද සහිතව මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව, පසුව එළඹෙන මුදල් වර්ෂයේ මැයි මස වන 31 දිනට පෙර මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු බව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | (ඈ) එම මුදල් වර්ෂය තුල සිදු වූ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය, රජයේ වත්කම් සහ වගකීම් පෙන්නුම් කරනු ලබන එම මුදල් වර්ෂය සඳහා වන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක් සහ අදාළ කරගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඊට අදාළ සටහන් සමග වන එම වර්ෂය සඳහා වූ කාර්යසාධන වාර්තාවද ඇතුළත් කළ යුතු බව.<br>(ඇ) මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතු බව.<br>ඒ අනුව<br>ජාතික විගණන පනත මගින් රජයේ මුදල් ප්‍රකාශ විගණකාධිපතිවරයා හා පාර්ලිමේන්තුව වෙත නියමිත කාලය තුළ ඉදිරිපත් කිරීමේ නීත්‍යානුකූල අවශ්‍යතාවයක් පැන නගින බවද ඔහු වැඩිදුරටත් පැවසීය . |
| 2. | රාජ්‍ය ණය සම්බන්ධ නිර්වචනය<br><br>හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා ලබාගත් ණය මුදලින් ඩොලර් මිලියන 907ක ප්‍රමාණය 2017.12.31 දිනට භාණ්ඩාගාර ගිණුම්වලින් ඉවත් කිරීම. | මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද 2017.07.20 දිනැති අමාත්‍යමණ්ඩල තීරණය අනුව මෙමෙ ණය ගෙවීම මහා භාණ්ඩාගාරය භාර ගැනීමටත් ණය ගෙවීම සඳහා වන ප්‍රතිපාදන වාර්ෂිකව ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ලබා දීමටත්, තීරණය කර ඇති බවද, මෙමෙ ණය මුදල ශ්‍රී ලංකා වරාය අධිකාරියේ හිමිකාරිත්වයක් බැවින් එම ණය පොත්වලින් ඉවත් කිරීම වැරදි සහගත බවද ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>විදේශ ණය පනත අනුව රාජ්‍ය ණය සම්බන්ධව එම නිර්වචනය ලබා දී ඇත්තේ ණය ලබා ගැනීමේ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | කාර්යය සඳහා මිස ගිණුම්කරණ කාර්යයන් සඳහා නොවන බව මහා භාණ්ඩාගාර නිලධාරීන්ගේ මතය විය.<br><br>එමෙන්ම මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබා ගන්නා ණය ගෙවීම සම්පූර්ණයෙන්ම සිදු කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරය විසින් වන බැවින් එම ආයතනය ලබා ගන්නා ණය මුදල රජයේ ණය ලෙස සැලකිය යුතු බව විගණකාධිපතිවරයාගේ මතය විය.<br><br>රජයේ ණය සම්බන්ධයෙන් නිවැරදි නිර්වචනයක් ලබා ගත යුතු බව කාරක සභාවේ අදහස විය.<br>ඒ අනුව ණය ගෙවනු ලබන්නේ කවර පාර්ශවයද යන කරුණ සැලකිල්ලට ගෙන රජයේ ණය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්නා ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී.<br><br>එමෙන්ම 2016,2017 හා 2018 වසරට අදාළව භාණ්ඩාගාර ඇපකර මත රාජ්‍ය ව්‍යවසායන් වෙත අලුතින් මුදා හැර ඇති ණය ප්‍රමාණ හා එම ණය මුදල්වලින් භාවිතා කර ඇති ප්‍රමාණය පිළිබඳ 2018 ඔක්තෝම්බර් මස 01 වැනි දිනට පෙර වාර්තාවක් එවන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 3. | ඒකාබද්ධ අරමුදලින් බැහැරව ක්‍රියාත්මක වන දේශීය අරමුදල් පැවතීම | රජයේ අරමුදල් විමර්ශනය සම්බන්ධයෙන් පත් කර ඇති කමිටුවේ වාර්තාව කාරක සභාව වෙත එවන මෙන් ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| **ජාතික ආර්ථිකයට නව නිපැයුම්කරුවන්ගේ දායකත්වය ලබාගැනිමේදි රාජ්‍ය ආයතනවල මැදිහත්විම පිළිබඳ කාර්යසාධන විගණන වාර්තාව** | | |
| **2018 සැප්තැම්බර් 21** | | |
| 1. | 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත පරිදි ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම පර්යේෂණ සහ පොදුවේ විද්‍යාව පිළිබඳ තොරතුරු පළ කිරීම සහ පතළ කර හැරීම සිදු නොකිරීම හා නව නිපැයුම්කරුවන් අතර අදහස් හුවමාරු කර ගැනීමට මාසික රැස්වීම් නිතිපතා නොපැවැත්වීම. | එම රැස්වීම් පැවැත්වීමේ වැදගත්කම හා එමගින් නව නිපැයුම්කරුවන්ට නිසි සමාජ පිළිගැනීමක් ලබා දීමට කටයුතු කිරීමේ හා නිපැයුම් වානිජකරණය වීමේ වැදගත්කම අවධාරණය කළේය.<br>පවතින සීමිත සේවක සංඛ්‍යාවෙන් නියමිත මාසික රැස්වීම් පැවැත්වීම අසීරු බවද කෙසේවුවද මෙය ක්‍රමවත් කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බවද තොරතුරු පතළ කිරීමට අදාළ විද්‍යා සඟරාව ලේක්හවුස් පුවත්පත් හරහා සෑම මසකම අවසාන සිකුරාදා දින බෙදාහරින බවද ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ කොමසාරිස්වරයා පැවසීය. එසේම ඔවුනට හැඳුනුම්පත් ලබාදී ඇති බවත්, සෑම අඟහරුවාදා දිනකදීම ඔවුනට පැමිණ හමුවීමට පහසුකම් සලසා ඇති බවත් මෙහිදී අනාවරණය විය. |
| 2. | ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ අරමුදල. නව නිපැයුම්කරුවන්ගේ අරමුදල් ශේෂය 2013 ජනවාරි මස රු. 2,543,450/-ක්ද, දෙසැම්බර් වනවිට රු. 4,001,821ක්ද 2014 දෙසැම්බර් වනවිට රු. | මේ අරමුදලට 2015 වර්ෂයේ සිට මුදල් නොලැබුන බවද මුදල් අමාත්‍යාංශය මගින් වැඩි කරන ලද කොමිසමේ ප්‍රාග්ධන අරමුදල් මගින් නව නිපැයුම්කරුවන්ට අවශ්‍ය මූලාධාර ලබාදීමට කටයුතු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | 10,484,297/-ක්ද ලෙස පැවතුන අතර පූර්ණ වශයෙන් මෙම අරමුදල උපයෝජනය වී නොතිබීම මෙන්ම මෙම අරමුදලට නිශ්චිත ආදායම් මාර්ගයක් නොතිබීම. | කළ බවද කොමසාරිස්වරයා පැවසීය. කෙසේවුවද නව නිපැයුම්කරුවන්ට මූල ප්‍රාග්ධනය සැපයීමට වඩා ප්‍රායෝගික වැඩපිළිවෙලක් සකස් කරන ලෙස කාරක සභාව නියෝග කළේය. |
| 3. | නව නිපැයුම්කරුවන්ට තාක්ෂණික ආධාර දීම. | මේ සඳහා ගියවර අයවැයෙන් වෙන් කළ රු. මිලියන 100 ක මුදලින් නර්ඩ් ආයතනයේ හා යාපනය විශ්වවිද්‍යාලයේ නව නිපැයුම්කරුවන්ට අවශ්‍ය එම පර්යේෂණ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට කටයුතු කර ඇති බවද ඉදිරියේදී රු. මිලියන 75ක මුදලින් තවත් මධ්‍යස්ථාන 05ක්ද පිහිටුවන බවද කොමසාරිස්වරයා පැවසීය. |
| 4. | පේටන්ට් බලපත්‍ර ලබා දීමට කෙරෙන මැදිහත්වීම. පේටන්ට් ඉල්ලුම්පත් සකස් කිරීමේදී නව නිපැයුම්කරුවන්ට සහාය වීම සඳහා අවශ්‍ය අනුමැති බුද්ධිමය දේපළ කාර්යාලයට අනුයුක්ත විද්‍යා උපාධිධාරී පේටන්ට් පරීක්ෂකවරුන්ගේ හිඟයක් පැවතීම. | මේ සඳහා වහා නිලධාරීන් බඳවා ගතයුතු බව ද අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා මේ පිළිබඳ දැනුවත් කර පුරප්පාඩු පිරවීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අවශ්‍ය පියවර ගන්නා ලෙසද බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂකවරයාට නියෝග කළේය. |
| 5. | හඳුන්වාදෙන නව නිපැයුමෙන් නව නිපැයුම්කරුවාට පුද්ගලික ලාභයක් ලැබීම මෙන්ම නව නිපැයුමින් සමාජ ප්‍රතිලාභයක් ලැබීම යන කරුණු දෙක සපුරාගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග. | ජාත්‍යන්තරයට නව නිපැයුම් හඳුන්වාදීමේ වැඩපිළිවෙලක් 2016 වසරේදී ආරම්භ කළ බවද පසුගිය වසර වලදී විවිධ තරඟවලට ඉදිරිපත් වූ බවද ඒ තුල ජයග්‍රහණ රැසක් ලද බවද ඒ තුලින් නව නිපැයුම වාණිජකරණයට අවශ්‍ය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | පිළිගැනීමක් ලැබෙන බවද කොමසාරිස්වරයා පැවසීය. |
| 6. | පේටන්ට් බලපත්‍රය ලියාපදිංචිය අලුත් කිරීම. | 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 83 (2) වගන්තිය පරිදි පවතින පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාවෙන් වාර්ෂිකව අලුත් කිරීමේ ප්‍රතිශතය 15% වැනි අඩු ප්‍රතිශතයක් බවද මෙයට හේතුව නව නිපැයුම තාක්ෂණික වශයෙන් යල් පැනීමද ව්‍යාපාරික වශයෙන් ලාභදායී නොවීමද යන්න කාරක සභාව විමසීය.<br><br>මෙම අසාර්ථක වීම පිළිබඳ අධ්‍යයනයක් සිදුකර ඇති බවද එමගින් මෙම නිපැයුම්කරුවන් එම නිපැයුම් ඉදිරියට ගෙන යාමට උනන්දුවක් නොදැක්වීම නිරීක්ෂණය වන බව බුද්ධිමය දේපළ අධ්‍යක්ෂක ජනරාල්වරිය පැවසීය.<br><br>එළිදක්වන නව නිපැයුම් පිළිබඳ මාධ්‍ය මගින් ජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස නව නිපැයුම් කොමිසමට හා බුද්ධිමය දේපළ කාර්යාංශයට කාරක සභාව විසින් උපදෙස් ලබා දුනි. |
| 7. | ලියාපදිංචි අනු නියෝජිතයෝ. 2006 මැයි 17 දිනැති අංක 1445/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ නිවේදනය ප්‍රකාර අනු නියෝජිතයන් බඳවා ගැනීමට හෝ ලියාපදිංචි කිරීමට අවශ්‍ය විභාගය පැවැත්වීමට ශ්‍රී ලංකාවේ | මෙම අනු නියෝජිතයන් සඳහා විභාග පැවැත්වීමට ජාතික බුද්ධිමය දේපළ කාර්යාංශය තුළ අවශ්‍ය විෂයානුබද්ධ විශේෂඥ දැනුම නොපවතින බව අධ්‍යක්ෂක ජනරාල්වරිය පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | ජාතික බුද්ධිමය දේපළ කාර්යාංශය කටයුතු නොකිරීම. | |
| 8. | නව නිපැයුම්කරුවන්ට නීති ආධාර ලබාදීම. | පේටන්ට් අයිතිය පිළිබඳ නඩුවලදී නව නිපැයුම්නකරුවන්ට අවශ්‍ය නීති ආධාර ලබා දිය යුතු වුවද මේ වන තෙක් එවැනි නීති අංශයක් පිහිටුවා නොතිබීම හා අනුමත සේවක ලැයිස්තුවේද නීති නිලධාරී තනතුර සඳහන් කර නොතිබීම පිළිබඳ මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂක ජනරාල්වරයා දැනුවත් කර අවශ්‍ය පුරප්පාඩු පිරවීමට වහාම පියවර ගන්නා ලෙස කාරක සභාව කොමිසමේ කොමසාරිස්වරයාට නියෝග කළේය. |
| 9. | සමස්තයක් ලෙස විවෘත, විශ්වවිද්‍යාල හා පාසැල් යන අංශවල නව නිපැයුම් ඉදිරිපත් කිරීමේ ප්‍රතිශතය වාර්ෂිකව අඩුවීම හා වඩාත් කැපී පෙනෙන ලෙස වානිජ අංශයේ නව නිපැයුම් ප්‍රතිශතය පහළ මට්ටමක් ගැනීම. | සහසක් නිමැවුම් ප්‍රදර්ශනයේදී පාසැල් අංශයේ ජයග්‍රහණය කළ නවනිපැයුම් 34ක් අතරින් 21 ක් වානිජකරණයට සියලු කටයුතු සූදානම් කර ඇති බවද ඉදිරි මාස 2ක ඇතුලත ඒවා වෙළඳ පොළට ඉදිරිපත් කරන බවද කොමසාරිස්වරයා පැවසීය. |
| 10. | ශ්‍රී ලංකාවේ ඇති නව නිපැයුම් සම්බන්ධයෙන් මැදිහත්වීම් කළ හැකි හා ඒ සම්බන්ධයෙන් අදාළ වන පර්යේෂණ ආයතන. | එම ආයතන වලින් බලාපොරොත්තු විය හැකි කාර්යයන් ඇතුළත් වාර්තාවක් ලබා දෙන ලෙස කාරක සභාව නව නිපැයුම් කොමසාරිස්වරයාට නියෝග කළේය. එසේම මේ සඳහා පුද්ගලික අංශයේ සහයෝගය ලබා ගැනීමේ හැකියාව පිළිබඳව සහ නව නිපැයුම් වානිජ කරණය කිරීමෙන් ලැබෙන ලාභයෙන් කොටසක් ලබා ගන්නා පදනම යටතේ හෝ ඔවුනට |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | අතහිතදීමේ හැකියාව පිළිබඳව සොයා බලා කටයුතු කරන ලෙසද කොමසාරිස්වරයාට නියෝග කළේය. |
| **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව<br><br>2018 ඔක්තෝම්බර් 12** | | |
| 1. | දෙපාර්තමේන්තුගත තනතුරු දරන නිලධාරීන් අනුරූප ඒකාබද්ධ සේවාවන්ට අන්තර්ග්‍රහනය කිරීමේ වර්තමාන තත්ත්වය | අදාල නිලධාරීන් අනුරූප ඒකාබද්ධ සේවාවන්ට අන්තර්ග්‍රහනය කිරීමට මනාපය පළ කිරීම සඳහා 2018 ඔක්තෝබර් 27 දින දක්වා කල් ලබා දී ඇති බව සඳහන් කළ ප්‍ර.ග.නි./ග.නි. ඊට මනාපය පළ නොකරන නිලධාරීන් විශ්‍රාම යැවීමට කටයුතු කරන බවටද අදාළ චක්‍රලේඛයේ සඳහන් කර ඇති බව පැවසීය.<br><br>2018 ඔක්තෝබර් 27 දින වන විට අනුරූප ඒකාබද්ධ සේවාවන්ට අන්තර්ග්‍රහනය කිරීමට මනාපය පළ කළ නිලධාරීන් සංඛ්‍යාව හා ඔවුන්ගේ විස්තර 2018 නොවැම්බර් 10 දින වන විට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත සපයන ලෙසත්, කාරක සභාවද ඒ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් නියෝග කළ කාරක සභාව ඊට මනාපය පළ නොකළ නිලධාරීන් 2018 නොවැම්බර් 10 දින වන විට විශ්‍රාම යැවීමට කටයුතු කරන ලෙසත් 2018 නොවැම්බර් 20 දින වන විට අදාල සියලු තොරතුරු කාරක සභාවට වාර්තා කරන ලෙසත් ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 2. | වර්තමාන රියදුරු බලපත්‍ර නිකුත් කිරීමට අදාල ගිවිසුමේ සඳහන් මිල ගණන් යටතේ 2016 මාර්තු 26 දින සිට 2019 මාර්තු 31 දින දක්වා අවස්ථා 3ක ගිවිසුම් කාලය දීර්ඝ කර තිබීම සහ පවත්නා ගිවිසුම යටතේ රියදුරු බලපත්‍ර නිකුත් කිරීම දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු නොකර BOO යන පදනම යටතේ ඉදිරි ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කරමින් පැවතීම. | රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය තම දෙපාර්තමේන්තුව සතු සම්පත් යටතේ කිරීම අපහසු කාර්යයක් බව සඳහන් කළ ග.නි. ගිවිසුම් කාලය අවසන් වූ පසු කැබිනට් මණ්ඩල අනුමැතිය යටතේ නව ටෙන්ඩර් ප්‍රදානයක් සිදු කිරීමට නියමිත බවත් වර්තමාන ගිවිසුම් කාලය අවසන් වූ පසු ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව සියලු භෞතික සම්පත් තම දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු යොදන බවත් වැඩිදුරටත් පැවසීය.<br>රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා දරන අධික පිරිවැය හා BOT පදනම යටතේ වූ රියදුරු බලපත්‍ර මුද්‍රණ කොන්ත්‍රාත්තුව අදාල ගිවිසුම් ගත කාලයෙන් පසුව රජයට පවරාගෙන රියදුරු බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු නොකර, නැවත නව ටෙන්ඩර පිරිනැමීමට ගෙන ඇති තීරණය පූර්ව කාරක සභාවලදීද දිගින් දිගටම අප්‍රසාදයට ලක් වූ බව සිහිපත් කළ කාරක සභාව එය කිසිසේත් අනුමත නොකරන බව සඳහන් කළේය. |
| 3. | 302 කාණ්ඩය යටතේ පසුකාලීනව ලියාපදිංචි කරන ලද වාහන 10 සම්බන්ධ වර්තමාන තත්ත්වය | මේ පිළිබඳව පුළුල්ව පරීක්ෂා කිරීමට කොළඹ වංචා විමර්ශන අංශයට පවරා ඇති බවත්, මීට මූලිකව වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව මූලික පරීක්ෂණ පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට යෝජිත බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>මෙම සිද්ධිය සම්බන්ධයෙන් අමාත්‍යාංශය මඟින්ද පරීක්ෂණයක් කළ යුතු බවට නියෝග කළ කාරක සභාව මෙම පරීක්ෂණ කටයුතු සිදු වීමේ මන්දගාමී ස්වභාවය පිළිබඳව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | සිය අප්‍රසාදය පළ කළේය. කොළඹ වංචා විමර්ශන අංශයේ නියෝජ්‍ය පොලිස්පතිවරයාට මෙම විමර්ශනයේ කටයුතු කඩිනම් කරන ලෙස දන්වා ලිපියක් යැවීමට කාරක සභාව තීරණය කරන ලදී. |
| 4. | ව්‍යාජ ලෙස ලියාපදිංචි කොට ඇති ප්‍රාඩෝ වර්ගයේ ජීප් රථ 7හි විමර්ශනවල ප්‍රගතිය | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් මේ සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා මූලික විමර්ශන වාර්තාවක් 2018 ජුනි 08 දින ඉදිරිපත් කර තිබෙන බවද අදාල නිලධාරීන්ට විරුද්ධව චෝදනා පත්‍ර මෙතෙක් භාර දී නැති බවද කාරක සභාවේදී අනාවරණය විය.<br><br>මේ සම්බන්ධයෙන් තමා විසින් නියෝගයක් ලබා දී ඇති නමුත් එය ක්‍රියාත්මක කොට නැති බව සඳහන් කළ ප්‍ර.ග.නි. අදාල සිද්ධිය සම්බන්ධයෙන් කඩිනමින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව පැවසීය. |

# සූචිය


| | පිටු අංකය |
|---|---|
| **අ** | |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 74 |
| ආරක්ෂක අමාත්‍යාංශය | 62 |
| **ක** | |
| ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | 17 |
| **ග** | |
| ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව | 36 |
| **ත** | |
| ත්‍රිකුණාමලය නගර සභාව | 45 |
| **ද** | |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොණරාගල | 22 |
| **ධ** | |
| ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | 60 |
| **න** | |
| නැවත පදිංචි කිරීම්, පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | 65 |
| **බ** | |
| බස්නාහිර පළාත් සභාව | 87 |
| **ම** | |
| මාතලේ මහ නගර සභාව | 77 |
| මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 30 |

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව 13, 52, 107

ව

විදේශ කටයුතු අමාත්‍යාංශය 57

විදේශ රැකියා අමාත්‍යාංශය 82

ශ

ශ්‍රී ලංකා ගුවන් හමුදාව 41

ස

සංචාරක ප්‍රවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය 15

සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව 19

හ

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව 70

## විශේෂ විමර්ශන

රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ පරීක්ෂණය 32, 100

ගුණාත්මක ආහාර ආනයනය සම්බන්ධයෙන් අදාළ රාජ්‍ය ආයතනවල මැදිහත්වීම පිළිබඳ කාර්යසාධන වාර්තාව 97

ජාතික ආර්ථිකයට නව නිපැයුම්කරුවන්ගේ දායකත්වය ලබා ගැනීමේදී අදාළ රාජ්‍ය ආයතනවල මැදිහත්වීම පිළිබඳ කාර්යසාධන විගණන වාර්තා පරීක්ෂාව 103